
සහකාරී

# I

මව ගේ අභාවයෙන් පසු අගනුවරට පැමිණි රවි මිතුරෙකු ගේ සහය ඇතිව සුළු රැකියාවක් සොයා ගත්තේ ය. එම රැකියාවෙන් ලැබුන වැටුප මාසයක් ගෙවා ගැනීමට කිසිසේත් ප්‍රමාණවත් වූයේ නැත. සිය සොයුරිය මවුන්ට් මේරි හි දුම්රිය නිල නිවාසයක සිටියද රවි එහි යාමට කැමති වූයේ නැත. මව ජීවත්ව සිටි යුගයේ සිට, රවි සොයුරිය ගේ සැමියා සමග අමනාපයෙන් පසුවූ හෙයින් ඔවුන් ගේ නිවසට යාම තම ආත්ම ගෞරවයට මදිකමක් ලෙස හෙතෙම කල්පනා කළේ ය.

රවි සේවය කළේ සුප්‍රසිද්ධ නීතිවේදියෙකු වූ විල්සන් ඇල්කඩුව ගේ පෞද්ගලික ලේකම් ලෙස ය. ගුර බුද්ධියක් ඇති විල්සන් ඇල්කඩුව මුදල් ඉපයීමේ සමතෙකි. නීතිය හැදෑරීමට ප්‍රථම කලක් වෛද්‍ය විද්‍යාව හැදෑරූ ඔහු පසුව සිය බුද්ධියට ගැලපෙන මාවත වශයෙන් නීතිය තෝරා ගෙන එහි ඵල නෙලා ගත්තේ ය. පුවත්පත් සහරා වලට නීතිය පිළිබඳ ලිපි සපයන ඇල්කඩුව ගේ සිත තැපැල් මාර්ගික නීති පාඩම් මාලා අලෙවි කිරීමේ ව්‍යාපාරය ගැන යොමු වුනි. සිංහල මාධ්‍යයෙන් නීතිය හදරන සිසුන්ට

www.sinhalalibrary.com
Premier12

තැපැල් මගින් පාඩම් මාලා සැපයීම ආරම්භ කළේ විනෝදයට මෙන් වුවද, එය දියුණු කළහැකි සාර්ථක ව්‍යාපාරයක් බවට ඔහුට මඳ කලෙකින් අවබෝධ වූනි. රවි ඒමට පූර්වමයෙන් සිටි සේවකයා ඇල්කඩුවට වංචා කර පලා ගියේ ය. රවි එම තනතුරට පත් වූ පසු කලින් සිටි සේවකයාට වඩා කාර්යක්ෂමව ඔහු එම ව්‍යාපාරය පවත්වා ගෙන ගියේ ය.

ඇල්කඩුව ගේ කාර්යාලය පිහිටා තිබුණේ බම්බලපිටියේ ඔහු ගේ නිවසට යාබද කුඩා ගොඩනැගිල්ලක ය. ඉංග්‍රීසියෙන් ලැබෙන දේශන සිංහලට පරිවර්තනය කිරීමේ සිට තැපැලට යැවීම දක්වාද, ගිණුම් පවත්වා ගෙන යාම සම්බන්ධවද සියළුම කටයුතු පවත්වා ගෙන ගියේ රවි විසිනි. විවේක අවස්ථාවලදී ඇල්කඩුව මෙම පොත් පත් පරීක්ෂා කළද තැපැල් මාර්ගික පාසැල ස්වාධීනව පවත්වා ගෙන යාමට ඔහු රවිට බාර කළේ ය. එහෙත් ඇල්කඩුව ගේ බෑනා වූ හෙක්ටර්, රවි ගේ කටයුතුවලට බාධවක් වූනි.

ඇල්කඩුව මහතාට පිරිමි දරුවන් සිටියේ නැත. වැඩිමහල් දියණිය වූ ප්‍රින්සි විවාහව සිටියේ නීතිවේදියෙක් වූ හෙක්ටර් සමගිනි. ඇයට බාල සොයුරියන් තිදෙනකි. ප්‍රියන්තා විවාහලහිමුඛව සිටි අතර ශාන්තා හා පාලිකා තවමත් අධ්‍යාපනය ලබන වියපත් අයවූහ. පිරිමි දරුවන් නොවීම නිසා හෙක්ටර් බොහෝ විට පවුලේ කටයුතු වලට මැදිහත් වී කටයුතු කළේ ය. ඇතැම් විට හෙක්ටර් ගේ හැසිරීම ඇල්කඩුවට හිසරදයක් වූවද ඔහු ඒ හැම අපහසුවෙන් ඉවසුවේ ය. හෙක්ටර් හා ප්‍රින්සිට විසීමට දෙහිවල ගෙයක් හා ඉඩමක් ලබා දුන්නද ඔවුන් දෙදෙනා වැඩිපුර කල්ගෙවූයේ මහ ගෙදරම ය. දරුවන් හා එක්ව

www.sinhalalibrary.com

සතුටුවීමට ඇල්කඩුව ප්‍රිය කළත් මෑතක සිට නිවසට පැමිණි වෙලේ පටන් හෙක්ටර් රවී ගේ දෙස් සෙවීම ඔහු ප්‍රිය කළේ නැත.

''ඩැඩී රවී කියන දෙයක් අහන මිනිහෙක් නෙමේ. මම එයාට කීප දවසක්ම කිව්ව ස්ටෙන්සිල් කපන්න කලින් මට පෙන්නන්න කියල. මගෙ කතාව මිනිහ තඹ සතේකට ගණන් ගන්නෙ නැහැ.''

''රවී ගෙ වැඩ ගැන දන්නෙකුට බලන්න දෙයක් නැහැ හෙක්ට''

''සමහර වචන ට්‍රාන්ස්ලේට් කරල තියෙනව හරි නැහැ. ඔය වැඩේ නීතිය දන්නෙ නැති කෙනෙකුට කරන්න බැහැ ඩැඩී''

''මම දුන්න වැඩක් කවදාවත් රවී වරද්දල නැහැ''

''කාට හරි කියල ට්‍රාන්ස්ලේට් කරව ගන්නව ඇති''

''මොන එකද මන් දන්නෙ නැහැ ඩැඩී, මටත් ඔය රවී කියන ඒකා පෙන්නන්න බැහැ. ගැජ්ජෙට් කියල මහ ලොකුවට හිතාගෙන ඉන්න හින්ද වෙන්න ඇති මූණ දික් කර ගෙන යන්නෙ'' ප්‍රින්සි අම්නාපයෙන් කතා කළා ය.

''කලින් හිටපු ලියනගෙ කොහෙදි දැක්කත් සර් කියාගෙන දුවගෙන එනව. කොච්චර වැඩක් තිබුනත් මාව දැක්කොත් වකස් ගාල නැගිටිනව''

''ඒකා හොර තක්කඩියෙක් හෙක්ට. මිනිහා ගියේ මට රුපියල් තුන්හාර දාහකට තට්ටු කරල''

''ඩැඩී, රවී ආඩම්බරකම් පෙන්වන්නෙ අපට විතරක් නෙවි. දවසක් අජිත් මගදි හම්බවෙලා මම ගෙදර ඉන්නවද කියල අහල තියෙනව. එතකොට එයා කිව්වලු ගෙදර ගිහින් බලන්න කියල'' ප්‍රියන්තා කීවා ය.

''දුව ගෙදර ඉන්නවද නැද්ද කියල රවි දන්නවයැ?''

'අපිට කිසි ගරු සරුවක් නැහැ ඩැඩී'' ප්‍රියන්තා කතා කළේ රවි තමාට කළ මදිකම් ගැන සිහි කරමිනි. පසෙකට වී පොතක් බලමින් සිටි ශාන්තාට මේ ඕපදූප කතා නිසා බාධා වුනි. ඇය පොත අතැතිව අසුනෙන් නැගී සිටින විට ටෙලිෆෝනය නාද වුනි. ඇය එම ඇමතුම අතට ගත්තා ය.

''ඩැඩීට කෝල් එකක්''

''කව්ද කතා කරන්නෙ කියල අහන්න දුව''

''රවි'' ශාන්තා පියා අත රිසීවරය තබා ගියා ය.

''මොකද රවි?''

''සර් මම මේ වීක් එන්ඩ් පේපස්වල ඇඩ්වටයිස්මන්ට් දෙකක් දන්නයි ඉන්නෙ. ඒකට ටිකක් ගාන වැඩියෙ යනව''

''රවිට හොඳ විදිහක් කරන්න''

''මට සර් එක්ක ටිකක් වෙලා කතා කරන්න ඕනැ''

''ප්‍රයිවෙට් එකක්ද? ම්.........කමක් නැහැ තව ටිකකින් මම ඔය පැත්තට එන්නම්''

ඇල්කඩුව මද වේලාවක් හෙක්ටර් හා කතාකරමින් සිට රවි හමුවීමට ගියේ ය. ඇල්කඩුව කාර්යාලයට පිවිසෙනු දුටු රවි අසුනෙන් නැගී සිටියේ ය. ඔහු සුහදව රවි ගේ උරමින අත තබා අසුන් ගත්තේ ය.

''කොහොමද රවි වැඩ කටයුතු?''

www.sinhalalibrary.com

''වරදක් නැහැ සර්......අපි යවන පාඩම් වලට හැම දෙනාම ස්තූති කරල ලියුම් එවනව. මේ වැඩ පිළිවෙල දියුණු කරන්න යෝජනාවක් කරන්නද?''

''හොඳයි. රවි කැමති දෙයක් කියන්න''

''මේ පාඩම් වලට අමතරව සති අන්ත පංතියක් පටන් ගත්තොත් හොඳ මුදලක් හොයන්න පුළුවන්. උගන්වන අය හොයන්න එච්චර අමාරු නැහැ''

රවි ගේ යෝජනාවට ඕනෑකමින් සවන් දුන් ඇල්කඩුව මද වේලාවක් නිහඬව සිටියේ ය. රවි දක්ෂයෙක් නිසා සති අන්ත පංතියක් ආරම්භ කළහොත් එය පවත්වා ගෙන යාම ඒ තරම් අසීරු නො වනු ඇත.

''යෝජනාව නම් හොඳා රවි. ඒත්...... ඒක කියනව තරම් ලේසි නැහැ නේද?''

''පන්තියක් පටන් ගන්න කියල අපට ආරාධනා කරන අය නිසා, සෑහෙන සංඛ්‍යාවක් ශිෂ්‍යයො ඉන්නව කියල අපට හිතන්න පුළුවන්''

''හොඳයි රවි, මම තව ටිකක් කල්පනා කරල උත්තරයක් දෙන්නම්. තව මොකවත් කියන්න තියෙනවද?''

''සර් මට මිස්ට හෙක්ටර් මගෙ ට්‍රාන්ස්ලේෂන් වැරදියි කියල මට දෙස් කියනව. එයා මට වැඩ කරන්න දෙන්නෙ නැහැ''

''හොඳයි මම ඒ ගැන හෙක්ටර්ට කියන්නම්''

ඇල්කඩුව කාර්යාලයෙන් පිටව ගිය පසු රවි අසුනෙන් නැගී සිටියේ ය. මුහුද සිප හමන සදා සුළඟ සෙමින් කාමරයට පිවිසෙයි. සේවකයෙක් මිදුල කෙළවරේ

පිහිටි මල්පාත්ති වලට වතුර දමනු රවිට පෙණෙයි. නාන කාමරයට වැද මුහුණ සෝද ගත් ඔහු ඉන් පිටත ආවේ ය. ජනේලය අසලට වී හිස පීරමින් ඔහු යළි ඇල්කඩුව ගේ නිවස දෙස බැලුවේ ය. ප්‍රියන්තා අජිත් සමග ගේට්ටුව අසලට වී කතා කරමින් සිටිනු ඔහු නෙත ගැටුනි. ශාන්තා පොතක් අතැතිව කවුළුව අසලට පැමිණ බිත්තියට දෑත් තබා මාවත දෙස බලන විට සැඳෑ සුළඟට අසු වූ ඇගේ කෙස් කළඹ සුළං පහරින් ඒ මේ අත විසිර ගියේ ය. කිසි දිනෙක කතා බස් නො කළත් ශාන්තා ගේ හැසිරීම් ඔහු සිත් ගත්තේ ය. ඇය ඉදිරිපස අඟුනට වී පොත් බලමින් සිටින අයුරු ඔහු දක නැත. තනිව සිටින ශාන්තා ගේ හැසිරීම සිහිවන්නේ ඇය නිවසේ අනිත් තරුණියන් මෙන් නොව නිහතමානී ලෙස ජීවත් වූ තරුණියක බැවිනි.

මසකට වරක් දෙකක් ඇල්කඩුව නිවසේ සාද පැවැත් වීම සිරිතක් කොට පැවතුනි. එහෙත් රවි මෙම එක සාදයකටවත් සහභාගී වූයේ නැත. විශේෂ අමුත්තන් සහභාගි වන සාද සඳහා අවශ්‍ය කලමනා රවි සම්පාදනය කර දුන්නේ ය. ඇල්කඩුව විවාහ වී අවුරුදු විසිපහක් ගතවීම නිමිත්තෙන් පැවැත්වීමට නියමිතව තිබූ සාදයට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රවිට භාර වුනි. රවි උත්සව සඳහා කෑම්බීම් සපයන සමාගම් හා සාකච්ඡා කර නියමිත දිනට එම ආහාර පාන ගෙන්වා ගැනීමට කටයුතු පිළියෙල කළේ ය. උත්සව දිනයේ රවි වෙන දිනවලට වඩා වැඩි වේලාවක් ඇල්කඩුව මහතා ගේ නිවසේ නතර වී එම කටයුතු සොයා බැලුවේ ය. විදුලි පහන් වලින් පරිසරය ආලෝකමත් කිරීම මෙන්ම එළිමහනේ අසුන් තැබීම වැනි කටයුතු සියල්ලම සංවිධානය කරන ලද්දේ රවි ගේ අනුදැනුම පිට ය. නිවසට මඳක් ඔබ්බෙන්

කාර්යාලයට වම්පසින් තිබූ බද්ධ අඹ ගස යට කවාකාරව පුටු තැබීමට අදහස් කළ රවි එතැනට එද්දී ගස යට තිබූ අසුනක ශාන්තා නවත් යුවතියක් හා සිටිනු දුටු නිසා ඔහු ඇය දෙස බලා සිටියේ ය. තමා වෙනදටත් කලින් ගාවින් මුණගැසීමට යා යුතු වූ නිසා මේ ප්‍රමාදය වුවද ඉතා දීර්ඝ කාලයකි. රවි දුටු ශාන්තා කතා කළා ය.

''ඇයි. අපි මෙතන ඉඳීම කරදරයක්ද?''

''කරදරයක් නෙවේ කියල කියන්නත් අමාරුයි. මේ පුටු ටික හදල දෙනකල් ඉන්න පුළුවන්ද?''

''ඇයි බැරි. කියන්න මේ පුටු කොහොමද තියන්න ඕනෑ. අපිත් උදව් වෙන්නම්''

''නැතිවට කමක් නැහැ. මම මේ පුටු ටික තියන්න හිතාගෙන ඉන්නෙ රවුමට''

''මායා එන්න අපි මේ පුටු ටික හදමු'' ශාන්තා රවි කී ලෙස පුටු තැබුවා ය.

''මේ හරිද?''

''හරි'' රවි සිනාසුනේ ය.

''තවත් මොනව හරි තියෙනව නම් කියන්න. අපිත් උදව් වෙන්නම්''

''දැන් වැඩ ඉවරයි'' රවි සිනාසෙමින් කාර්යාලය දෙසට ගියේ ය. සැඳෑ සමයේ සිට වෙහෙස වීම නිසා රවි ගේ සිරුර ඩාදියෙන් තෙත් වී තිබුනි. මුහුණ සෝද ගත් රවි ජනෙල් වසමින් ගෙවුයෙන් දැල්වෙන විදුලි පහන් දෙස බැලුවේ ය. තුරු අතරින් එබී බලන නානා වර්ණ විදුලි බුබුලු නිසා පරිසරය බෙහෙවින් වර්ණවත් ය. සාදය

www.sinhalelibrary.com

සඳහා ආරාධිත අමුත්තන් ළඟාවීමට වේලාව ආසන්න ය. රවි කාමරයෙන් පිටවීමට සූදානම් වෙත්ම ඇල්කඩුව කාමරයට පිවිසුනි.

''මොකද අදත් පැනල යන්නද හදන්නෙ?''

''අද මට පොඩි ගමනක් යන්න තියෙනව. මේ වැඩේ නො තිබුනා නම් අද මම නිවාඩු ගන්නයි හිටියෙ''

''හෙට නිවාඩු දලා ඒ ගමන් යනව. අද මගෙ උත්සවට නවතිනව''

ඇල්කඩුව කාමරයෙන් පිට වී ගියේ ය. ඔහු දඩි ඕනෑ කමින් කියා සිටියදීත් එය ප්‍රතික්ෂේප කිරීමට රවිට සිතුනේ නැත. කිලිටු ඇඳුමින් සැරසී මවුන් ගේ උත්සවයට කැලැල් කිරීමට අකමැති වූ රවි විදුලි පහන් නිවා අසුනට වී දැස් පියා ගත්තේ ය. මඳ වේලාවකට පසු විදුලි පහන දැල්වුන නිසා රවි ඒ දෙස බැලුවේ ය. කාර්යාලයේ තම සේවකයා වශයෙන් සිටින සිරිසේන පිරිසිදු සරමකින් හා කෝට් එකකින් සැරසී සිටියේ ය.

''සිරිසේනට හොඳ සූට් එකක් ලැබිල තියෙන්නෙ''

''ගෙදර ලොකු උත්සව තියෙනකොට තමයි මම මේ සූට් එක අඳින්නෙ'' විවිධ වර්ණ විවිධ විලාසිතාවන් ගෙන් සැරසුන යුවතියන් රැසක් ගෘහ උද්‍යානයට වී කතා කරමින් සිටිනු රවිට පෙනෙයි.

''පාර දිගටම කාර් නවත්තල.....රවි මහත්තය අර දැන් අද්වකත් හාමුදුරුවන්ට අතට අත දුන්න කෙනා දන්නවද?''

''මම දන්නෙ නැහැ''

''ඒ තුන්දෙනාම සුපිරිම කෝට් නඩුකාරයො. මෙහා පැත්තෙ ඉන්න ඇමති නම් අපේ හාමු ගෙ නෑයෙක්. ඒ ගොල්ල නම් කොච්චර හරි මෙහෙනෙ''

''මට කාගෙවත් පූචානම් වැඩක් නැහැ සිරිසේන. පුළුවන් නම් කන්ඩ දෙයක් ගෙනැත් දෙනව''

''ඉස්සර හිටපු ලියනගෙ මහත්තය නම් කන්නෙ කුස්සියට රිංගලයි. රවී සර් කවදාවත් මේ ගෙදරින් වතුර උගුරක්වත් බිව්වෙ නැහැ. එක උත්සවයකටවත් ආවෙ නැහැනෙ. ඒක එක අතකට හොඳා. ගෙදර ඔක්කොම කියන්නෙ රවී සර් අහංකාරයි කියලයි''

''ඔනාව කියල ගිහින් මොනව හරි ගේනවකො''

සිරිසේන කාමරයෙන් පිටව ගිය නොබෝ වේලාවකින් ඇල්කඩුව සේවකයෙක් අන රවී කැඳවූවද ඔහු එහි ගියේ නැත. මෙවැනි වැරහැලි ඇඳුම් ඇඳ එම සමාජයට යාම ඇල්කඩුව මහතාට මදිකමක් ලෙස රවී සැලකුවේ ය. කාමරයෙන් පිටත ගිය ඔහු වැඩිපුර ජනයා නො ගැවසෙන තැනක අසුන් ගත්තේ ය. නිවස දෙසින් උස් ස්වරයක ගී හඬක් නිකුත් වනු ඇසෙයි. එම සංගීතයට යුවතියන් ගේ සිනා හඬත් එක් වී ඇසෙයි. සිරිසේන කෑම බන්දේසිය රැගෙන කාමරයට යනු දුටු නිසා රවී වහා කාමරයට ගියේ ය.

''හරි වැඩේනෙ සර්. මම කෑම ගේන කොට ප්‍රින්සි නෝනට අහු උනානෙ''

''සිරිසේන මොකද කිව්වෙ?''

''රවී මහත්තයට ගෙනියනවයි කිව්වම ප්‍රින්සි නෝන මගෙ ඇඟට කඩා පැන්න. මෙච්චර දුහක් දෙනාට එළියට

www.sinhalelibrary.com

වෙලා කන්න බොන්න හොඳනම් මොකද එයාට විතරක් ගෙට ගෙනියන්නෙ, ගෙනියන්න එපා කිව්ව''

රවි සිරිසේන දෙස බලා සිටියා විනා කතා නො කළේ ය.

''ඒ සැරේ ශාන්තා නෝන ඇවිදින් ප්‍රින්සි නෝනට මොනවද මන්ද ඉංග්‍රීසියෙන් කියල මට මෙව ගේන්න කීව්ව. බියර් ඕනෑ නම් ඇවිදින් ගෙනියන්න කිව්ව''

''සිරිසේන තරහ නැතිව මේව ආපහු ගෙනියන්න. ප්‍රින්සි නෝන හිටියොත් ඒකිටම පේන්න තියන්න''

''ඔව් සර් එහෙම් තමා කරන්න තියෙන්නෙ. මට ශානට වැඩේ කරන්නම්''

සිරිසේන කෑම බන්දේසිය රැගෙන ගිය පසු රවි කාර්යාලයේ දොර ජනෙල් වසා පිටවීමට සූදානම් වුනි. මඳ දුරක් යනවිට ඇල්කඩුව කතා කළ නිසා රවි නතර වුනි.

''කොහෙද අයියෙ යන්නෙ. මම කිව්ව නේද ඉන්න කියල''

රවි නිහඬව බිම බලා ගත්තේ ය.

''තවම මොනවත් කෑවෙ නැහැ නේද?''

''මේව කෑවොත් බත් කන්න බැරිවෙනව''

''එනව ගේ ඇතුලට යන්න''

''මට බැහැ සර්. මේච්චගෙ කිලිටු පරණ ඇඳුම් ඇඳ ගෙන ඔය ලොකු මිනිස්සු ඉන්න තැනට ගියාම ඒක සර්ට මදිකමක්. ඒක හින්ද මම යනව''

''මම මිනිසුන්ගෙ හොඳ නරක, දක්ෂකම් මනින්නෙ ඇඳුමෙන් නෙවේ. එනව ගෙට යන්න'' ඇල්කඩුව සිනා

www.sinhalelibrary.com

සෙමින් රවි ගේ අතින් අල්වා ගත්තේ ය. ශාන්තා දොරකඩ අසලට පැමිණ බලා සිටිනු රවිට පෙනෙයි.

"මේ බලන්න සර් උදේ ඉඳල මහන්සි වෙලා මට හරි අමාරුයි" රවි සිනාසෙමින් කීවේ ය.

"ඒක නෙමේ අර ලෝ ක්ලාස් එක ගැන මම කිප දෙනෙක් එක්කම කතා කළා. ඒ අය කියනව රවි ගෙ අදහස හොඳා කියල. පන්තිය කරන්න තෝරගන්න හිතාගෙන ඉන්න තුන්දෙනත් අද ඇවිදින් ඉන්නව. රවි ඒ අය එක්ක අද ටිකක් කතා බහ කරල අඳුන ගන්න. ළඟ පස්සෙ දවසක මේ ගැන තීරණයක් ගන්න දැන් රවි ඒ අය හමුවෙන්න"

රවි නිහඬව සිටියේ ය. ප්‍රින්සි හා ප්‍රියන්තා ඇල්කඩුව දෙස බලා සිටියහ. කෑම පිඟාන ප්‍රතික්ෂේප කිරීම නිසා ඔව්හු කෝපවන්නට ඇත. ඇල්කඩුව රවි කැඳවාගෙන නිවස තුළට ගියේ ය. බැලූ බැලූ දස අතම ඔහු දුටුවේ අගනා ඇඳුම් ආයිත්තම් වලින් සැරසී සිටි ගැහැනු මිනිසුන් ය. ඔහුට ඇසුනෙ ඔවුන් ගේ ප්‍රීතිමත් හඬවල් පමණි. තමා අමුතුම ලෝකයකට පිවිසියෙක් මෙන් රවිට දැනෙයි. ඇල්කඩුව මහතා විසිත්ත කාමරයේ සිටි කිප-දෙනෙකුට රවි අඳුන්වා දුන්නේ ය. ඔවුන් ගේ ආරාධනය අනුව රවි විසිත්ත කාමරයේ වූ සුවපහස් අසුනක ඉඳ-ගත්තේ ය. නාගහවත්ත, අපොන්සු යන නීතිවේදීන් දෙදෙන රවි හා සුහදව කතා කළෝ ය. ඇල්කඩුව මහතා තමා පිළිබඳව හොඳ විස්තරයක් දී ඇති බව ඔවුන් ගේ කතා වලින් රවිට වැටහුනි. ප්‍රින්සි, ප්‍රියන්තා හා හෙක්ටර් ශාලාවේ කෙළවරට වී කතා කරමින් සිටිනු රවිට පෙනෙයි. ඔවුන් සිතනවා ඇත්තේ තමා ලොකු මිනිසුන් අතර

www.sinhalalibrary.com

සිටීමට වඩා මෙම නිවසේ සුවපහස් අසුන්වල සිටීම ගැන විය හැක. සේවකයින් පිරිනැමූ කෑම් මත්පැන් රවි ප්‍රතික්ෂේප කළේ ප්‍රින්සිට රිදෙන පරිද්දෙනි.

''රවි මොනව හරි බයිට් එකක් ගන්න''

''එපා මිස්ට නාගහවත්ත. දැන් ඔය කෑවොත් රෑට කෑම කන්නත් බැහැ''

බතික් ඇඳුමෙන් සැරසුන යුවතියක් සිසිල් බීම බන්දේසියක් රැගෙන රවි දෙසට ආවා ය.

''උපේක්ෂා කූල් ඩ්‍රිංක් එකක් මෙහාටත් ගේන්න''

''අම්මේ කවුද ඒ උපාසකයා'' ඇය සිනාසෙමින් කතා කළා ය.

''රවී එහෙනම් කූල් ඩ්‍රිංක් එකක් ගන්න''

''අනේ හොඳයි'' ඇය සිනාසෙමින් බන්දේසිය රවිට පෑවා ය. රවි ඇයට ස්තුති කර සිසිල් බීම විදුරුවක් ගත්තේ ය. ශාන්තා කැවිලි බන්දේසියක් රැගෙන එනු රවිට පෙනෙයි. ප්‍රින්සි පැමිණ සිටින අමුත්තන් සමගින් කතා බස් කරමින් සිටියද ඇගේ මුහුණේ වූ අමනාපය තවම පහව් නැත. ශාන්තා බන්දේසිය රවිට පෑවා ය.

''ස්තුතියි කාලයි ඉන්නෙ''

''බොරු කියන්නෙ නැතිව කන්න''

''එපා''

''මට සිරිසේන කිව්ව. නොගත්තොත් ඩැඩිට කියනව''

''ශාන්තා දෙන දෙයක් බැහැයි කියනවද බලමු'' නාගහවත්ත සිනාසුනෙ ය.

''ගන්න'' ශාන්තා කීවා ය.

රවි කේක් කෑල්ලක් අතට ගත් විට සැවොම සිනා සෙන්ට වූහ. ශාන්තා වහාම එතැනින් දුව ගියා ය. සේවකයාට කෑම බඳුන දී හැරෙන විට ප්‍රින්සි ඇගේ ඉදිරියට ආවා ය.

''බලන්න ශාන්තා ඩැඩී කරන පිස්සු වැඩ. කොහෙද යන හිඟන්නො ගෙට දමාගෙන''

''ඩැඩීනෙ රවි එක්කගෙන ආවෙ''

''ඔන්න හෙක්ට බැන බැන ඉන්නවා. අර බලන්නකො රජා වගෙ කකුලක් පිට කකුලක් දාගෙන ඉන්න හැටි. අපිට එගේන්ස් එකට වාගෙ කෑම ට්‍රේ එක ආපහු එව්වු එකාට ඔයා මොකටද කන්න ඇල්ලුවෙ''

''මම රවිට කියල විශේෂයෙන් ඇල්ලුවෙ නැහැ''

ප්‍රින්සි යළි සාලයට ගියා ය. ඔමතරම් වැදගත් මිනිසුන් මැද රවි වැන්නෙක් සිටීම කිරි කලයක් පුරවා එයට ගොම බිඳක් දැමීම වැනි වැඩකි. රවි ප්‍රින්සි ගේ කුපිරු දෙනෙතින් නී කතාව තේරුම් ගත්තෙ ය. රවි සාක්කුවෙන් දුම් වැටියක් ගෙන දල්වා අසුනෙන් නැගී සිටියේ ය.

''එහෙනම් මිස්ටර් ඇල්කඩුව එක්ක කතා කරල තුන් දෙනාම එක දවසක මුණ ගැහෙමු.''

''යන්න එපා අයිසෙ. තව ඉන්නව''' නාගහවත්ත රවි ගේ අතින් අල්වා යළි අසුනින් ඉන්ද වූයේ ය.

''මේ එක නෙමේ. රවි ලෝ එග්සෑම් එක කරන්න. අපි ෆුල් සපෝට් එක දෙනව'' නාගහවත්ත කීවේ ය.

''නාගෙ රවිට අමාරු නැහැ''

www.sinhalalibrary.com

රවි ඔවුන් හා මඳ වේලාවක් කතා කරමින් සිට ඇල්කඩුව මහතා ගෙන් සමුගෙන නවාතැන බලා ගියේ කලකිරුන සිතින් යුතුව ය. රැකියාවක් නැතිකම නිසා මෙවැනි තැනකට පැමිණියත් හෙක්ටර්, ප්‍රින්සි වැනි අය ඉදිරියේ පහත් වී සිටීමට ඔහු සතුටු වූයේ නැත.

පසුදින සිට රවි රැකියාවට ගියද උත්සව දිනයේ ඇති වූ කලකිරීම ඔහු ගේ සිතෙන් පහව ගියේ නැත. 'හොඳයි කවද හරි මටත් වාරයක් එයි' රවි දැඩි ලෙස සිත පාලනය කර ගත්තේ ය. මෙම සිද්ධියෙන් පසුව ඔහු ඇල්කඩුව මහතා සමගින් හැර නිවසේ කිසිවෙක් සමගින් වත් කතා කළේ නැත. ප්‍රින්සි, ප්‍රියන්තා, ශාන්තා වැනි ඇල්කඩුව ගේ දූවරුන් නිවසේදී මෙන්ම පිටතදී මුණ ගැසුනත් රවි ඉවත බලා ගියේ ය. මිනිස්කම සහිදලුණු වශයෙන් වත් නැති අය වෙනුවෙන් මදහස පෑමවත් මහත් පාපයකැයි ඔහුට සිතුනි. සිතේ සතුටක් නැතිව වැඩක නිරතවීම අසීරු කරුණකි. දින භාගයක නිවාඩුවක් ගත් රවි පුවත් පත් කාර්යාලයේ සේවය කරන මිතුරා හමුවීමට යාමට අදහස් කළේ ය. පත්‍රයේ රැකියාව වත් ලැබුණා නම් මෙලහට්ත් මේ අමනුෂ්‍යයන් අතරින් වෙන් වී ගොස් සැමෙහන කලකි. බස් නැවතුම් පලට පිවිසෙත්ම ශාන්තා තරුණයෙක් හා කතා කරමින් සිටිනු රවි දුටුවේ ය. ඇය රවි දුටු වහාම තරුණයාගෙන් වෙන් වී ගියා ය.

දේශකයන් හමු වී නීති පංතිය සම්බන්ධව කරන ලද සාකච්ඡාවෙන් පසුව රවි පංතිය අරඹන දිනය, ස්ථානය පිළිබඳ පුවත්පත් දැන්වීම් කිපයක් පළ කළේ ය. මෙම දැන්වීම අනුව ලැබුන ඉල්ලුම්පත් සංඛ්‍යාව විශාල වූ හෙයින් කාලසටහන් සකස් කිරිම, සිසුන් වර්ග කිරීම ආදී කටයුතු මෙන්ම පාඩම් මාලා සකස් කිරීමද කළ යුතු විය.

www.sinhalalibrary.com

රවි මේ සඳහා දින දෙකක්ම ඇල්කඩුව ගේ නිවසේ නතර වී දිවා රාත්‍රී නො කඩවාම වැඩ කළේ ය. රාත්‍රී ආහාරය සඳහා රවි පිටත යාමට සූදනම් වුවත් ඇල්කඩුව එයට ඉඩ දුන්නේ නැත.

''තමුසෙ ගෙ හැටි මම දැනගෙන ඉවරයි. එනව කෑම කන්න''

ඇල්කඩුව රවි කැඳවාගෙන නිවසට යනවිට හෙක්ටර් පුවත්පතක් බලමින් ඉස්තෝප්පුවේ සිටියේ ය.

''හෙක්ට කෑමට එන්න''

''බෑ ඩැඩී මම පස්සෙ එන්නම්'' හෙක්ට රවි දෙස බලමින් කීවේ ය. කෑමට සහභාගි වූ ඇල්කඩුව මැතිනිය වරින් වර රවිගෙන් ඔහු ගේ පවුලේ තොරතුරු විමසුවා ය. මව ගේ අභාවයෙන් පසු රවි තනිව ජීවත්වන බව ඇසූ ඇල්කඩුව හා මැතිනිය ඔහු ගැන දුක් වූහ.

''රවි කවදවත් මට මේව කියල නැහැ''

''කාටවත් කිව්ව කියල ඇති වැඩක් නැහැ සර්''

ඇල්කඩුව කල්පනා කරමින් අහර ගත්තේ ය.

''තවාතැන් වලට සල්ලි නාස්ති කරන්න ඕනෑ නැහැ. ඕනෑ කාලයක් ඔපිස් කාමරේ නවතින්න''

''ඔව් ඇත්තට මේ ළමයට ඒ කාමරේ නතර උනාම ඉවරයිනෙ. කෑම ටිකක් දෙන එකත් ඒ තරම් දෙයක් නොමෙයි නේද විල්සන්''

''ඒක මොකන්ද. කැමති දවසක එන්න''

ඇල්කඩුව ගේ සිතෙහි රවි කෙරෙහි ඇතිවූයේ විශාල දුකකි. රවි රාත්‍රී අහර ගැනීමෙන් පසු කාර්යාලයට ගොස්

www.sinhalalibrary.com

නීති පාඨමාලා සකස් කරන්ට පටන් ගත්තේ ය. මඳ වේලාවකට පසුව ඇල්කඩුව මහතාද පැමිණ රවිට සහාය දුන්නේ ය. රාත්‍රී එකොළහට පමණ ඇල්කඩුව මහත්මියද රවි සිටින ගොඩනැගිල්ලට ආවා ය. ඇය පැමිණ මඳ වේලාවකින් ශාන්තාද පැමිණියා ය.

''ගෙදර ඔක්කොම ඇවිදින්. මෙතන ඇවිදින් නිකා ඉන්න බැහැ. මොනව හරි කරන්න ඕනැ'' ඇල්කඩුව මැතිණිය ඇමුනුම් යන්ත්‍රය ක්‍රියා කරවමින් කීවා ය.

''හොඳ දුව වාගෙ අපිට බොන්න දෙයක් ගේන්න ඕනැ. හපන්න දේකුත් ඕනැ''

''ඒවා ඔක්කොම හරි. තව ටිකකින් මෙහෙන්ට එයි'' ශාන්තා සිනාසුනා ය.

''රවී මෙන්න මෙයාගෙනුත් මොනව හරි වැඩක් ගන්න'' ඇල්කඩුව සිනාසුනේ ය. රවි නිහඬව දේශන වර්ග කිරීමට ශාන්තාට භාර කළේ ය. ඇල්කඩුව වැඩ කරන අතර නොයෙකුත් රස කතා කිවේ ය.

''සර් දැන් මහන්සි උනා ඇති. ගිහින් නිදාගන්න''

''ඔව් විල්සන්. තේ බිල නිදාගන්න යමු. මේ ළමයත් වැඩියෙ මහන්සි වෙන්න එපා නිදාගන්න''

තේ පානයෙන් පසු ඇල්කඩුව වැඩ නවතා නිවස දෙසට ගියේ ය.

''මට ඒ ළමය ගෙ කතාව ඇහුවම ඇස් වලට කඳුළු ආවා''

''මම මෙච්චර කල් ඔය කිසි දෙයක් දැනගෙන හිටියෙ නැහැ. හැබැයි කොල්ල මට හරි හිතවත්. හෙක්ටර්ව මිනිහට පෙන්නන්න බැහැ''

''හෙක්ටර් කතා කරනකොට ඕනෑ කෙනෙකුට තරහ එනවා''

''ලබන සුමානෙ ලෝ ක්ලාස් එක ඉවර උනාම පඩි දෙන්න වත්තට යවන්නෙ රවිවයි'' ඇල්කඩුව ඇඳේ වැතිර කීවේ ය.

* * *

නීති පංතිය අවසන් වූ පසු රවි වත්තේ පඩි දීම සඳහා යැවූ පුවත කන වැකුන වෙලේ හෙක්ටර් ගේ සිතේ ඇති වූයේ කෝපයකි.

''ඔයාගෙ ඩැඩී කවද හරි ලොකු අමාරුවක වැටෙනව ඔය රවි හින්ද''

''අපි මොනව කරන්නද ඩාලිං, ඩැඩීට ඒකව විශ්වා-සයිනෙ''

''මේ මාසෙ පඩි දෙන්න යවල තියෙන්නෙ ඒකව'' හෙක්ට අසුනෙන් නැගිට ජනේලය වෙත යමින් කීවේ ය.

''දෙයියනේ'' ප්‍රින්සිට ඉබේම කියවුණි.

''මට යන්න පුළුවන් කමකට නෙවේ. ඩැඩිට නිකමට මගෙන් අහන්න තිබුනෙ නැද්ද වත්තට ගිහින් එන්න බැරිද කියල''

''ඔයා මේව කෙලින්ම ඩැඩීට කියන්න හෙක්ට්. ඔච්චර ලොකු සල්ලි ගානක්..........?''

''මම අහවල් එකකට කියන්නද. මම මේ බලා ඉන්නෙ ඩැඩී ඕකගෙන් පාඩමක් ඉගෙන ගන්න කල්. එදාට හෙක්ටර් කිව්ව දේවල් අගේට තේරෙයි'' ඔහු උස් හඬින් කීවේ ය.

එකවරම පරිසරයේ නිහඬ බවක් ඇතිවුනි.

''මම හිතන්නෙ ඩැඩීට ඕක මොනව් හරි ඉනා බෙතක් දීල කියලයි''

''පිස්සු නැතිව ඉන්න ප්‍රින්සි. දැන් ඉස්සර වාගෙ නෙවේ කොයි පෙරකදෝරුවටත් නඩු අඩුයි. අපිත් මොනව හරි බිස්නස් එකක් කරන්න ඕනෑ''

''මොනව කියල කන්නද ඩාලිං. එච්චර සල්ලි අපිට කොයින්ද? කෝච්චරවත් මට බැහැ ඩැඩිට කරදර කරන්න''

''ඩැඩී ඉස්සර වාගෙ නෙවෙ. වීක් එන්ඩ් ලෝ ක්ලාස් වල ලෙක්චස් දෙන්න මාත් ඉල්ලුව, එනෙනෙනුත් ගානක් ගන්න පුළුවන් නේද කියල''

''ඇත්තටම ඔයාට පුළුවනිනෙ ඩාලිං''

''මාත් හිතුවෙ එහෙම තමා නමුත් ඩැඩී කියනව රව්ගෙන් අහන්නෙ නැතිව බැහැයි කියලා''

''අනේ දෙයියනේ. මූ ඩැඩීට මොනව හරි දීල තමා. මම ගිහින් කතා කරන්නම්. යමු ලෑස්ති වෙන්න''

ප්‍රින්සි සූදනම් වූයේ කෝපයෙනි. මෙය තමාට කරන ලද මදිකමක් බඳු ය. හෙක්ට නීතිවේදියෙක් වුවද එතරම් වත්පොහොසත් කම් නැති අයෙකි. ඔහුට නඩු වලින් ලැබෙන මුදලට අමතරව වෙනත් අය මාර්ග තිබුනේ නැත. මැතක සිට දිනකට ලැබෙන ආදායම සීඝ්‍රයෙන් පහළ බැස් සේ ය. පියා පවත්වාගෙන යනු ලබන නීති පංතියේ සිය සැමියාට ඉගැන්වීමට අවස්ථාවක් නො ලැබීම නිසා ඇගේ සිත කෝප මිශ්‍රිත දුකකට පත්වූවා ය. රුපියද බෙහෙවින් අබලන් ය. ඉන් නැගෙන කබල් හඬ නිසා ඇගේ හදවතේ

www.sinhalalibrary.com

දුකක් උපදියි. එන්නට රථය පිවිසි වහාම ප්‍රින්සි බැලුවෙ රවි ගේ කාමරය දෙස ය. ඔහු තවම ගොස් නැත. ඇය නිවසට පිවිසියේ අඳුරු වූ මුහුණින් යුතුව ය. ශාන්තා සොයුරිය දුක අසුනෙන් නැගී සිටියා ය.

''අක්ක දුව දුල ආවද?''

''ඔව් නංගී. කෝ අම්ම?''

''අම්ම කාමරේ ඉන්නව. මොකද අද හෙක්ට අයිය සිල් අරගෙන වාගෙ!''

''ප්‍රින්සි මොකද ළමයව දුල ආවෙ?'' මව සාලයට ආවා ය.

''ළමයි නෙවේ අපිට වත් මේ ගෙදරට එන්න වෙන එකක් නැහැ මමී'' ප්‍රින්සි ඉවත බලා කීවා ය.

''මොකද ප්‍රින්සි එහෙම කිව්වෙ?''

''බලන්න මමී ඩැඩී කරන දේවල්. හෙක්ට ඩැඩීට කිව්වලු එයාට වීක් එන්ඩ් ක්ලාස් එකේ උගන්වන්න දෙන්න කියල. ඩැඩී කියල තියෙනව රවිගෙන් අහන්නෙ නැතිව බැහැයි කියල''

''මොනව ප්‍රින්සි! ඇත්තද පුතා මේ කියන්නෙ?''

''ඔව් මමී. රවිගෙන් අහන්නෙ නැතිව බැහැ කිව්ව''

''විල්සන්ට පිස්සුද මන්ද. හොඳයි මම වැඩීට කියන්-නම්කො. පුතා බය නැතිව ඉන්න''

''රවිගෙයි අපෙයි තියෙන සාකච්ඡාව මොකක්ද? එයා අපේ වැඩකාරයෙක් විතරයි. ඔයා බය නැතිව ඉන්න හෙක්ටර් අයියෙ'' ප්‍රියන්ති ඔහු අස්වැසුවා ය.

''ඩැඩීට රවි විශ්වාසයි'' මට කීවා ය.

''ඔව් අපට වඩා. නැතිනම් එන්නට යවාවිද?''

''රවි දක්ෂයි'' ශාන්තා කීවා ය.

''උනේ උගෙ තියෙන දක්ෂකම. ශාන්තා දන්න දෙයක් නැහැ''

''දක්ෂයාට දක්ෂයි කියන්න අක්කෙ. මම කතා කරන්නෙ පැත්තකට නැතිව. ලියනගෙ ඩැඩීට වංචා කරල පැනල ගියා. බලන්න රවි ඇවිදින් මේ ටික කාලෙට කරපු දේවල්''

''ශාන්තා දන්නෙ නැති දේවලට කට දන්න එපා. රවි දක්ෂයෙක් නෙවෙ කට්ටියෙක්'' ප්‍රියන්තා කීවාය.

''අන්න හරි නංගි. අන්න එතනයි හේතුව'' හෙක්ටර් උස් හඬින් කීවේ ය.

''ඩැඩී ගෙ ඇනවසරී එක දවසෙ දැක්කද උඹ සැට්යට වෙලා කකුලක් පිට කකුලක් දාගෙන ජජන්න වාගෙ හිටපු හැටි. ඕක මම ඩැඩී එක්ක කිව්ව කියල ඩැඩී මට බැන්න. දැන් මේ ගෙදර කොහෙන් වත් ආපු අයයි ලොකුවෙලා ඉන්නෙ'' ප්‍රින්සි හඬමින් කීවා ය.

''ප්‍රින්සි නාඩ ඉන්න දුව. මම ඩැඩී ආවම කියන්නම්''

ශාන්තා ඔවුන් ගේ සමාගමයෙන් වෙන් වූයේ තරමක අසතුටකින් යුතුව ය. කාමරයේ සිටින ඇයට රවි වැඩ අවසන් වී යාමට සූදානම් වනු පෙනෙයි. ඔහු පිළිබඳව නිවසේ අය සාකච්ඡා වන හැටි ඔහු දන්නේ නම්. වරෙක රවි ගේ පුදුම සහගත හැසිරීම ඇයට සිහිවෙයි. සේවයට පැමිණ ගත ගත වූ කාලය තුළ ඔහු තමා දෙස බලනු දැක

www.sinhalalibrary.com

ඇන්නේ දෙවරකි. සමහර දිනෙක බස් නැවතුම් පලේදී මූණ ගැසුනත් ඕනු හිස ඔසවා බලන්නේ වත් නැත. රවි ගේ තේජස්වි මුහුණ ඇය ප්‍රිය කළා ය. ඔහු ඒමට ප්‍රථම සේවය කළ ලියනගේ නිවසේ අය ගේ සැලකිල්ලට ලක් වූයේ ඔහු ගේ නිවට හැසිරීම නිසා යැයි ශාන්තාට සිතෙයි. ලියනගේ ඕනෑම කටයුත්තක් ඉටුකරවා ගත්තේ බැගෑපත් වීමෙනි. සුදු හාමිනේ, වලව්වේ හාමුදුරුවෝ, අද්වකාත් හාමුදුරුවෝ වැනි ගෞරව නාම වලින් නිවසේ අය ඇමතීමට ඔහු පුරුදුව සිටියේ ය. උත්සව අවස්ථා වලදී කෑදර ලෙස කන බොන ඔහු මේ නිසාම නිවසේ අය ගේ පිළිකුලට ලක්වූනි. එහෙත් රවි කිසි දිනෙක කිසිවක් කනවා ශාන්තා දැක නැත. රවිට විරුද්ධව එල්ල වී ඇති චෝදනා පදනම් රහිත ය. ප්‍රින්සි අක්කාට හා හෙක්ටර් අයියාට ගැලපෙන මිනිසුන් ලොව නැතැයි ඇයට සිතෙයි. තවම පියා පැමිණ නැත. නැවතත් රවි පිළිබඳව සාකච්ඡා වෙනු ශාන්තාට ඇසෙයි. ඇල්කඩුව මහතා පැමිණියේ පැය භාගයකට පමණ පසුව ය. ඔහු මුහුණ සෝද සාලයට පැමිණ මොහොතකට පසු රවි පිළිබඳව කතා කරනු ශාන්තාට ඇසුනි.

''ඩැඩී වැඩ කටයුතු කරන්නෙ රවි කියන විදිහටද ඩැඩී?''

''නෑ ප්‍රින්සි රවි වැඩ කරන්නෙ මම කියන විදිහට. බොහොම අවස්ථා වලදී සමහර ප්‍රශ්න ගැන අපි සාකච්ඡා කරනව. ඇයි එහෙම ඇහුවෙ?''

''ඇයි එහෙනම් මේ හෙක්ටර් ළමයට පංතියෙ උගන්වන්න ගන්නෙ නැත්තෙ. දැන් එයාටත් කරදරයිලු''

www.sinhalalibrary.com

''මම හිතන්නෙ නැහැ හෙක්ටර්ට එච්චරටම අමාරුයි කියල''

''දැන් ඉස්සර වගේ නඩු හම්බ වෙන්නෙ නැහැ'' හෙක්ටර් කතා කළේ පහත් හඬිනි.

''හෙක්ටර් කලින් පන්තිය ගැන මතක් කළා නම් මොනව හරි කරන්න තිබුනා. දැන් තෝරගෙන ඉවරයි''

ඇල්කඩුව ගේ කතාවෙන් පසු ප්‍රින්සි ගේ මුහුණ අඳුරු වී ගියේ ය. ඔවුන් දෙදෙන එදින නිවසින් පිට වී ගියේ රාත්‍රි ආහාරයටද නොසිට ය.

# 2

පාඨශාලාන්තර කථික තරඟ මාලාව සඳහා ශාන්තා අධ්‍යාපනය ලබන පාසැලද ඉදිරි පත්ව සිටියේ ය. පාසැල වෙනුවෙන් නියෝජනය වන කථික කණ්ඩායමේ මූලිකයා වශයෙන් ශාන්තා පේරුනෝ ඇය නිවාසාන්තර තරඟ වලදී දස්කම් පා සිටි බැවිනි. වාදයට අවශ්‍ය කරුණු තරඟයට සහභාගි වන සිසුවියන් රැස්කර ගත්හ. හැමදෙනම ශාන්තා සොයන කරුණු ගැන විමසිලිමත් වූයේ ඇගේ පියා දක්ෂ නීතිවේදියෙක් වන හෙයිනි. එහෙත් කාර්ය බහුල පුද්ගලයෙක් වූ සිය පියාගෙන් ඒ සඳහා උපකාරයක් ලබාගැනීම පහසු කරුණක් නො වුනි.

''අනේ ඩැඩී මේ ඩිබේට් එකට නම් මොනව හරි ලියල දෙන්න ඕනැ''

''ඩැඩීට තියෙන රාජකාරි දූ දන්නෙ නැතිව වගෙයි කතාව. ඕක හෙක්ටර් අයියට කියල ලියව ගන්න''

''කෝ එයා ආවෙත් නැහැනෙ. අද ගෙදරින් ගියේ තරඟ වෙලාද මන්ද''

www.sinhalaelibrary.com

''ඒකත් එහෙමද. කාටද මම කියන්නේ.......... හා එන්න රවිට කියල බලමු''

ඇල්කඩුව සිය දියණිය කැටුව රවි සිටින ගොඩ-නැගිල්ලට ගියේ ය. ඇල්කඩුව දුටු රවි අසුනෙන් නැගී සිටියේ ය.

''වාඩිවෙන්න රවි. මෙන්න මේ ළමය ගෙ ඉස්-කෝලෙ ඩිබේට් එකට පොයින්ට්ස් ටිකක් ලියල දෙන්න''

''කවදටද සර් ඕනෑ'' රවි මානෑකාව දෙස බලමින් ඇසුවේ ය.

''කවදටද දුව ඕනෑ?''

''නෙක්ස්ට් මන්ඩේ''

''අද සිකුරාද. ඔච්චර ඉක්මනට ලියන්න බැහැ සර්'' රවි ශාන්තා දෙස නො බලා ඇල්කඩුව මහතාට කීවේ ය. රවි ගේ ස්වභාවය දන්නා ඇල්කඩුව ගේ මුවගට සිනාවක් නැගුනි.

''කමක් නැහැ. මොනව හරි ටිකක් ලියල දෙන්න''

''එහෙම ලිව්වම මාව පල්වෙනව නෙ''

''එහෙනම් පොයින්ට් ෆෝම් එකේ ලියල දෙන්න'' ශාන්තා මේසය මත දෑත් තබා කීවා ය.

''හොඳයි මම ටිකක් ලියන්නම්. මිස්ට හෙස්ටර්ටන් කිව්ව නම තව කරුණු හොයා ගන්න පුළුවන්.''

''එයා කරන එකක් නැහැ'' ශාන්ත රවි දෙස බැලුවා ය.

www.sinhalaelibrary.com

ඇල්කඩුව සිය දියණිය ගේ අත ගෙන කාර්යාලයෙන් පිටත ගියේ ය.

''ඔය හාදය හරි පුදුමාකාර මිනිහෙක්. දෙවියන්ට හරි කියන්න තියෙන වචනෙ මූණටම කියනව. දක්ක නේද එක පාරටම බැහැයි කිව්ව හැටි''

''අන්න එහෙමයි මිනිස්සු ඉන්න ඕනෑ. මම නම් ඒ වගෙ අයට කැමතියි ඩැඩී.''

ශාන්තා සිය කාමරයට වැදුනා ය. ඇයට රවි කතා කළ ආකාරය සිහිවුනි. හරි පුදුමාකාර මිනිහෙක්. තමා මූණ ගැසීමට බස් නැවතුම් පළට එන සංඛ ගේ දියාරු මුහුණ ශාන්තාට සිහිවුනි. ඔහු තමා හා කතා කිරීමට වෙහෙසෙන අයුරු ඇයට සිහිවුනි. හෙක්ටර්, සංඛ වැනි අය ඉදිරියේ රවි නියම මිනිහෙකි. සැඳෑ සමයේ වුවද හෙක්ටර් පැමිණියේ නැත. පසු දින උදෙන්ම පාසැල වෙත යද්දී ඉදිරියට එන රවි දුටු ශාන්තා ඔහු දෙස නිහඬව බලා සිටියා ය. ඇය රවි හා කතා කිරීමට බිය වූවා ය. රවි තමා ඉදිරිපස නතරවන විට ඇගේ සිතෙහි බියක් ඇති වුනි.

''ඉක්මනින් කරුණු හොයන්න අමාරුයි. ඒ උනත් ටිකක් ලිව්ව. ගිහින් කියවල බලන්න'' රවි පොතක් ශාන්තා අත තබමින් කීවේ ය.

''බොහොම ස්තුතියි''

''මේක මගෙ සටහන් පොතක්, මෙන්න මේ හරියෙ අවශ්‍ය කරුණු ඇති. මගෙ අකුරු කියවන්න පුළුවන්ද මන්ද?''

www.sinhalalibrary.com

''කියවන්න පුළුවන්'' ශාන්තා සිනා මුහුණින් යුතුව කීවා ය.

''දැන් ගෙවල් පැත්තෙ යනව නේද?''

''නෑ මම අද නිවාඩු''

''අනේ.........මොක හින්දමද ආවෙ. අපරාදෙ කරදර උනා''

''ඒක මොකක්ද. එහෙනම් මම යනව''

රවි නො පෙනී යන තෙක් ඕ බස් නැවතුම් පලේ සිටියා ය. පාසැලට පිවිසි වහාම ශාන්තා පන්ති කාමරයට ඇතුළු වී එය කියෙව්වා ය. විද්‍යාව, ආගමික හා විශ්වාස-යන්ට හානිකරද යන්න පිළිබඳ තර්ක කළ විලාශය ඈ සිත් ගත්තා ය. ඒවා ඇයට සිහි කිරීමට තරම් වත් අසීරු වූ සියුම් තර්ක ය. සරද පිටුපසින් සිටිනවා ශාන්තා දුටු පසු එකවරම ඈ එය පසු පසට කර ගත්තා ය.

''හැමදාම බණ මඩුවට අද අතටම අහු උනා. මොනවද සංඛ ලියල තියෙන්නෙ?''

''මංගොල්ල හිතන ජාතියෙ එකක් නෙමේ''

''මොනව උනත් සංඛ අහු උනොත් පාඩු වෙන එකක් නැහැ. මෝඩය උනාට සල්ලිකාරයෙක්නෙ බං'' සරද සිනාසිනා ය.

''ඔන්න සරද ඔයා, මා එක්ක තරහ වෙන්නයි හදන්නෙ. මට සංඛ ගැන කියන්න එන්න එපා''

''ඔයා ඔලුවෙන් හිටගෙන කිව්වත් මම විශ්වාස කරන්නෙ නැහැ. මේ පිරිමි අකුරු. ආ.........මේ එන්නෙ පේෂලා. බලපන්කො පේෂලා ශාන්තාට ලියුමක් ඇවිදින්''

www.sinhalalibrary.com

''අනේ හොඳා, සංඛ් ගෙන් වෙන්න ඇති''

''සංඛ ගෙන් නෙමේ පේෂලා. මේ අර ඩිබේට් එකට පොයින්ට්ස් ටිකයක්''

''කව්ද ලියල දුන්නෙ?''

''අපේ නාත්ත ගාව වැඩ කරන කෙනෙකුට කියල ලියව ගත්ත''

''කොහොමද ඒ කෙනා. තරුණද මහළුද?''

''උඹට මොටද ඒ විත්තිය'' ශාන්තා සිනාසුනා ය.

''සමාවෙයන්. කෙලින් උත්තර දුන්නොත් අපට ප්‍රශ්නය විසඳන්න ලේසියි'' සරද සිනාසුනා ය.

''කොල්ලෙක්. මම උඹලට දවසක පෙන්නනන්-නම්කො''

''කොහොමද හැටි. කලුද සුදුද?''

''කලුත් නැහැ. සුදුත් නැහැ. මම කතා කරල නැහැ බං''

''ශාන්තා උඹලට ඒ වගෙ අය ගැලපෙන්නෙ නැහැ. බැරිද අපිට දෙන්න'' පේෂලා සිනාසුනා ය.

ශාන්තා කිසිවක් නො කීවා ය.

''ශාන්තා ඒකට කැමති නැහැ පේෂලා. අපි වෙනින් අතක් බලා ගම්මු'' සරද කීවා ය.

මිතුරියන් තිදෙනා එක් වී රවී ගේ ලිපිය බැලූහ. රවී තර්ක කළ විලාශය පිළිබඳ සිසුවියන් සැමෙවාම සතුටු වූහ. පන්තිය අවසන් වී නිවසට පැමිණි ශාන්තා අහර ගත් වහාම ඇඳට ගොස් රවී ගේ සටහන් පොත බලන්ට පටන්

ගත්තා ය. පොතේ ඇතුළු පිටුවල ඇඳ තිබූ කාටූන් හා චිත්‍ර සිනහ උපදවන ඒවා ය. රාත්‍රී අහර පිළියෙල වන තෙක් ශාන්තා රවී ගේ සටහන් පොත බැලුවා ය. කෙටි කතාවක් හා එක් නිසඳැස් කවක් ද පොතෙහි විය. ශාන්තා පසු දින පාසැලට ගිය වහාම එය මිතුරියන්ට පෙන්වූවා ය. පේෂලා හා සරද රවී ගේ කෙටි කතාව බැලූහ.

''අනේ ශාන්තා මට හිනෙනව මෙයාව බලන්න''

''හිත ගිහින් වගේ'' ශාන්තා සිනාසුනා ය.

''බිය වෙන්න එපා ශාන්තා. අපි යාළුවන්ට විරුද්ධ කම් කරන්නෙ නැහැ''

''අනේ අපි විරුද්ධ නැහැ. මෙ වගේ සැමියෙක් ලබන බිරිඳ කොතරම් වාසනාවන්ත ද''

''පේෂලා උඹ නිබ්බුත පද කියනවද?''

''නැතුව. නිබ්බුතා නූන සානාරි යස්සා යං ඊදිසෝ පති''

''මෙන්න මුතුහර'' ශාන්තා පේෂලා ගේ ගෙල සෙමින් තද කළා ය.

''උඹෙ හිත කුරිරුයි ශාන්තා'' පේෂලා කීවා ය.

''මම එහෙම කෙළේ විහිළුවට. මේ නාත්ත ගාව වැඩ කරන ක්ලාක් කෙනෙක්''

''විහිළු නෙමේ ශාන්තා. ගෙදරට හෙම මේ විහිළු ආරංචි උනොත් ඒ මිනිහ ගෙ රස්සාවත් නැතිවෙයි''

''අනේ පව්. ළඟදි පාස් අවුට් වෙලයි ඉන්නෙ. මම හිතන්නෙ නැහැ වැඩි කාලයක් ඉඳී කියල''

ශාන්තා නිවසට එන විට රවී කාර්යාලයේ සිටිනු ඇය දුටුවා ය. දිවා සමයේ ඔහු පිළිබඳව කළ කතාව ඇයට

සිහිවුනි. ඔහු කෙරෙහි වෙනදට වඩා දුකක් ඇගේ සිතෙහි ඇති වුනි. සැඳෑ සමය අතිශයින් පාලු බවින් යුතු ය. මෙහෙකරුවා අමදින ලද මිදුලෙහි අඹ කොළ වැටී ඇත. කාමරයෙන් පිටත පැමිණි ශාන්තා මිදුලේ ඒ මේ අත ගමන් කර ගේට්ටුව අසළට ගියා ය. හිතට මොනවා හෝ දෙයක් වී ඇතැයි ඇයට සිතෙයි. යකඩ ගේට්ටුව අල්ලා මඳ වේලාවක් සිටි ඇ එකවරම ආපසු හැරුණේ රවි එන හඬිනි. රවි ශාන්තා සමඟ යාන්තමින් සිනාසී යන්ට ගියේ ය. රවි අහංකාර මිනිහෙකැයි නිවසේ අය කියන කතාව නම් ඇයට විශ්වාස කිරීම අසීරු ය. ඔහු මාවත දිගේ නො පෙනී යනවා ඇය බලා සිටියා ය. මොනවටද දෙයියනේ මම තේරුමක් නැති දේවල් කල්පනා කරන්නෙ. වරෙක මිතුරියන් සරදමට කී කතා ඇයට සිහි වුනි.

යශෝධරාව සමග පැවති කථික තරඟයෙන් ජයගත් දිනයේ ශාන්තා ගේ මිතුරියන් යළි රවි ගැන කතා කළහ. එම ජයග්‍රහණය ලබා ගැනීමට හේතු වූයේ රවි ගේ කරුණු යටතේ තර්ක කළ හෙයිනි. මේ පිළිබඳව රවි සමග කතා කිරීමට ශාන්තා බලවත් සතුටකින් සිටියද ඇයට අවස්ථාවක් ලැබුනේ නැත. අතර මගදී රවි මුණ ගැසුනත් මුවගට සිනාවක් නගාගෙන යන අහංකාර ගමන නිසා ඔහු හා කතා කිරීමට ශාන්තාට සිතෙන්නේ නැත. ඊ ළඟ තරඟය සඳහා රවි ගෙන් කරුණු සොයා ගැනීම සම්බන්ධව මිතුරියන් කතා කළහ.

''ශාන්තා රවි ට කියල ඊ ළඟ ඩිබේට් එකටත් පොයින්ට්ස් හොයා ගන්න ඕනෑ''

''මට බෑ බං. රවි එක්ක කතා කරන්න මට බැහැ. අපි දිනපු එකවත් මම තව කිව්වෙ නැහැ''

''උඹ හරි ගැනියෙක්නෙ. මම හිතුවෙ කියන්න ඇති කියල''

''ගෙදරදි නම් කොහොමවත් කතා කරන්න හිත නැහැ. මගදි රවි මූණ දිහාවත් බලන්නෙ නැහැනෙ''

''උඹ මඟදී රවි එක්ක කතා කරන්නෙ නැත්තෙ සංඛ දකීවි කියල බයේ නේද?''

''සරදු මම ඔයාට කියල තියෙනව නේද සංඛ ගැන කියන්න එපා කියල. ඒක පස්සෙන් ආවට මම පළිද? ඔයාලට මාව තේරුම් ගන්න බැහැ''

''ඔයා සංඛ එක්ක එහෙම එපයාර් එකක් තියන්න ආස නැත්නම් රවි එක්ක කතා කරන්නකො''

''කොහෙද ඒක බලන්නෙවත් නැහැනෙ''

''හොඳයි සරදු අද අපි දෙන්නත් යමු. හැබැයි ඔයා රවී එක්ක කතා කරන්න ඕන''

''ඔව්. ඔව්. වෙන දේකට නෙමෙ. පොයින්ට්ස් වලට තෑන්ක් කරන්න විතරයි''

මිතුරියන් තිදෙන එදින සැඳෑ සමයේ රවි ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් බස් නැවතුම් පළට වී සැහෙන වෙලාවක් සිටියහ. සාමාන්‍යයෙන් රවිට වැඩ අධික වන්නේ සඳුදා හා සිකුරාදා දිනවල පමණි. රවි එන තෙක් සැහෙන වෙලාවක රැඳී සිටි ඔව්හු වෙන්වීමට කථිකා කර ගත්හ.

''එමී මනුස්සය එන පාටක් නැහැ. අපි යමු ශාන්තා''

''හුම්'' ශාන්තා කතා කළේ බිඳුනු ස්වරයකිනි.

www.sinhalalibrary.com

''හේයි. යන්න එපා. එනව'' පාර හරහා පැනීමට සූදානම් වූ පේෂලා අතින් සංඥා කරමින් කීවා ය.

''ඔය එන හාදයද?'' පේෂලා සිනා වෙමින් ඇසුවා ය.

''ඔව්. ඔය කලු බෙල්ට් එක දාල එන්නෙ''

''ඔව් බං. මේක නම් ටිකක් කදමයෙක් වගේ. ඒ උනාට ඔහොම උන් තමා අල්ලන්න ලේසි. බලමුකො ඔහෑ උදව්වක් දෙන්නම්''

''උඹ මොනවද මේ කියන්නෙ?''

''යන්න කලින් කතා කරපං'' සරද ශාන්තා ගේ අත මිරිකමින් කීවා ය.

''ඩැඩී ගෙදර හිටියද?''

''නෑ'' රවි පහත් හඬින් කතා කළේ ය.

''මලී''

''හිටියා''

''ප්‍රියන්ති''

රවි එම පැනයට පිළිතුරු නොදී ශාන්තා දෙස බලා සිනාසුණේ ය. පේෂලා හා සරද පසෙකට වී සිනාසෙන විට ශාන්තා ගේ සිතේ ඇති වූයේ විශාල තැති ගැනීමකි. ඔවුන් තමා මග හැර ඇතැයි ඇයට සිතුනි.

''රෙජිස්ටර් එක මාක් කරන්න හදනව වාගෙ. මම ගේ ඇතුලෙ විස්තර දන්නෙ කොහොමද?'' රවි සිනා-සුනේ ය,

''ගේ ඇතුලෙ නෙමේ හිත ඇතුලෙ තියෙන දේවල් හොයන්න දක්ෂයි වගේ'' රවි පේෂලා ගේ කතාවට එක වරම පිළිතුරු නොදී මඳ වේලාවක් සිටියේ ය.

www.sinhalaelibrary.com

‘‘හිත් ඇතුලෙ තියෙන දේවල්ද?’’ රවි සිනාසුණේ ය.

‘‘මම එච්චර දුරට හිත පුරුදු කරල නැහැ’’

‘‘ඔය කතාව අපි නවත්වමු. මේ ඉන්නේ සරද. මේ පේෂලා. ඔයාව බලන්න ආසයි කිව්ව හින්ද එක්ක ගෙන ආව’’

‘‘අම්මෙ ශාන්තා ඔයා කියන බොරු. අපි එහෙම කතාවක් කිව්වද?’’ පේෂලා දෑස් ලොකු කර ගත්තා ය.

‘‘ඔයා පන්තියෙදි කිව්වෙ නැද්ද?’’

‘‘රවි මම නම් එහෙම කිව්වෙ නැහැ. ඒ උනාට ශාන්තා නම් හැමදම කියනව අපේ ගෙදර රවි කියල අහංකාර කෙනෙක් ඉන්නව. තියෙන ආඩම්බර කමට කා දිහාවත් බලන්නෙ නැහැ කියල’’

‘‘අනේ බොරු කතා කියන්න එපා සරා. රවි මේ ගොල්ල කියන්නෙ බොරු. පේෂලා මම එහෙම කතාවක් කිව්වද?’’

‘‘අද නම් කිව්වෙ නැහැ. කලින් දවසක නම් කිව්ව රවි හරි නපුරුයි කියල’’ පේෂලා සිනාසෙමින් කීවා ය. රවි මේ කතා නිහඬව අසා සිටියේ ය.

‘‘මේ ඔක්කොම මා ගැන කතා කරල තියෙන දේවල් දූන් මම දන්නව’’

‘‘අනේ නැහැ රවි. අපි තරහට කිවෙ නැහැ’’ ශාන්තා ගේ දෙනෙත් කඳුලෙන් පිරී තිබුනි.

‘‘මොනව හරි කියල තියෙනවා. ඒව මේ කතාවලින් ඔප්පු වෙනව’’

www.sinhalalibrary.com

''ශාන්තා මෙයාටත් ලෝ පොයින්ට්ස්වල උනුසුම වැදිල. හරියට පොයින්ට් එකටමයි කතාව''

''ලෝ පොයින්ට්ස් දන්නෙ මේ නෝනා''

''ආයි අප්ප. ඒ මොකද වෙනද මූණ දික් කරගෙන යන මිනිහ අද විතරක් මට නෝන කිව්වෙ?''

''උඹ බය වෙන්න එපා. රවි හැමදම නෝන කියයි'' පේෂලා සිනාසුනා ය.

පේෂලා ගේ කතාවට රවි පිළිතුරු දුන්නේ නැත. ඔවුන්ගෙන් වෙන් වීමට අදහස් කළ ඔහු කතාව කෙටි කළේ ය.

''මොනව උනත් මේ නෝනල තුන් දෙනා එක්ක කතා කරන්ට ලැබීම ගැන සන්තෝෂ වෙනව''

''ඇත්තම කියනවනම් අද අපි ආවෙ රවිට ස්තූති කරන්න''

''ඒ මොනවටද?'' රවි ඔවුන් දෙස බලා සිටියේ පුදුමයෙන් යුතුව ය.

''රවි නිසා අපි ඩිබේට් එක දිනුව. ඒකට ස්තූතියි'' පේෂලා කීවා ය.

''ඒක මගෙ දක්ෂකම නිසා නෙමෙ. ජය ලැබුවෙ දක්ෂ රාජ නීතිඥයෙකු ගෙ දුවක් හිටපු නිසා''

''ආයි අප්ප. ඒ මොකද?'' ශාන්තා සිනාසුනා ය.

''බලන්න ශාන්තා ඔයා බොරුනෙ අපිට කිව්වෙ. රවි ආඩම්බරයි කිව්වට ඔය අගේට කතා කරන්නෙ''

www.sinhalelibrary.com

''ඒ ඔයාල එක්ක. මාව දැක්කම මූණ මෙන්න මේ වගෙ'' ශාන්තා දත් විහිදු දක්වමින් සිනාසුනා ය.

''ඉතින් මට යන්න ඕනෑ''

''ළඟින් යනවනෙ. මොකද රවි හරියට පවුල් කාරයෙක් වගේ''

''පවුල් කාරයෙක් තමා. ආ.......... ඔගොල්ලන් ගෙ යාලුවෙක් එනවි. මම මෙතන කතා කර කර හිටියොත් තවත් දේවල් හිතාවි මම යන්නම්'' බස් නැවතුම් පළ දෙසට එන සංඛ දක්වමින් රවි මඟට බැස්සේ ශාන්තා ගේ හදවත රිදවමිනි. සැඟෙන කලකින් ලැබී ඒ ප්‍රිය ජනක අවස්ථාව විනාශ කරමින් පැමිණි සංඛ දෙස නො බැලූ ශාන්තා ඉවතට හැරුනා ය.

www.sinhalaebooks.com

# 3

රවි හා සුහදව කතා කළ දිනයේ පටන් ශාන්තා ගේ හදවතෙහි අමුතුම වෙනස් බවක් ඇති වුනි. උදේ වරුවට මෙන්ම සැඳෑ සමයට ඔහු දකින බලාපොරොත්තුවෙන් සිටියද එම ආශාව ඉටු කර ගැනීමට ඇයට අවස්ථාවක් ලැබුනේ නැත. අවධි වූ සිතුවිලි රවි වෙත යොමු වූයේ කාලයා ගේ ඇවෑමෙනි. ඒ හැම සිතුවිල්ලක්ම හදවතෙහි උපත ලැබ පරිසරය විසින් යටපත් වී ගියේ ය. ඉඳ හිට රවි දුටුවත් ඔහු ශාන්තා සමගින් කතා කළෙ නැත. එවන් අවස්ථාවක ඇගේ සිතේ ඇති වන්නේ දැඩි දුකකි. රවි තමා සමග කතා නො කළත් ඇනිවන පාඩුවක් නැති බව ඇය දනී. එහෙත් නිතර දෙවේලේ රවි දකින විට ඇගේ සිතෙහි ඇති වන්නේ සිහින් වේදනාවකි. තම හදවතට සිදු වී ඇත්තේ කුමක්දැයි ඇය තනිව සිතුවා ය. සංඛ කෙරෙහි ඇගේ සිතේ කිසියම් හැඟීමක් ඇති වන්නේ නැත. ඉඳ හිට පාසැලේදී මිතුරියන් සිහි කරන්නේද රවි ගැන ය.

''මම ඊයෙ දැක්ක රවි බස් එකෙන් බැහැල ලයිබ්රි පැත්තට යනව''

www.sinhalelibrary.com

‘‘උඹ කතා කළාද?’’

‘‘ම්හු. උඹ බය උනාද මම කතා කළයි කියල’’

‘‘මම මොටද බය වෙන්නෙ’’

‘‘අනේ බොරු නැතිව ඉඳපං ශාන්තා. ඒක නෙමේ උඹට හිතෙන්නෙ නැද්ද රවි එක්ක යාලු වෙන්න’’

‘‘ම්හූ’’ ශාන්තා පිළිතුරු දුන්නා ය.

‘‘හොඳයි උඹ පස්සෙ තරහ වෙන්න එපා’’

‘‘ඒ මොකටද?’’

‘‘මට හිතුණොත් රවි එක්ක යාලු වෙනව ටික දවසකට’’

පේෂලා ගේ එම කතාවෙන් පසු ශාන්තා ගේ හදවතේ ඇති වූයේ දැඩි දුකකි. එහෙත් කළ යුත්තේ කුමක්ද? කමක් නැහැ දෙයියනේ මගෙ හිතේ කොච්චර ආශාවල් තිබුනත් ඒවා ඉෂ්ට කර ගන්න කවද වත් හම්බ වෙන්නෙ නැහැ. අනික රවි අපේ ගෙදර වැඩ කරන කෙනෙක්. අම්මල තාත්තලට ආරංචි වුනොත් රවිට රස්සාවත් නැති වෙයි. පේෂලාට මෙන් තරුණයන් හා මිත්‍ර වීමට ශාන්තාට පුළුවන් කමක් නැත. ඇය හදවතේ වූ ආශාවන් පාලනය කර ගන්නේ දැඩි අයාසයකිනි.

මෑතක සිට හෙක්ටර් රවි සමග හොඳටම අමනාප වී සිටියේ ය. නීති පංතිය පිළිබඳ සිද්ධියෙන් පමණක් නොව රවි සිය යටතට ගැනීමට නො හැකි වීමේ අමනාපයද ඔහු ගේ සිත පෙළන්නට ඇත. රවි සිය ස්වාමියාට හැර අන් කිසිවෙකුට යටත් වූයේ නැත. ප්‍රින්සි, ප්‍රියන්තා හා හෙක්ටර් වැනි අය රවි වැනි දුප්පත් ලිපිකරුවෙකු ගෙන්

www.sinhalelibrary.com

ගෞරවය අපේක්ෂා කළේ ඇයි දැයි ශාන්තාට තේරුම් ගැනීමට අසීරු ය. රැකීරක්ෂා හිඟය නිසා ඇල්කඩුව යටතේ සුළු වැටුපකට සේවය කළත් රවි උසස් අධ්‍යාපනයන් ලැබුවෙකි. රවි ගේ මුහුණ නිතරම කල්පනා රැලි අතර අතරමං වී ඇත්තේ හේ සිය රැකියාවෙන් තෘප්තියක් නො ලැබූ හෙයිනි. ඇල්කඩුව හෙක්ටර්ට වඩා රවි කෙරෙහි විශ්වාසය තැබුවේ ය. සමහර දිනවල වතුවල පඩි ගෙවීමට විශාල මුදලක් දී රවි යවන්නේ එබැවිනි. ඔහු කිසි දිනක සතයකුදු වංචා කළේ නැත. හෙක්ටර්ට අවශ්‍ය වූයේ රවි පන්නා දමා ඔහුට හිතවත් ලිපිකරුවෙක් ගැනීමට ය.

''මේ සැරෙත් ඩැඩී පඩි දෙන්න යවල තියෙන්නෙ රවි මයි''

''ඩැඩීට ඒකට විශ්වාසයි හෙක්ට'' ප්‍රින්සි කීවා ය.

''හෙක්ට අයියට ඔවට යන්න වෙලාවක් නැහැනෙ අක්ක'' ශාන්තා කීවා ය.

''වෙලාවක් ඇද්ද නැද්ද කියල ඩැඩී කවදාවත් එයා ගෙන් ඇහුවද? ඩැඩීට කරන්න බැරි වෙච්ච වෙලාවක එයා නේද මේ පවුලෙ වැඩ කරන්න ඕනැ. නමුත් ඩැඩී එයාට රවිට තරම් වත් සලකන්නෙ නැහැ''

ප්‍රින්සි කතා කරන්නේ මවා ගත් දයාවකින් යුතුව බව ශාන්තා දනී. හෙක්ටර් මේ තත්ත්වයට පත් වූයේ ඔහු ගේ දක්ෂ කමට වඩා ප්‍රින්සි ගේ තියුණු බුද්ධිය නිසා ය. පාසැල් යුගයේදී මිත්‍ර වූ මොවුන් දෙදෙන විවාහ වූයේ ඇල්කඩුව ගේ වැඩි කැමැත්තකින් නොවේ. එතරම් ආදායමක් නො ලද නීතිඥවරයෙක් වූ ඔහු විවාහයෙන් පසු ඇල් කඩුව නීතිඥ සමාගමට බැඳීමෙන් පසු සැහෙන

ආදායමක් ලබා ගන්නේ ය. මුදල් ඉපයීමේ සූරයෙක් වූ ඔහු ඒවා පරිස්සමින් වියදම් කළේ ය. ඔහු ගේ මුදල් පාලනය කළේ ප්‍රින්සි විසිනි. කළුතර වාසය කරන දෙමාපියන් බැලීමට යාම නබා, ඔවුන්ට ජීවත් වීමට ප්‍රමාණවත් මුදලක් වත් හෙක්ටර් යැව්වේ නැත. හෙක්ටර් ප්‍රින්සි විවාහ කර ගැනීමෙන් පසු ඔහු ගේ පියා දින කීපයක් කොළඹ නිවසට පැමිණියේ ය. සරොම් බැනියම් අඳින ගැමියෙක් වූ ඔහු කොළඹ නිවසට පැමිණීම ගැන හෙක්ටර් සතුටු වූයේ නැත. එයට ප්‍රධාන හේතුව වූයේ පියාට කොළඹ නිවසේ අය සමග හැසිරීමට නො දත් කමයි. කාලයා ගේ ඇවෑමෙන් හෙක්ටර් ගේ පියා කොළඹ ආවේ නැත. එය ප්‍රින්සි ගේ සතුටට කරුණක් වූනි. ගත වූ සිව් අවුරුදු කාලය තුළ හෙක්ටර් සිය දෙමාපියන් සමග සබඳ කමක් පැවැත් වූයේ නැත. දෙමාපියන් බැලීමට කළුතර යාමට සිතුනත් ප්‍රින්සි කැඳවාගෙන එම ගමන යා නො හැකි හෙයින් ඔහු දවසින් දවස එම ගමන කල් දැම්මේ ය. සිය දෙමාපියන් අතැර තම නිවසේ ප්‍රධානියා වීමට සූදානම් වන හෙක්ටර් කෙරෙහි ශාන්තා කළකිරී සිටියා ය. ප්‍රින්සි කතා කරන්නේ සියළුම වගකීම් සැමියාට භාර කරමිනි.

''මේ ගෙදර ඇවිදින් වැටී වැළඳ ගෙන උදව් කරන හින්දයි මේ ඔක්කොම''

''දරුවො දෙමාපියන් ගාවට එන්නෙ නැතිව කා ගාවට යන්නද''

''නෑ මම්, ඩැඩී උනත් අපි නිතර මෙහෙ එනවට දන් කැමති නැතිව වාගෙ. ආදායම හොයන්න බලන්න යන්න බැරිව මිසක් එයාටත් කලුතර ඉඩකඩම් තියෙනව''

''ඕනෑ නැති කතා කතා කරන්න එපා ප්‍රින්සි. මේ ඔක්කොම කතා වලට මුල රවිව වත්තට පඩි ගන්න යැව්ව එකනෙ. රවිට වැඩි සැලකිල්ලක් කළා නෙමේ. වත්තට ඇරියෙ රවි අපේ සේවකයෙක් නිසයි''

''නෑ ඒක නෙමේ කාරනෙ. ඩැඩීට රවි විශ්වාසයි. නැතිනම් අහන්න තිබුණා.''

''මම දන්නෙ නැහැ. ඕව ඩැඩීව කියපල්ල'' ඇල්කඩුව මැතිනිය අමනාපයෙන් නිවසට වැදුනා ය. ''ප්‍රින්සි හරි කුරිරුයි. හෙක්ටර් කපටියි'' ඇය තනිව කියා ගන්නා ය.

වත්තේ පඩි දීමට ගිය රවි දින හතරක් ගතවන තෙක් වුවද නිවසට ආවේ නැත. රවි ගේ නො පැමිණීම පිළිබඳව වූ ප්‍රශ්නය ගැන නිවස තුළ නිතරම පාහේ කතා කළේ හෙක්ටර් විසිනි. රවි ගේ අතුරුදහන් වීම විශාල ගැටළුවකි. සැඳෑ සමයට කිට්ටු වෙද්දී වුවද රවි පැමිණියේ නැත. වත්තට ටෙලිෆෝන් පනිවුඩයක් දීමට ගත් උත්සාහයද අසාර්ථක වූයේ එම මාර්ගයේ පනිවුඩ හුව-මාරුව අඩාලව තිබූ හෙයිනි. රවි ගේ අතුරුදහන් වීමේ සිද්ධිය නිසා හෙක්ටර් හා ප්‍රින්සි අධික සතුටට පත්ව සිටියේ ය.

''ඩැඩී හිතාගෙන ඉන්නෙ රවි ආපහු එයි කියලද? ආපහු එයි සල්ලි නැතිව. මිනිහ ඒ තරමට කපටියි'' හෙක්ටර් කීවේ ය.

''ප්‍රශ්නය හරියට දන්නෙ නැතිව මොනවත් තීරණයක් ගන්න බැහැ''

''හෙක්ටර්ව ගිහින් බලල එන්න කියන්න විල්සන්''

''තරහ වෙන්න එපා මෑ. මම නම් ඔය ගමන යන්නෙ නැහැ. ඩැඩීට මට වඩා රවි ලොකු වෙලානෙ තියෙන්නෙ''

''මොනව හරි කරදරයක් නැතිව ඒ කොලුව ආවොත් ඇති. කිසි දේක අග මුල දන්නෙ නැතිව මොනවත් තීරණයක් ගන්න බැහැ. මම හෙට උදේන් යනව''

රවි හොරෙකැයි සිතීමට තරම් සාක්ෂි නැත. මුදල් ගනු දෙනු පිළිබඳව ඔහු ඒ තරම් විශ්වාස ය. බැරි වීමකින් වත් මුදල් ගෙන යන අතර ඔහුට බලාපොරොත්තු නොවූ හොර සතුරු කරදරයකට මුහුණ දෙන්ට සිදුවූවා නම්. මෙවැනි සිදු වීම් ඉතා සුලභ ය. නඩු වාර්තාවක තිබූ ආම්ස්ට්‍රෝන් මිනී මැරුම ශාන්තා තියවා ඇත. දින තුනක සිට රවි ගේ කාර්යාලය වසා ඇත. සිරිසේන දොර අසල සිටිනු දුටු ශාන්තා ඔහුට අතින් සංඥා කළේ ය.

''සිරිසේන රවි මහත්තය කවද්ද එනව කිව්වෙ. සිරිසේනට මොනව කියලද ගියේ?''

''ඊයෙ හැන්දෑවෙ නො වරදවාම එනව කියලයි ගියේ. බලන්නකො පුංචි නෝනා මොනවත් කරදරයක් වත් වෙලාද කියල මට බයයි''

ශාන්තා නිරුත්තරව ජනේලය අසලට වී සිටියා ය.

''අනේ සිරිසේන කෝල් එකක් බුක් කරල වත්තෙන් අහන්න''

''මම උදේ ඉඳන් ට්‍රයි කරනව ලයින් එක අවුටොප් ඕඩර්''

ශාන්තා නිහඬව ඇඳ වෙත ගොස් දූස් පියා ගත්තා ය. රවි අතින් මුදල් නැති වූවහොත් ඔහුට සිරගත වීම

www.sinhalalibrary.com

වලක්වනු බැරි ය. මද වේලාවකට පසු සිරිසේන ජනේලයට ගසනු පෙනුන නිසා ශාන්තා එහි ගියා ය.

''ඇයි සිරිසේන. මොකද?''

''රවි මහත්තය ආව''

''අනේ දෙයියනේ ඇති. කෝ කතා කරන්න මෙතෙනට''

''ආ...... මේ එන්නෙ?''

''මොකද රවි පරක්කු උනේ?''

''මගදි පොඩි කරදරයක් උනා''

''මොනව උනත් කමක් නැහැ ඔයා ආවනෙ. ඇත්තමයි දැනුයි හිතේ බය ගියේ'' ඇය සැනසුම් සුසුමක් හෙලුවා ය.

''මිස්ට ඇල්කඩුව තවම දන්නෙ නැහැනේ මම ආ බව. හෙක්ටර් ගෙදර ගිනී තියන්න ඇති''

''හෙක්ටර් අයියගෙ හැටි කියන්න ඕනැද රවි. ගිහින් ඉක්මනට තාත්තට කතා කරන්න'' ශාන්තා පහත් හඬින් කීවා ය. ඔහු ගිය පසු ඈ සාලයට ගියා ය. ඒ වන විටද හෙක්ටර් රවි පිළිබඳව කරමින් සිටි කතාව නතර කර තිබුනේ නැත.

''මිනිහ ගෙදර ආවොත් එන්නෙ හොඳ කතාවක් බිල්ඩ් කරගෙන. එක්කො මග රැක ඉඳල හොරු ආයුද පෙන්නල සල්ලි කොල්ල කෑව කියයි. නැත්නම් වත්තෙදි සල්ලි නැතිඋනා කියයි''

www.sinhalelibrary.com

''හෙක්ට කරුණා කරල මගෙ ඔලුවට කරදර කරන්න එපා. එහෙම දෙයක් උනොත් නිතීඥයො හැටියට ඒ ප්‍රශ්නය හොයන්න අමාරු වෙන එකක් නැහැ''

සාලයේ වූ ටෙලිෆෝනය නාද වුනි. ප්‍රින්සි එම ඇමතුම ගෙන ඇල්කඩූව අත රිසීවරය තැබුවා ය.

''සර් මම රවි''

''ආ..... හලෝ රවි ආවද. දැනුයි අයියෙ මගෙ හිතට නිදහසක් දැනුනෙ. එහෙනම් ටිකක් රෙස්ට ගන්න''

''පොඩි කරදරයක් උනා සර්. ඒකයි පරක්කු උනේ''

''තේ එකක් බීල ඒවෙක අරගෙන කතා කරමු'' ඇල්කඩුව ටෙලිෆෝනය තබා සැහැල්ලු සිතින් යුතුව අසුනේ දිගා වුනි.

''හෙක්ට රවි ඇවිදින්''

''ඩැඩී සල්ලි වලට මොනව වෙලාද?''

''ඔය කෙහෙල්මල් සල්ලි කතාව ටික වෙලාවකට අමතක කරන්න හෙක්ට. කරදරයක් නැතිව මිනිහ ආවනෙ''

''බලන්න මමී, ඩැඩී ගෙ කතාව'' ප්‍රින්සි අමනාපයෙන් මට ගේ මුහුණ දෙස බැලුවා ය.

''දුව රවිගෙන් මට ඔයිට වඩා සල්ලි හම්බ කරන්න පුළුවන්''

නිවස පුරා සැහෙන නිහඬ බවක් ඇති වුනි. හෙක්ටර් සාලයෙන් පිටත පැමිණ රවි සිටින කාමරය දෙසට ගියේ ය. ඒ වන විට රවි මුහුණ සෝදමින් සිටියේ ය. දීර්ඝ ගමනක

යෙදීම නිසා වෙහෙසව සිටි රවි සෑහෙන වේලාවක් නාන කාමරයේ ගත කළේ ය. සිරිසේන දුම් දමන උණු තේ කෝප්පයක් රැගෙන එනු දුටු හෙක්ටර් ඔහු දෙස රවා බැලුවේ ය. 'මේක මට මෙච්චර සලකන්නෙ නැහැ' හෙක්ටර්ට සිතුනි.

''ගිහින් රවි මහත්තයට එන්න කියපං'' හෙක්ටර් රවි ගේ අත් පුටුවේ අසුන් ගෙන දුම් වැටියක් දල්වා ගත්තේ ය. මුහුණ සෝද පැමිණි රවි හෙක්ටර් දෙස බලා මඳ සිනාවක් පා තේ කෝප්පය අතට ගත්තේ ය.

''රවි තමුසෙලාට ගමනක් ගියාම වෙලාවට එන්න බැරි මොකද?''

''වාහන වලින් ගමන් බිමන් ගියාම ඔහොම තමයි''

''පයින් ගියත් දවස් තුනකින් ඔය ගමන ගිහින් එන්න පුළුවන්. ඒක නෙමෙ ගෙනිච්ච සල්ලි වලට මොනවද කළේ?'' හෙක්ටර් රවි දෙස බලා සිටියේ ය.

ඔහු තමා පිළිබඳව වැරදි වැටහීමක් ඇති කරගෙන ඇතැයි රවිට සිතුනි. මුදල් පිළිබඳව ඇසූ ප්‍රශ්නයට රවි පිළිතුරු දුන්නේ නැත.

''පඩි දෙන්න අරන් ගිය සල්ලි වලට මොනවද කළේ?''

''කාගෙ සල්ලි වලටද?''

''වත්තට අරන් ගිය සල්ලි වලට''

''මම මිස්ට හෙක්ටර්ගෙන් සල්ලි අරන් ගියේ නැහැ''

''රවි ගානට වැඩියි. අංකල් එක්ක දන ජාති මා එක්ක දන්න එපා. කියනව සල්ලි වලට මොනවද උනේ?''

''සල්ලි නැති වුනා''

''එහෙමද?'' හෙක්ටර් ගේ මුහුණේ ජයග්‍රාහී සිනාවක් ඇඳී ගියේ රටේ ආන්දෝලනයක් ඇති කළ නඩුවකින් ජය ග්‍රහණය ලද දිනක මෙනි. ඔහු වහාම නිවස වෙත ගියේ ය. ඒ වන විට ඇල්කඩුව තේ පානය කරමින් සිටියේ ය.

''ඩැඩී මම කිව්ව විදිහට ඔක්කොම සිද්ද වෙලා''

''හොඳයි මම ඒක බලා ගන්නම්''

''බලන්න ප්‍රින්සි අරූ කියන කතාව. සල්ලි නැති උනාලු''

''ඔන්න බලන්න ඩැඩී මෙහෙක්ට කිව්ව විදිහට ඔක්කොම සිද්ද වෙච්ච හැටි'' ඇගේ මුහුණේ ජයග්‍රාහී සිනාවක් විය.

''ඔන්න එනව. ඩැඩී කතා කරන්න. මම තව ටිකකින් පොලිසියට කතා කරන්නම්''

මේ කතාව ශ්‍රවනය වූ විගස ශාන්තා ගේ සිතෙහි ඇති වූයේ දැඩි වේදනාවකි. රවි ප්‍රමාද වන්ට ඇත්තේ මුදල් නැති වීම නිසා විය හැක. මෙම අවස්ථාවේ පියා ගේ සමාව නො ලැබුන හොත් රවි මැදි වන්නේ මහත් ගැටළුවකට ය. පරිසරයේ නිහඬ බවක් ඇති වුනි. මැද සාලය උසාවියක සිරි ගත්තේ ය. චෝදිතයා බැගය අතැතිව පැමිණියේ ය. 'මෙච්චර කපටි කමක් කරලත් මේක ගෙ මූහුණෙ වෙනසක් නැති හැටි' ප්‍රින්සි සිතුවා ය. බිඳිය නො හැකි සාක්ෂි ඇතිව පැමිනිල්ලේ ඉදිරිපත් කළ දක්ෂ නීතිවේදියෙක් වූ හෙක්ටර් පෙරමුණෙහි අසුනකට වී සිටියේ ය. රවි වෙනුවෙන් දුක් වූ එකියක පමණක් දෙරට හේත්තු වී කඳුළු පිරි දෙනෙතින් එදෙස බලා සිටියා ය.

www.sinhalelibrary.com

''ඔහොම ඉඳගන්න රවි''

රවි ඇල්කඩුව අසල අසුන් ගත්තේ ය.

''වැඩ තහනම් කරල ඉන්න තුන්දෙනා පඩි ඉල්ලන්න ඇවිදින් හරි ජංජාලයක් උනා'' රවි සිනාසෙමින් පිරි වැය සටහන් ඉදිරිපත් කළේ ය. සෑවොම බලාපොරොත්තුව සිටියේ උත්සන්න අවස්ථාව ළඟාවන තෙක් ය. හෙක්ටර් ටෙලිෆෝනය අසලට වී සිටියේ පොලිසියට පනිවුඩය යැවීම සඳහා ය. ඇල්කඩුව පයිප්පය උරමින් පොත් පත් පරීක්ෂා කර අවසන් කළේ ය.

''අයියෙ මම හරි බයෙන් හිටියා පරක්කු වෙනකොට මොනව හරි කරදරයක් උනාවද්ද කියල''

''පඩි දීල එද්දි ජීප් එක පෙරළඩ දුන්නා. අනර මග ගලවාගෙ හොල්ලන්න බැරුව ගියා. එළි වෙනකල් සීතලේ ගැහි ගැහී ජීප් එකට වෙලා ඉඳල පහුවද ගැරේජ් එකකට හෙනැල්ල දැම්ම''

හෙක්ටර් ගේ හා ප්‍රින්සි ගේ මුහුණු ඇඹුල් වී යනු රවිට පෙනුනි. ප්‍රියන්තා සිය කාමරයට වැදුනා ය. මඳ වේලාවකට පසු ප්‍රින්සි හා හෙක්ටර් කිසිවෙකුට නො දන්වා නිවසින් පිට වී ගියහ. සෑහෙන වේලාවක් ඇල්කඩුව හා කතා කරමින් සිටි රවි නවාතැන බලා ගියේ ය.

www.sinhalelibrary.com

# 4

වත්තේ පඩි දීම සම්බන්ධව ඇති වූ කතාව නිසා නො මනාපයට පත් හෙක්ටර් හා ප්‍රින්සි සති දෙක තුනකින් ඇල්කඩුව මහතා ගේ නිවසට ගියේ නැත. හෙක්ටර් අමනාප වී ඇති බව තේරුම් ගත් ඇල්කඩුව දෙහිවල පිහිටි හෙක්ටර් ගේ නිවසට ගියේය. සියළුම ප්‍රශ්න අතැර දමා යළි නිවසට එන මෙන් හෙක්ටර්ගෙන් ඉල්ලා සිටියද රවි සිටින තෙක් ඒමට නො හැකි බව ඔහු අවධාරණයෙන් දන්වා සිටියේ ය.

''ඒ හාදයව හැමදම ගෙදර තියා ගන්නෙ නැහැ පුතා. අනික රවි හැමදම මෙහෙ ඉන්න ඇවිදිනුත් නැහැ. ළඟ දිම අස්වෙලා යාවි''

''නැහැ ඩැඩී ඒ මිනිහ අස් කලොත් මිසක මම ඔය ගෙදරට එන්නෙ නැහැ. බැරිවෙලා වත් රවි ඉන්න වෙලා වක ඇවිදින් කතාවක පැටලුනොත් මොනවයින් මොනව වෙයිද දන්නෙ නැහැ''

''ඔව ඩැඩී එදු හෙක්ටර් ඉවසුව මිසක් වෙන කෙනෙක් ඉවසන්නෙ නැහැ. මොනව හරි ගෝරියකට පටලැවෙයි කියල හිතුන නින්දයි මම එයාව එක්කගෙන ආවෙ''

www.sinhalalibrary.com

''ගෝරියක් කරගන්න තරම් හෙක්ටර් මෝඩ මිනිහෙක් නෙමේ දුව. මට ඕනෑ නම් හෙට රවී අස්කරන්න පුළුවන්''

''අන්න හොඳයි ඩැඩී'' හෙක්ටර් ගේ මුහුණ ප්‍රීතියෙන් පිබිදී ගියේ ය.

''ඒ උනත් හෙක්ටර් දන්නවනෙ ඉස්සර වාගෙ සේවකයින්ව එකපාර අස්කරන්න බැරි බව'' ඇල්කඩුව හෙක්ටර්ට කරුණු පහදදී ඔවුන් කැඳවාගෙන ආපසු බම්බලපිටියේ නිවසට ගියේ ය.

* * *

රවී ගේ තොරතුරු මවගෙන් දැනගත් මොහොතේ ශාන්තා ගේ හදවතේ ඇති වූයේ දැඩි අනුකම්පාවකි. ඔහු දකින හැම මොහොතකම මේ කතා පුවත ඇය පීඩාවට පත් කරවයි. රවී ගේ මේ අසරණ කම ප්‍රින්සි ගේ හා හෙක්ටර් ගේ සතුටට කරුණක් වීම ගැන ඇය දුක් වූවා ය. එහෙත් රවී කිසි දිනෙක ඔවුන් ගේ විරෝධතාවයනට බිය වූයේ නැත. ඔහු ගේ මුහුණේ සිනාවක් දකින්නට ලැබෙන්නේ කලාතුරකිනි. ඔහු ගේ සිතට සතුටක් නො ලැබෙන්නේ දහසක් ප්‍රශ්න වලට මැදි වී සිටීම නිසා විය හැක.

රවී හා කතා කිරීමට ශාන්තා බලවත් සතුටකින් සිටියද ඒ සඳහා ඇයට අවස්ථාවක් ලැබුණේ නැත. පොතක් පතක් අවශ්‍ය වූවහොත් සිරිසේන අත රවීට කුන්ඩු කැබැල්ලක් යවා ගෙන්වා ගනියි. ඉඳ හිට ඇය තම අවශ්‍යතාවයන් විස්තර කරමින් රවීට කෙටි ලිපි යැව්වද රවී එම ලිපි වලට පිළිතුරු සැපයුවේ නැත. වරෙක ඔහු කෙරෙහි ඇගේ සිතේ කෝපයක් උපදියි. එක් දිනක්

සිරිසේන අත ලිපියක් එවා තිබෙනු දුටු ශාන්තා ගේ සිතෙහි ඇති වූයේ සතුට සම්මිශ්‍රිත බියකි. ලිපිය කියවීමට තරම් ආරක්ෂිත ස්ථානයක් ඇයට එම නිවසේ තිබුණේ නැත. තම රහස් සොයන අඳුරු ඡායා නිවස තුළ සැඟවී ඇතැයි ඇයට සිතෙයි. පාලිකා කාමරය තුළට පිවිසෙනු දුටු ශාන්තා ලිපිය ළයට තද කර ගත්තා ය. සැලෙන හදවතින් කාමරයට වැදී දොර වසා ගත් ඇ ලිපිය විවෘත කළා ය. ඔහු තමාට ආදරය කරන බව මෙතෙක් රහසක්ව තබා ගත්තේ ඇයි? ලිපිය මඳ දුරක් කියවාගෙන යද්දී ඇගේ සිතෙහි ඇති වූයේ දැඩි කෝපයකි. රවි සංඛ ගේ ලිපිය තමාට ගෙනැවිත් දුන්නේ ඇයි? හදවතේ පැතිර ගිය කෝපය නිසා ඇගේ දෙනෙතේ කඳුළු නැඟුනි. ලිපිය කැබලි වලට ඉරා වැසිකිළියේ ජලනල ඔස්සේ පාකර හැර කාමරයට පැමිණ රවිට ලිපියක් ලිව්වා ය.

'රවි!

ඔයා පාරෙ යන එකා එකා ගෙ ලියුම් අදින වැඩේ භාර ගත්තෙ කවද ඉඳලද? සංඛ මට ලියුම් දෙන්න හැදුවෙ අද ඊයෙ නෙමේ හුඟක් කල් ඉඳලයි. එයා ගෙ හැටි දන්නව නම් රවි කවදාවත් මේ වගෙ වැඩ කරන්නෙ නැහැ. හැබැයි ආයෙහෙම මේ වගෙ ලියුම ගෙනාවොත් මම හොඳ වැඩක් කරනව. තාත්ත ආව හැටියෙ මේ ලියුම මම දෙනව. එම ලියුමට පිළිතුරක් දුන්නම ඕනෑ.'

ශාන්තා සිරිසේනට කතා කොට ඔහු අත රවිට ලිපිය යැව්වා ය. එම ලිපියට රවිගෙන් පිළිතුරක් ලැබෙන තෙක් ඇය ජනේලය අසලින් ඉවත් වූයේ නැත. සිරිසේන එනු දුටු ඇගේ සිතේ සතුටක් ඇති වුනි. ඔහු ගෙනා ලිපිය අතට ගත් ඇ දොර වසා දමා ලිපිය බැලුවා ය.

www.sinhalalibrary.com

'සංබ ගේ ලිපිය ඔබ වෙත ගෙන ඒමෙන් නො දැනුවත්ව සිදු වූ වරදට අමනාප වෙන්න එපා. මා මේ මොහොත වන තෙක් සිතා සිටියේ ඔබේ මිතුරා සංබ බවයි. ඔයා කියන්නෙ බොරු. මාව රවට්ටන්න හැදුවට සංබ නෙද ඔයා ගෙ යාලුවා. තාත්තට කියල මාව බය කරන්න හිතුව් මදි. ඩැඩිට නෙමෙ මමිට දුන්නත් මම බය නැහැ'

ශාන්තා රවි ගේ ලිපිය බැලුවේ මුවග රැඳුන සිනා වෙන් යුතුව ය. 'මේක නම් හරි පුදුමාකාර කොල්ලෙක්' ඇය එම මොහොතේම රවිට ලිපියක් ලියා සිරිසේන අත ඔහුට යැව්වා ය.

ලිපිය ගෙන ගොස් රවි ගේ මේසය මත තැබූ සිරිසේන පුටුවක ඉඳ ගත්තේ ය.

''මට නම් මේ වැඩේ කරන්න බැහැ සර්. ලියුම් ඇදිල්ලෙත් සීමාවක් තියෙන්න ඕනැ''

''ඒව මට කියල වැඩක් නැහැ. අර ජනේල ගාවට වෙලා කොණ්ඩෙ පීරන පිං. ඇමට කියනව''

''සර්ට හොඳක් වෙනව නම් මම එළිවෙන කල් උනත් එහාට මෙහාට යන්නම්. හැබැයි මගෙ බඩට පාර වැදුනොත් කුලී වැඩක් වත් හොයා දෙන්න ඕනැ''

''මේ වගෙ වැඩ වලින් අපි දෙන්නටම යන්න වෙයි නමා. කතාව නෙමේ, ටක් ගාල ලොන්ඩරියට දුවල එනව''

සිරිසේන නො පෙනී ගිය පසු රවි ශාන්තා ගේ ලිපිය විවෘත කළේ ය.

'රවි

ගනංකාරය එවපු ලිපිය ලැබුණා. හනේ හනේ. මා ගැන හිතල තියෙන දේවල්. මීට පස්සෙ හෙම සංඛ ගැන මොනව හරි කිව්වොත් තරහම තරහයි. ගොර පූස වාගෙ ඉඳගෙන අපේ ගෙදර අය පාලනය කළාට මා එක්ක ඔවට එන්න එපා. හෙක්ටර් අයියටයි, ප්‍රින්සි අක්කටයි, පොඩි අක්කටයි පාට් දැම්මට මම ඒවට බය නැහැ......'

සිරිසේන ඒමට ගිය කාලය තුළ ශාන්තා ගේ ලිපිය කී වරක් කිවා දැයි රවිට මතක නැත. එය කියවන හැම මොහොතකම ඕහුගේ හදවතට නැවුම් සිතුවිලි පිවිසෙයි.

''අනේ අනේ හොඳට හිටපු අපේ සර්ටත් වෙච්ච දේ''

''මොනාවද වෙලා තියෙන්නෙ?''

''ඉස්සර අගේට රජා වාගෙ හිටපු මිනිහ අද නද කල්පනාවෙ. සර් ඔය ලියුමෙ මා ගැන ලියල නැද්ද?''

''තට වහගනින් මිනිහො. ඔව තමා ගැස්සෙන්නෙ''

''හොඳයි සර්...... ඔක්කොම වැඩ නවත්තන්න වෙයි. අන්න කූනකටුව ආවා'' සිරිසේන හෙක්ටර් ගේ රථය දක්වමින් කීවේ ය.

රවි එදින නවාතැන බලා ගියේ කැළඹුන සිතින් යුතුව ය. අමුතුම සතුටක් හදවතේ හිර වී ඇතැයි ඔහුට සිතෙයි. මෙ වෙනස ගාවින්ට හෙළි කිරීමට රවි බිය වූයේ ඔහු බැන වදිතැයි යන සැකයෙනි. මට මොනවද ගාවින්ට කියන්න තියෙන්නෙ. ශාන්තා මට ලියුමක් දුන්නා. මම ඒකට උත්තරයක් යැව්ව. කතාව එච්චරයි. රවි ඇඳට වැදී නරයේ දෑස් පියා ගත්තද ඔහු වෙත නින්ද ළඟා වූයේ නැත. ඇගේ පියකරු මුහුණ, සිහින් දෙතොල් පෙති, ඔහුට සිහි වුනි.

www.sinhalalibrary.com

ගාවින් වෘත්තීය සමිති ව්‍යාපාරය සම්බන්ධ කටයුත්තක යෙදෙමින් සිටියි. රවි වෙත නින්ද ලබා වූයේ බොහෝ වේලාවක් ගතවූ පසුව ය. පසු දින පිබිදුන ඔහුට ශාන්තා දකිමේ ආශාවක් ඇති වුනි. ඔහු කඩිනමින් සූදනම් වී ගාවින්ට වත් නො දන්වා නවාතැනින් පිටවී ගියේ ය. පාසැල් යන අතර මගදී හෝ බස් නැවතුම් පලේදී ඇය මුණ ගැසීමට ඔහු අදහස් කළේ ය. මඳ දුරක් යන විට තමා ශාන්තා හමු වීමට යන්නේ ඇයි දැයි ඔහු කල්පනා කළේ ය. තම ජීවිතය හා බැඳි ප්‍රශ්න ඔහුට සිහිපත් වුනි. ශාන්තාට බලාපොරොත්තු ඇතිවන පරිදි නො හැසිරීමට අධිෂ්ඨාන කර ගත් රවි භෝජන ශාලාවකට පිවිස තේ පානය කර සුපුරුදු වේලාවට කාර්යාලයට ගියේ ය. පටු මාවතට හැරෙත්ම ශාන්තා දුටු නිසා ඔහු තැති ගත්තේ ය. ඇය පාසැල් යන වේලාව මග හැර තමා මුණ ගැසීමේ බලාපොරොත්තුවෙන් පැමිණ ඇතැයි ඔහුට සිතුණි.

''ගුඩ් මෝනිං'' ශාන්තා සිනාසුනා ය.

''සුබ උදෑසනක් වේවා!''

''ඔව් ඉතින් පරිවර්තකයනෙ. කෝච්චර හරි මිනිස්-සුන්ව පල් කරන්නම්යි හදන්නෙ නේද?''

''මම කෙනෙකුට කරදරයක් හිංසාවක් කළා කියල අහල තියෙනවද?'' රවි සිනාසුනේ ය.

''මට ඔය හිනාව තමයි ඉවසන්න බැරි. මහ ලොකු වැඩක් කළා වාගෙ''

''මොකද අප්පෙ මේ උදෙන්ම බෙලි කටු මල්ල හොලවන්නෙ''

''මම අද ආවෙ ඔය කණ මිරිකල යන්න''

''හා කණ මිරිකන්න'' රවී ශාන්තාට හිස පහත් කළේ ය.

''අනේ නිකා ඉන්න රවී කවරුවත් එයි. පිස්සු නටනව''

''මම මේ ඔලුව පාත් කළේ වරදක් කළා නම් ඒක මට පහදල දීල දඬුවම ගන්නයි. නැතිව කාටවත් බයේ මම ඔලුව පාත් කරල නැහැ''

''මම දන්නවනෙ හැටි. මාත් කැමති නැහැ ඔයා ඔලුව පාත් කරනවට''

''සෙල්ලම් නෙමෙ වරද නො කිව්වොත් නෝනා කියල බලන්නෙ නැහැ කණ කඩනවා''

''මීට පස්සෙ හෙම කාගෙවත් ලියුම් ගෙනාවොත් මාත් දෙනව හොඳ පාරක්''

''හා......හා ඒකයි වරද. හොඳයි නෝනා දැන් ඉතින් යන්න. මේලහට තාත්ත ඒනව ඇති යන්න''

''එලව ගන්න නෙ හදන්නෙ. ඔන්න මම ගියා'' ශාන්තා සිනාසෙමින් ඉදිරියට ගියා ය.

''සංචි මහත්තයට මොනවත් කියන්න ඕනැද?''

''ඔන්න එක සැරයක් කිව්ව. ඔවට එන්න එපා''

''හා හා යන්න'' රවී සිනාසෙමින් යන්ට ගියේ ය.

කාර්යාලයට ගියද ඔහුට එදින සිත එකඟ කර වැඩ කිරීමට පුළුවන් වූයේ නැත. වරෙක ඔහු ගේ සිතට විශාල සතුටක් දැනෙයි. තවත් වරෙක ඔහු අසුනට වී කල්පනාවේ

නිමග්නව සිටියි. විවෘතව ඇති ජනේලයෙන් ඔහු වරින් වර ගේට්ටුව දෙස බලයි. මඳ වේලාවකට පසු සිරිසේන රවිට කතා කළේ ය.

''ඕන් සර් හරි. ආවා''

''අයියෙ සිරිසේන!'' රවි කතා කළේ සිනාසෙමිනි.

''හරි සර්. ඔක්කොම වැඩ ගානට''

''තමුසෙත් ගානට ඉන්නව''

''එහෙමද. එහෙනම් ශාන්තා නෝන ගෙ පාර්සලේ ආපහු දෙනව'' සිරිසේන සිනාසෙමින් ආපහු යාමට සූදානම් වුනි.

''දෙනව මෙහාට'' රවි ඉදිරියට පැන සිරිසේන අත තිබූ පාර්සලය ගත්තේ ය.

''ආයි අප්ප අඹ! ගේනව වීගහට පිහියක්''

සිරිසේන පිහියක් ගෙනා පසු රවි අඹ කපන්ට පටන් ගත්තේ ය. මඳ වේලාවකට පසු ශාන්තා ගෙවුයනේ ඒ මේ අත ගැවසෙනු රවිට පෙනුනි.

''මොනවද කන්නෙ?'' ශාන්තා ජනේලය අසලට ආවා ය.

''අඹ කෑල්ලක් දෙන්නද?'' රවි වට පිට බලමින් ඇසුවේ ය.

''හා දෙන්න'' ශාන්තා අත පෑවා ය.

''ඔතන ඉන්න එපා යන්න. මම සිරිසේන අත එවන්නම්''

''ගෙදර කව්රුවත් නැහැ ළමයො''

‘‘බොරු කියන්න එපා ඔක්කොම හිටිය’’

‘‘ඔක්කොම නිදි’’ ශාන්තා ජනේලය අසලට ආවා ය.

‘‘විගහට මෙන්න මේ ටික අරගෙන යන්න. අඹ දුන්නට ස්තුතියි. ඒ උනාට මීට පස්සෙ මොනවත් ගේන්න එපා’’

‘‘ෂහ්. ලස්සන කෙල්ලෙකු ගෙ පිංතූරයක් බිත්තියෙ ගහල තියෙන්නෙ’’

‘‘ඇයි හොඳ නැද්ද?’’

‘‘අපොයි මොකද නරක’’

‘‘මගෙ නෙමෙයි. මේ සිරිසේන ගෙනැල්ල ගහල’’

‘‘බොරු පුංචි නෝනා. රවි මහත්තය ගෙ’’

‘‘මම දන්නව සිරිසේන. මේ ගොල්ල අහරේනෙ ඉගෙන ගන්නෙ’’

‘‘මම එහෙනම් අරක කියනව. සං..........’’

‘‘එන්න එපා කතාවට’’ ශාන්තා ඉවතට හැරුණා ය.

‘‘අනේ ශාන්තා නෝන කරුණා කරල යන්න. කව්රුවත් ආවොත් හොඳ නැහැනෙ’’

‘‘මම ඔයාට කියල තියෙනවනෙ මට නෝන කැලි කියන්න එපා කියල...... මේ ඒක නෙමේ මට ආටිකල් එකක් ලියා ගන්න ඕනෑ’’

‘‘සිරිසේන අනේ එවන්න. දැන් ඉතින් යන්න’’

ශාන්තා ගිය පසු සිරිසේන රවි දෙස බලා සිනා සුනේ ය.

www.sinhalalibrary.com

රවී හා ශාන්තා අතර සම්බන්ධ භාවයක් ගොඩ නැගුණේ කාලයා ගේ ඇවෑමෙනි. පෙර මෙන් නොව ඔහු ශාන්තා අතර මගදී මුණ ගැසුනොත් කතා බහ කරයි. මෑතක සිට ශාන්තා එවන ලිපිද දීර්ඝ බවින් යුතු ය. ලිපි ලියන රචනා ශෛලියේද වෙනස් බවක් ඇත. බැරි වීමකින්වත් මෙම ලිපියක් නිවසේ අය අතට පත් වුව හොත් උද්ගත වන්නේ කෙබඳු තත්ත්වයක්ද? ඔහුට එක වරම ඇල්කඩුව මහතා සිහි වුනි. ඔහු තමා කෙරෙහි තබා ඇති විශ්වාසය විනාශ වුව හොත්. එම යතිය තුළ රවි කල්පනා කළේ කළයුත්තේ කුමක්ද යන්න පිළිබඳ ව ය. සුබනම්‍ය ලෙස අවසන් වන පරිදි කිසි දිනෙක මේ ප්‍රශ්නය විසඳිමට පුළුවන් කමක් නැත. හිසට වද දෙන මේ ප්‍රශ්නය මුලිනුපුටා දැමීමට ඔහු අදහස් කළේ සතුටකින් නොවේ. ඔහු ශාන්තාට ලිපියක් ලිව්වේ මේ ගැටළුව ගැන අවසන් තිරණයකට එළඹීමෙන් පසුව ය.

‘ශාන්තා!

පසු ගිය දින එවූ ලිපියෙන් ඔයා මට චෝදනා කර තිබුණා මම ඔයාට ලියුම් එවන්නෙ නැහැ කියල. ඇත්තටම කියන්න ශාන්තා ඔයා මගෙන් ලිපියක් බලාපොරොත්තුව සිටින්නෙ ඇයි? ගත වූ කෙටි කාලය තුළ අප අතර විශාල වශයෙන් ලිපි හුවමාරු වුණා. අපි තව ඉදිරියටත් හරියට පොඩි ළමයි වාගෙ අවබෝධයක් නැතිව කටයුතු කළොත් කණගාටු දායක ප්‍රශ්න වලට මුහුණ දෙන්න වෙනව නේද? මම ජීවිතයේ ප්‍රශ්න වලින් පෙළෙහයට පත්වුන මිනිහෙක්. තැනි කරදර ඇතිකර ගන්න මම කැමති නැහැ. ඒ නිසා අපි මේ ලියුම් ලිවීම නතර කරමු’

www.sinhalalibrary.com

රවි ශාන්තාට ලිපිය යවා වැඩි වේලාවක් යාමට ප්‍රථම එයට පිළිතුරක් ලැබුණි. ඇය පිළිතුරු ලිපියක් ලියා ඇත්තේ දිවා ආහාරයටත් ප්‍රථමයෙන් බව රවිට හැඟුණි.

'රවි

ඔබේ ලිපිය කියවීමෙන් මගේ සිතේ ඇති වූයේ ලොකු වේදනාවක්. චූටි චූටි තුන්ඩු කැබලි වලින් පටන් අරගෙන අප ඉගෙනීම ගැන විතරක් නෙමෙ, ඊට වඩා ලොකු ප්‍රශ්න ගැන සාකච්ඡා කළා. ඇත්තමයි මාත් කැමති නැහැ ලියුම් ලියන්න. ලිපියකින් කියන්න බැරි දහසක් දේ මගේ හිතේ ඊස් වෙලා තියෙනව. එනිසා සතියකට වරක් දෙකක් විවෙකිව කොහේදි හරි හමු වී කතා කරමු.

රවි, මා මේ නිවසේ ගත කරන අප්‍රිය ජනක ජීවිතය ඔබට වැටහෙන්නේ නැහැ. බාහිරව අපේ ජීවිත දෙස බලන කෙනෙක් එය විසිතුරුව දකිනවා ඇති. සැඳෑ සමයට අප නිවසට එන හැම දෙනාම කතා කරන්නේ එකිනෙකා ගේ ඕපදූප පමණයි. ඉඳ හිට නිවසේ පවත්වන තේරුමක් නැති උත්සව මට දූන් තිත්ත වෙලා. මේ එකාකාරී ලෝකයෙන් මා මුදා ගත් ඔබට ස්තුති කරන්නෙ කොහොමද කියල මට තේරෙන්නෙ නැහැ. රවි, ම විසින් ගොඩ නගා ගත් ඇත්ත ලෝකයෙන් මා පිටමං කරන්න එපා. ඒ සතුට මට අහිමි කරන්න එපා. අද නො වරදවාම ස්වුවට ත්‍රීසී එක ගාවදි හමු වන්න'

ශාන්තා ගේ ලිපිය ඕනෑකමින් කිය වූ රවි අසුනේ ඇල වූනේ දුක් වේදනාවකින් යුතුව ය. ශාන්තා පවසන බස රවිට අවබෝධ වූවත් එවැනි දෙයකට දිරි දීමට ඔහු කැමති වූයේ නැත. තමාට පැමිණිය නො හැකි බව

ශාන්තාට දැන්වීමට ක්‍රමයක් ඔහුට තිබුණේ නැත. ශාන්තා පාට ගවුමකින් සැරසී නිවසින් පිටව යනු ඔහු බලා සිටියේ කළයුතු දෙයක් නැති හෙයිනි.

ඇය හමු වීමට ගොස් පැමිණිය නොහැකි බව දන්වා සිටීමට ක්‍රමයක් ඔහුට තිබුණේ නැත. ඔර්ලෝසුවේ සටහන් වන හැම තත්පරයක්ම ඔහු සිත ඇති කළේ දැඩි වේදනාවකි. මුහුණ සෝදා ගත් රවි කාර්යාලය වසා මගට බැස්සේ ය. ශාන්තා දන්වා සිටි වේලාව වන තෙක් 'බ්‍රිතාන්‍ය පුස්තකාලයට වී සිටි රවි ස්වුවට ක්‍රිසි සමාගම දෙසට ගියේ ය. ගෘහ විද්‍යා පන්තිය අවසන් වී යන සිසුවියන් දෙස රවි ඕනෑකමින් බලා සිටියේ ය. ශාන්තා මාවතට පිවිසෙනු දුටු රවි ඇය දෙසට ගියේ ය.

''මම හිතුවේ ඔයා මට බොරුවක් කිව්වා කියල''

''කරුණාකර ඒ අදහස ඉල්ලා අස්කර ගන්න''

''හොඳයි. මම ඒ අදහස ඉල්ලා අස්කර ගන්නා. ඇයි මට හදිස්සියෙ එන්න කිව්වෙ?''

''මට ඔයා එක්ක කතා කරන්න ඕනෑ'' ඇය බිම බලා පහත් හඩින් කීවා ය. ඔවුනතර දැඩි නිහඬ බවක් ඇති වුනි.

''රවි අපි අර මුහුද දිහාට ගිහින් ටිකක් කතා කරමු''

රවි නිහඬව ශාන්තා හා විද්‍යාල භූමිය අසලින් මුහුදු වෙරළ දෙසට ගමන් කළහ. බම්බලපිටිය දුම්රියපළේ නතර කර තිබූ දුම්රියක් කොළඹ දෙසට දුව යනු රවිට පෙනෙයි. සැඳෑ අහස පැහැදිලි ය. නිල් තැටියක් මෙන් දිස්වන අහස හා ක්ෂිතිජය රේඛාවකින් වෙන් කළාක් මෙන්

www.sinhalalibrary.com

දිස් වෙයි. මුහුද සිප හමන සුළඟට අසු වූ ශාන්තා ගේ කෙස් කළඹ ඒ මේ අත විසිරෙයි. ශාන්තා රේල් පීල්ල මතට නැඟ දෑත් සම බරව තබා මඳ දුරක් ගමන් කළා ය.

''තුවාල කර ගන්න හදනවද?'' රවි ශාන්තා ගේ අත ගෙන දුම්රිය මගින් ඉවත් වී ගල් තලයක් මත ඉඳ ගත්තේ ය.

''මෙහෙ බලන්න ශාන්තා. අපි මොනවද මේ කරන්නෙ?''

''ඔව් රවි අපි මේ විදහට කෙලින් කතා කරමු''

''ඔයා කැමතිද මම ඔයා ගෙ ගෙදරින් යනවට?''

''ඔව් මම කැමතියි'' ශාන්තා එක එල්ලේ රවි දෙස බලමින් කීවා ය.

''මාව වරදවා හිතන්න එපා රවි. ඔයා අපේ ගෙදරින් යනවට කැමති මම ඔයා ගෙ දියුණුව බලාගෙන ඉන්න හින්දයි. ඒ කොහෙ ගියත් මාව අමතක කරන්න එපා''

''ඔව් ශාන්තා. ඔයාව මම අමතක කරන්නෙ නැහැ. හොඳ හිතවත් කෙනෙක් විදිහට මා ඔයාව සිහි කරනවා''

''ඒ දේ විතරද?'' ඇය කතා කළේ බිඳුනු ස්වරයෙනි. ඇගේ දෙනෙත් කඳුලෙන් පිරී ඇත. මඳ වේලාවක් ඉවතට හැරී සිට ඇ එකවරම නැඟී සිටියා ය. රවි එකවරම ඇගේ අතින් අල්වා ගත්තේ ය.

''මට යන්න දෙන්න රවි. මම හැමදම දුකෙන් ඉන්න දෙන්න ඔයා කැමති නේද? මාව අල්ලන්න එපා. මට යන්න දෙන්න''

''මම කියන දේ ටිකක් අහන්න''

''මොනවද රවි අහන්නෙ? ඔයා කියන්න ලෑස්ති වෙන දේවල් ඔක්කොම අවබෝධ කරගෙන තමයි මම මේ තීරණය ගන්නෙ''

''ශාන්තා ඔයා මගෙ තත්ත්වය දන දනත් ඇයි මෙ වගෙ තීරණයක් ගන්න හදන්නෙ? මම ඔයාට අකමැතියි කියල බොරුවක් කියන්න මම කැමති නැහැ. ඒත්.....''

''ඒත් කියන්නෙ මට සලකන්න බැරි වෙයි කියන එකද?''

''ඒකත් එකක්. මට විශ්වාස එන්න ඔයා ගෙ තාත්ත ගෙ හිත රිදවන්න මට බැහැ''

''ඩැඩී ගෙ ප්‍රශ්නය අමතක කරන්න''

''එහෙම කළත් මට බැහැ ඔයාට දුකක් දෙන්න''

''රවි මට ඕනැ ඔයා මාව පිළි ගැනීම විතරයි. දුක හෝ සැප විඳීම අයිති මටයි. මම තීරණයක් ගත්තෙ ඒව කල්පනා කරලයි''

''මේ බලන්න ළමයො. ඔයා මගෙ තත්වය දන්නව නේද. ගමේ ඉඩකඩම් මට නැහැ. මම පාරෙ බැහැල ගිහා කැවත් මස්සිනා ළඟට යන්නෙ නැහැ. මාව ඔයාට ගැලපෙන්නෙ නැහැ''

''කවදද රවිට අයිය ගාවට යන්න කිව්වෙ. ඔයයි මමයි ගැලපෙනවද නැද්ද කියන එක අපි දෙන්න තීරණය කරමු''

www.sinhalelibrary.com

රවි ශාන්තා දෙස එක එල්ලේ මඳ වෙලාවක් බලා සිටියේ ය. ඔහු ගේ මුහුණේ සිනාවක් නැගුනේ ශාන්තා ගේ කතා බස් ගැන ය.

''දැන් අපි යමු'' ඔහු සෙමින් කතා කර ඇගේ අතින් අල්වා ගත්තේ ය.

''රවි''

''ඇයි ළමයො''

''මම ඩැඩීට කියන්නද?''

''අනේ දෙයියනේ මගෙන් පාරක් කන්නෙ නැතිව යමු. එනව මෙතන. ඔයා ගෙ හිතේ මේව සෙල්ලම කියල. මොනවද මෙයින් අන්තිමට වෙන්නෙ''

''අන්තිමට වෙන්නෙ මෙන්න මෙහෙමයි'' ශාන්තා රවි ගෙ දෑත් තරයේ මිරිකා ගත්තා ය.

www.sinhalaelibrary.com

# 5

කොතෙක් සිත පාලනය කර ගත්තද අවංකව රවිට ශාන්තා මග හැර සිටීමට පුළුවන් වූයේ නැත. ඉදිරි අනාගතයේදී උද්ගත විය හැකි අනිවාර්ය ගැටළු ගැන සිහිවන විට ඔහු ගේ සිතට වේදනාවක් ඇති වෙයි. එහෙත් ශාන්තා හා කතා කරන අවස්ථා වලදී ඔහුට මේ කිසිවක් සිහි වන්නේ නැත. නිවසේදී ඔවුනොවුන් නො හඳුනන පුද්ගලයන් මෙන් හැසිරීමට ඔවුහු කථිකා කර ගත්හ. එහෙත් නිවසේ කිසිවෙක් නැති අවස්ථා වලදී ශාන්තා මේ පොරොන්දුව බිඳ දමා රවි ගේ කාමරයට ගියා ය. මෙ වැනි අවස්ථා වලදී සිරිසේන ඔවුන් දෙදෙනාට කතා බහ කිරීමට ඉඩ දී පිට වී යයි. වැඩි වශයෙන් ජනයා නො ගැවසෙන පාළු මාවත් වල ඔවුහු හමු වූහ. දැන් එක දිනකට වත් ඔවුනොවුන් හමු නොවී සිටීමට අසීරු වී ඇත. මෑතක සිට රවි නවාතැනට යන්නේ වෙනදට වඩා ප්‍රමාද විය. ඔහුට නවාතැනේ මිතුරන් ඇසුරු කිරීමට ලැබෙන්නේ කලාතුරකිනි. රවි ශාන්තා පිළිබඳව වූ ප්‍රශ්නය නම් හොඳම මිත්‍රයන් වන ගාමින්, උපේන්ද්‍ර වැනි අයට වත් හෙළි කළේ නැත. හොඳටම අඳුර වැටී එන රවිට ඔවුන් සිනාසුනහ.

www.sinhalalibrary.com

''සැපයක් යැයි කකුලුව දිය කෙලිමයෙ'' ගාවින් උපේන්ද්‍ර දෙස බලා සිනාසුනේ රවිට උපහාසයක් වන පරිද්දෙනි.

''අපට මොකද බං පුළුවන් හින්දනෙ කරන්නෙ. කපා ගත්තොත් කර තියා ගන්න එපායැ''

''නෑ උපේ අපිට කමක් නැහැ. කවද හරි එලියෙ නටන්ට එපායැ''

රවි කමිසය ගලවමින් මිතුරන් දෙදෙනා ගේ කතාවට සවන් දුන්නේ මැඩගත් සිනාවෙන් යුතුව ය.

''ඊයෙ මම පබ් එකට ගිහින් හවස ගියා ආට් ගැලරියෙ එක්සිබිෂන් එකක් බලන්න''

''උඹ ඊයෙද බැලුවෙ. මම පාස්ට් ඩේ එකේ බලල ග්‍රෙගරි රෝඩ් එකෙන් බොරැල්ලට පයින් ගියා''

නමා පෙර දිනක ශාන්තා හා මෙම මගින් ගමන් කරද්දී මිතුරන් දකින්ට ඇත.

''වෙන ගමන් ගියේ නැද්ද?'' රවි සිනාසෙමින් දෙදෙනා මධ්‍යයේ ඉඳ ගත්තේ ය.

''මහන්සි නැතැ උදේ ඉඳලා වෙහෙසිලා එන මිනිහනේ නාගෙන වරෙන්'' ගාවින් සිනාසුනේ ය.

''මම එහෙන් නා ගෙන ආව''

''ඔව් ඉතින් එහෙන් නාගත්තම ඇඟට හොඳා. නේද උපේ''

''නැතුව නැතුව''

''මචං මේ ඉන්සිඩන්ට එක උඹලට කියන්න කියලයි හිටියෙ. ඒකට වෙලාවක් තිබුනෙ නැහැ''

www.sinhalaelibrary.com

''මොකක්ද ඉන්සිඩන්ට් එක?''

''මගෙයි ශාන්තාගෙයි ඇෆෙයාර් එක''

''අපිට කාගෙ වත් කෙහෙල්මල් ඕනැක් නැහැ. දන ගත්තත් ඇති වැඩකුත් නැහැ'' ගාවින් කතා කළේ තරමෙහනි.

''මචං උඹල දෙන්න මට සමා වෙයල්ල. උපේ මිස්ටර් ඇල්කඩුව ගෙ දූව එක්ක මෙහෙම සම්බන්ධයක් පවත් ගන්න මගෙ බලාපොරොත්තුවක් තිබුනෙ නැහැ. මම මේ ගැන උඹල එක්ක කතා කරන්නයි හිටියෙ. ඒත් උඹල දෙන්න බනී කියල හිතුන හින්ද..........''

''රවි අපි අහවල් එකකටද කාගෙ වත් පෞද්ගලික කටයුතු වලට ඇඟිලි ගහන්නෙ. යමක හොඳ නරක තෝරා බේරා ගන්න උඹ පොඩි ළමයෙක් නෙමේ. අනික උඹට ඒ ගැන සම්පූර්ණ නිදහස තියෙනව''

''මට සමා වෙයන් මචං උඹල දෙන්නට මේ ගැන නො කිව්වෙ බනී කියලයි'' රවි පහත් හඬින් කීවේ ය.

''අපි මොනවටද බනින්නෙ'' ගාවින් කතා කළේ තරමක අසතුටකින් යුතුව ය.

''එහෙම කියන්න එපා ගාවින්. ඌ කරන්නෙ වරදක් විත්තිය දන්නව ඇතිනෙ''

''රවි ගෙ කිසි වරදක් නැහැ. තමුන්ට ගැලපෙන ගෑනි හොයා ගන්නා. රවිට තමුන් කැමති තීරණ ගන්න පුළුවන්. ඒ විදිහට හැම ප්‍රශ්නයකටම මූණ දෙන්න රවි සූදානම් ඇති''

''ගාවින් මම ප්‍රශ්න වලට මුහුණ දෙන්න බය නැහැ. ඒත්..........''

‘‘ඒත් උඹ ඒ ප්‍රශ්න වලට මුහුණ දෙන්න ශක්තිමත් නැහැ. එහෙම නේද?’’

‘‘ඔව් ගාවින්’’

‘‘ඔව් ගාවින්. යකෝ උඹට පුලුවන්ද උන් එක්ක පැහෙන්න?’’

‘‘මම දන්නව ගාවින්. ඒත් ඉතින් මම මොනව කරන්නද? මේක මගෙ ඕනකමින් සිද්ද වෙච්ච දෙයක් නෙමෙ’’

‘‘එහෙනම් උඹ කියන්නෙ අනේ මට ආදරේ කරන්න කියල ඒ ළමය උඹේ ඇඟේ එල්ලුනා කියන එකද? නිකං බොරු කියන්න එපා රවි’’

‘‘උෟට බනින්න එපා බං. ගාවින් ඔහෙ අපිත් පුළුවන් විදිහට සපෝට් එකක් දෙමු. උඹ පංති සටන ගැන කතා කරන මිනිහ. ඒ කෙල්ල අපේ පැත්තට ගන්න එක ගැන විරුද්ධ වෙන්න ඕනැ නැහැ’’

‘‘මගෙ ඇති තරහක් නැහැ උපේ. ඔක්කොම රවිය ගෙ හොර වැඩ. නමුත් කවද හරි රවිත් ඒ පැත්තට යාවි’’

‘‘මම ඒ ජාතියෙ මිනිහෙක් කියල උඹ හිතන්න එපා. මට මේ සම්බන්ධෙ නතර කරන්න උනත් පුළුවන් ගාවින්. ඒ උනත්..........’’

‘‘ඒ උනත් උඹ ආදරෙයි. ඔව් ඉතින් මොනව උනත් අපි උඹට සපෝට් එක හොඳි පුළුවනෑ’’ ගාවින් ගෙ කතා වෙන් පසු රවි ගේ මුවගට සිනාවක් නැගුනි.

‘‘දැන් ඉතින් මොනවද කල්පනා කරල තියෙන්නෙ’’

www.sinhalelibrary.com

''පිස්සුද ගාවින් තවම මොනවත් නැහැ. නිකමට අපි යාලු උනා තමා. ඒත් මට තවම හරියට රස්සාවක් වත් නැහැ. ඉතින් කොහොමද ඔය කෙහෙල්මල් ගැන කතා කරන්නෙ''

''ඔව් රවි. මොනව හරි ජොබ් එකකට පැනපං. ඔය විදිහට කොයි වෙලේ උඹව රස්සාවෙන් අස් කරයිද දන්නෙ නැහැ''

එදින බොහෝ වෙලාවක් මිතුරන් කතා කරමින් සිටියේ රවි ගේ ප්‍රශ්නය පිළිබඳව ය.

පසු දින රවි හිමිදිරියෙන් කාර්යාලයට ගියේ නීති පරික්ෂාව කිට්ටු වී ඇති නිසා කළ යුතු කාර්යයන් එක් රැස් වී තිබූ හෙයිනි. ඔහු එම සතියේ ශාන්තාව හමු වීමට ගියේ නැත. හෙක්ටර් නීති පංතියේ අවසන් අවුරුද්දට දේශන පැවැත් වීමට පැමිණීම නිසා ඉඳ හිට ඔහු රවි සමගින් කතා කළේ ය. පංති තුනේම පාඩම් මාලා සිංහලට පරිවර්තනය කළ යුතු වූ නිසා රවි ගේ නිදහස බොහෝදුරට සීමා වී තිබුනි. සමහර සතිවල කලින් දේශනය පවත්වා ඊ ළඟ සතියේ පාඩම් මාලා දීම කෙරෙයි. මෑතක සිට දේශන පැවැත් වීමට පැමිණි හෙක්ටර් පංතියේ ක්‍රියා පරිපාටිය පිළිබඳව දැන සිටියේ නැත.

''රවි මෙන්න මේක ට්‍රාන්ස්ලේට් කරල මට අද බලන්න ඕනැ''

''මිස්ටර් හෙක්ටර් අද නම් බැහැ. ඕනෑ නම් අනිද්දා දෙන්නම්''

''ඒ මොකද?''

''ටිකක් කල්පනා කරන්න කෝ. මමත් මනුස්සයෙක් නේද? මේ වෙලාවට දීල හැන්දෑවට ගන්න පුළුවන්ද?''

''තමුසෙට අනික් අය ගෙ වැඩ නම් වෙලාවට කරන්න පුළුවන්. නමුත් මම කියන දෙයක් බැහැ''

''කලින් ගෙනාව නම් කරන්න තිබුණා. දැන් නම් මට බැහැ''

''බැහැ. එහෙනම් මම ඩැඩීට කියන්නද?''

''ඩැඩීට තියා කාට කිව්වත් මම කරන්නෙ නැහැ''

හෙක්ටර් කාමරයෙන් පිට වී ගියේ තරහෙන් යුතුව ය.

පත්‍ර කාර්යාලයේ රැකියාව පිළිබඳ පත්වීම් ලිපිය ලද දිනයේ රවි ගේ සිතේ ඇති වූයේ විශාල සතුටකි. මෙම පුවත ශාන්තා ගේ සතුටට හේතු වනු ඇත. පසු දින කාර්යාලයට ගිය රවි වෙනදට වඩා කඩිනමින් සිය කාර්යයන්හි නිරත වූයේ රැකියාවෙන් ඉවත් වීමට ප්‍රථම සියළු වැඩ අවසන් කර තබා යාමට ය.

උසාවියට යාමට ප්‍රථම ඇල්කඩුව රවි සිටින කාර්යාලයට ආවේ ය.

''මොකද අද උදෙන්ම ඇවිදින් වැඩ?''

''තනියම කරන්න බැරි තරම් වැඩ සර්''

''ඔව් මම දන්නව රවි. ඒක නෙමෙ මොකද ඊයෙ හෙක්ටර් ඇවිදින් කිව්වෙ?''

''උදේ ලෙටර් එක ගෙනැල්ල දීල හවස ට්‍රාන්ස්ලේට් කරල ඉල්ලනව. වැඩ ගොඩ ගැහිල. මම කිව්ව කරන්න බැහැ කියල''

www.sinhalalibrary.com

''එයා මේ වැඩ කිසිම දෙයක් දන්නෙ නැහැ. මිනිහ කියන කතා ගණන් ගන්න එපා''

''නෑ සර් මගෙ තරහක් නැහැ. ඒ උනාට එයාට මිනිහෙකු ගෙ හිත නො රිදෙන විදිහට කතා කරල වැඩ ගන්න තරම දක්ෂ කමක් නැහැ''

''ඔන්න ඔච අල්ලල දනව. ලබන සුමානෙ වැකේෂන් වලින් පස්සෙ පටන් ගන්න කොට නිව් සෙටප් එකක් හදන්න ඕනැ''

''ලබන සැරේ මට ඉන්න වෙන්න නැහැ සර්''

''ඒ මොකද මෙහෙන් අස් වෙන්නද?'' ඇල්කඩුව රවි දෙස පුදුමයෙන් බලා සිටියේ ය.

''සර් මට පත්තරේ රස්සාවක් හම්බ උනා''

''රවිට හොඳක් වෙනව නම් මම හරි සන්තෝසයි. ඒ උනාට රවි ගියාම මට තමා පාඩු'' ඇල්කඩුව මඳ වේලාවක් නිහඬව සිට කීවේ ය.

''අද හෙටම අස් වෙනවද?''

''ෆස්ට් වල වැඩ භාර ගන්න ඕනැ''

''රවි නැති වුනොත් මේ වැඩ පිළිවෙල ඔක්කොම කඩා කප්පල් වෙයි'' ඇල්කඩුව ගමන මඳ වේලාවකට නවතා පුටුවක ඉඳ ගත්තේ ය.

''කෙනෙක් හොයා ගන්න කල් රවිට හැන්දෑවට ඇවිදින් මේ වැඩ ටික කරන්න බැරිද?''

''ඔව් සර්. කව්රු හරි හොයා ගන්න කල් වැඩ ඇරිල ඇවිදින් මම කරන්නම්''

www.sinhalelibrary.com

''බය වෙන්න එපා. මම රවි ගෙ පඩිය දෙනව''

''මම එන්නම් සර්''

''නවාතැන් වලට වියදම් කරන්න ඕනැ නැහැ. වැඩ ඇරිල ඇවිදින් නාගෙන කාල බිල වැඩ කරන්න. ඔපිස් එකේ බෙඩ් රූම් එකේ රවිට නවතින්න පුළුවනිනෙ. එහෙනම් මම යනව''

ඇල්කඩුව ගිය පසු රවි ගේ සිතට දැඩි වේදනාවක් පිවිසුනි. ඔහු තමා කෙරෙහි තබා ඇති විශ්වාසය කිසියම් දිනෙක බිඳී යනවා ඇතැයි යන්න ඔහු අමතක කිරීමට උත්සාහ කළේ ය. තමා මෙම රැකියාවෙන් අස්වන බව ඇසූ වේලේ පටන් සිරිසේන සිටියේ දුකින් යුතුව ය. මේ සම්බන්ධව කිසිවෙකුට නො දන්වන ලෙස රවි කියා තිබූ බැවින් සිරිසේන එය කිසිවෙකුට හෙළි කළේ නැත. දිවා සමයේ හෙක්ටර් උසාවියේ වැඩ අවසන් වී යන අතර රවි හමුවීමට ආවේ ය.

''කොහොමද රවි මගෙ වැඩේ හරිද?''

''බලන්න හරිද කියල'' රවි හෙක්ටර් අත පරිවර්තනය තබමින් කීවෙ ය.

''රවි කළා නම් හරිනෙ''

''ඊයෙ මට වැඩ වැඩි වුන හින්දයි බැහැයි කිව්වෙ''

''ඒකට මොකද. රවිටනෙ ඔක්කොම කරන්න තියෙන්නෙ. ඒක නෙමේ කොහොමද මගෙ ලෝ පොයින්ට්ස්?''

''නියමයි'' රවි සිනාසුනේ ය.

සැහෙන කලකට පසු හෙක්ටර් ප්‍රීතියෙන් සිටී. රවි ඔහු සමග මඳ වේලාවක් කතා කරමින් සිටියේ ය.

''හැමදම මෙතෙන්ට වෙලා කුරුටු ගගා ඉන්න එපා. එක්කො ලෝ එග්සැම් එක කරන්න. නැති නම් මෙතනින් අස් වෙලා ස්ථිර රස්සාවක් හොයා ගන්න''

''මම ළඟදිම මෙහෙන් අස් වෙලා යනව''

''ඒක හොඳා''

හෙක්ටර් රවි හා කතා කරමින් සිට නිවස දෙසට ගියේ ය. දිවා ආහාරයට පැමිණි ඇල්කඩුව ආපසු උසාවියට ගියේ නැත. තේ පානයට පිබිදුන ඔහු මුහුණ සෝද ගෙන සාලයට වී සිටියේ ය.

''ඩැඩි අද හොඳ මූඩ් එකක නැහැ'' හෙක්ටර් පත්‍රය පසෙක තබමින් කීවේ ය.

''දවල්ට නිදා ගත්තාම ඇඟට පිට නැහැ''

''ඩැඩී ලෝ ක්ලාස් එකේ ෆයිනල් ලෙක්චර්ස් එකට එන්න ඕනැ''

''ඔව් මම ඒකට එනවා''

''ස්පීච් එක රවිට ඉක්මනට දෙන්න. නැත්නම් ට්‍රාන්ස් ලේට් කරන්න වෙලාවක් නැහැ. මම ඊයෙ බැන්නත් මිනිහ මගෙ එක හදල තිබුනා''

''ඇත්තද..........'' ඇල්කඩුව කතා කළේ පහත් හඬිනි.

''රවි පස්ට වල ඉඳල මෙහෙන් අස් වෙනව''

''මොනව!'' හෙක්ටර් ඇල්කඩුව දෙස බලා සිටියේය.

www.sinhalaelibrary.com

''හෙක්ට රවි ඉන්නකල් ඒ මිනිහා එක්ක ගෝරි ඇල්ලුව''

''කා අතිනුත් වැරදි වෙනව ඩැඩි. කොච්චර බැන ගත්තත් ඒ වෙලාවට විතරයි. මගේ හිතේ කා එක්ක වත් තරහක් නැහැ''

''රවි ගියාම මට නමයි පාඩු''

ශාන්තාට පියා ගේ වචනය කණ වැකුණේ ප්‍රින්සි ගේ දරුවා වඩාගෙන සාලයට එද්දී ය. 'රවි යනව..........ඈයි ඒ' ඇගේ ඇඟපත පණ නැතිව ගියා සේය. දරුවා බිම නැඹූ ඈ තරයේ සැටිය අල්ලා ගත්තා ය.

''ඔය කොලුව වත්තෙ පඩි නඩි බේරුව, පංතියෙ සල්ලි ගණන් බේරුව, එක තඹ සත පහක් වංචා කළේ නැහැ''

''ඔව් ඩැඩි මිනිහ හොඳ හාදය තමා. ඒ උනාට හරි අහංකාරය''

''මිනිහෙකු ගෙ පෞද්ගලිකත්වය අපි හොයන්ට ඕනැ නැහැ හෙක්ට. අපිට අවශ්‍ය සේවය විතරයි'' ඇල්කඩුව කීවේ ය.

''මම නම් රවි යනවට කැමතියි. රවි හිටියම නිතරම හෙක්ටර් එක්ක පැටලෙනව'' ප්‍රින්සි කිවා ය.

''මම නම් අතින් පයින් කොයි ජාතියෙන් ආවත් බය නැහැ. හොරු මිනීමරුවො එක්ක වැඩ කරන මට රවි ඒ තරම් ලොකු මිනිහෙක් නෙමෙ'' හෙක්ටර් අහංකාර කමින් මුහුණ හද ගත්තේ ය.

''ඔයා බොක්ස කෙනෙක් හින්දද?'' ප්‍රින්සි සිනාසුනා ය.

''එහෙනම් රවි නවමන් වයි. ඩබලිව්. සී. එකට සෙල්ලම් කරන්නෙ'' ශාන්තා කිවේ ඉවසනු බැරිව ය.

''නංගි කොහොමද ඒ විත්තිය දන්නෙ?''

''ඒක මම විතරක් නෙමෙි කව්රුත් දන්නව''

''මොනව උනත් රවි යනවට මම කැමතියි'' හෙක්ටර් කිවේ ය.

''ඩැඩී රවි අස් උනාම ඒ වැඩ කරන්නෙ කොහොමද?''

''නෑ දුව. රවි මෙහෙන් අස් වෙලා ගියාට කව්රු හරි හොයා ගන්න කල් අපිට උදව් කරාවි''

''ඒ මොටද ඩැඩී. මම රවිට වඩා දක්ෂ කෙනෙක් හොයල දෙන්නම්''

''මම ඒකට පත්තරේ ඇඩ් එකක් දාල හොයා ගන්නම්. ඒත් රවි වාගෙ දක්ෂයෙක් හොයා ගන්න එක තමා ලොකුම අමාරුව''

රාත්‍රි ආහාරයට පිවිසි තාත්තා ඉක්මනින් කෑම මේසයෙන් පිට වූයේ හදවතට පිවිසි තේරුම් ගත නො හැකි සිතුවිලි ඇය වේදනාවට පත් කළ හෙයිනි. රවි නිවස හැර යන්නේ ය යන පුවත සිහි වන විට ඇති වන වේදනාව සමනය කර ගත්තේ ඕහු ගේ අනාගතය ගැන සිහි කරමිනි.

එදින රැයෙහි බොහෝ වේලාවක් යන තෙක් ඇය වෙත නින්ද ළඟා වූයේ නැත.

www.sinhalebuary.com

# 6

පත්‍ර කාර්යාලයේ සේවයට යාමෙන් පසුව රවි ගේ නිදහස බොහෝ දුරට සීමා වී ගියේ ය. එහි වැඩ අවසන් වීමෙන් පසුව රවි ඇල්කඩුව මහතා ගේ නිවසට එන්නේ හොඳටම අඳුර වැටුන පසුව ය. කාර්යාලයේ දිය නල යෙන් නා සිරිසේන දෙන උණු තේ කෝප්පය පානය කිරීමෙන් වැඩ ආරම්භ කරයි. වැඩ කරමින් ඔහු ඉදහිට ඇල්කඩුව මහතා ගේ මැදුර දෙස බලයි. ශාන්තා ඇගේ කාමරයේ ජනේලය අසලට වී කාර්යාලය දෙස බලා සිටිනු ඔහුට පෙනෙයි. රවිට පෙර මෙන් ශාන්තා හමු වී කතා කිරීමට දැන් අවකාශ නැත. ප්‍රියන්ත හා අජිත් කුඩා ගෙවුයනට වී කතා කරමින් සිටිනු දකින රවිට ශාන්තා හමු වීමේ ආශාව තව තවත් වැඩි වෙයි. එසේ වුවද ශාන්තා දකින ක්‍රමයක් ඔහුට නැත.

උදේ සිට සැඳෑ සමය වන තෙක් නො නවත්වා සේවය කිරීම නිසා ඇති වූ වෙහෙස මග හරවා ගැනීමට රවි පුටුවේ ඇල වී දෑස් පියා ගත්තේ ය. දෑස් පියා ගෙන සිටින ඔහුට සිය දුක්බර ජීවිතය සිහි වුනි. සොයුරිය දැකීමට යාමට ආශාවක් තිබුණත් ඔහු එම ආශාව සිතින්

www.sinhalaelibrary.com

මැඩ පවත්වා ගත්තේ ය. ශාන්තා හමු වීමෙන් පසුව හදවතට පිවිසි නවාලෝකය මුළු ජීවිතයම නැවුම් බවින් පිරිමට සමත් වුනි. එම ප්‍රීතිය භුක්ති විඳීමට ලැබේ දෝ යන්න ඔහුට සැකයකි. 'මම දුප්පත් නමා. ඒ උනාට ඔයා මාව අත අරින්නෙ නැහැ නේද? කමක් නැහැ මාව අත හැරියත් මම තරහ නැහැ, මා වාගෙ අසරණ මිනිහෙක් එක්ක ජීවත් වෙන්න ඔයාට බැහැ' රවී තනියම පවසා ගත්තේ ය. ඔහු ගේ දෙනෙත් සුසිනිඳු දැතකින් වැසී ගියේ ය.

''කව්ද කියන්න පුළුවන් ද?''

''ඔහු බැහැ'' රවි ශාන්තා ගේ දෑතින් අල්වා ගෙනම සිනාසුනේ ය.

''ඒත් මේ සුවඳ මට හුරුයි'' රවි ශාන්තා ගේ අත්ල සිප ගත්තේ ය.

''මොටද මෙහෙ ආවෙ?''

''ඇයි එන්න තහනම්ද?''

''අපොයි නැහැ. මේ ගෙවල් දොරවල් බඩුමුට්ටු ඔයාට අයිති නෙ''

''මට කිසි දෙයක් අයිති නැහැ. මට අයිති මෙච්චරයි'' ශාන්තා රවි ගේ අතින් අල්වා ගත්තා ය.

''දැන් ඉතින් යන්න. කව්රුවත් ආවොත් හොඳ නැහැ නෙ''

''ගෙදර කව්රුවත් නැහැ. පාලියි මායි විතරයි ඉන්නෙ. පාලි හිටියට කමක් නැහැ. එයා දන්නව''

''මොනවද දන්නෙ?''

www.sinhalaelibrary.com

''අපි දෙන්න ගැන ඉල්ලෙසල්ලම කිව්වෙ පාලිට'' ශාන්තා සිනාසුනා ය.

''ඔයාට නම් තිනහ. නංගිට මොටද කිව්වෙ. බැරි වෙලාවත් එයා අන්කට කිව්වොත්?''

''පාලි මට විශ්වාසයි. කවදවත් කියන්නෙ නැහැ''

''කෝ දූන්?''

''පොන්ඩ් එක ගාව ඉන්නව. කව්රු හරි එනව නම් එයා මට සිග්නල් එකක් දෙයි''

''හරි කෙල්ලෙක්. එයා අපි ගැන දන්න බවක් මට ඇහෙව්වෙ නැහැ නෙ''

''ඔයා බයද රවි?''

''මම මොනවටද බය වෙන්නෙ. මා නිසා ඔයාට කරදරයක් වෙයි කියලයි බය''

''මොන විදිහෙ කරදරයක් ආවත් ඔයා නිසා මට උහුලන්න පුළුවන්''

''මම අතින් දෙන්න තරම් පෝසත් නැහැ''

''පෝසත්කම නිතරම ජීවත් වීමට සම්බන්ධ කරන්න බැහැ නේද රවි. පෝසත්කම ළඟ නියම ජීවිතයක් පවතින්නෙ කලාතුරකින්''

''අහා. දූන් කෙල්ල හොඳ හොඳ බර වචන ඉගෙන ගෙන''

''ඔයා නිතරම පෝසත්කම ගැන විතරයි කතා කරන්නෙ. ඒ මිනිස්සු ගාව ජීවත්වෙන්න අවශ්‍ය සතුට,

www.sinhalaelibrary.com

සමාදනය නැහැ රවි. හරියට නරක්වෙච්ච බිත්තරයක් බත් පංගුවට දමා ගත්ත අය වාගෙ කන්නත් බැරිව, අහක දමන්නත් හිත නැතිව ඉන්නව''

''ඒත් ශාන්තා මිනිහෙකුට ජීවත්වීමට හොඳ ආර්ථික පදනමක් අවශ්‍ය වෙනව නේද?''

''කවුද නැහැයි කිව්වෙ. උත්සාහවන්තයෙකුට ඒ පදනම ඇති කර ගන්න අමාරු නැහැ''

''කතා කරන කොට නම් ඔය විදිහට කියන්න පුළුවන්, තර්ක කරන්න පුළුවන්. ඒත් අපි වාගෙ අයට දියුණු වීමේ ඉඩකඩ මේ සමාජයම වහල දල. අපිට අනා-ගතයක් ලැබෙන්න නම් ඇලඩින් ගේ පුදුම පහන වාගෙ මැජික් පහනක් හම්බ වෙන්න ඕනෑ. එහෙම නැති නම් ඇමතිවරයෙකු ගෙ පුතෙක් වෙන්න ඕනැ''

ශාන්තා මඳ වේලාවක් නිහඬව සිටියා ය.

''මේ තත්ත්වයෙන් අපට කවද වත් මිදෙන්න බැහැ. අවංකව විවුර්තව කියනව නම් මා එක්ක ආවොත් ඔයාට කවද හරි දුක් විඳින්න වෙනව''

''කමක් නැහැ''

''ඊට වඩා නරකද සංඛ හරි ඔයා ගෙ මස්සිනා බින්දු එක්ක හරි යනව නම්''

''රවි ඔයා මට මඟුල් ජෝඩු කරන්න එන්න එපා. වටින් ගොඩින් එන්නෙ නැතිව කෙලින්ම කිව්ව නම් ඉවරයි නෙ ඔයා කැමති නැහැ කියල'' ශාන්තා කතා කළේ කෝපයෙන් යුතුව ය. ඇගේ දෙනෙතේ කඳුළු රැස් වී තිබෙනු රවි දුටුවේ ය.

www.sinhalalibrary.com

''මම ඔයාට ආදරේ නැතෙයි කියල කිව්වෙ නැහැ. මම සතුටුයි ඔයා සැපවත් ජීවිතයක් ගත කරනව බලන්න''

''ඔයා මට කවදාවත් මෙහෙම කතා කරල නැහැ. ඔය රස්සාවට ගියාට පස්සෙයි මෙව කියන්නෙ. දැන් ලස්සන ලස්සන කෙල්ලො නැහැ. කමක් නැහැ ඔයාට හොඳක් වෙනව නම් මාත් කැමතියි''

ශාන්තා හඬමින් කාමරයෙන් පිට වීමට සූදානම් වන විට රවි ඉදිරියට පැන ශාන්තා ගේ අල්වා ගත්තේ ය.

''මාව අත හරින්න. එපා මාව අල්ලන්න'' ඇය කඳුළු පිස දමමින් කාමරයෙන් යාමට සූදානම් වූවා ය.

''ඕන් ඕන් බොරුවට තරහ ගන්න. තරහ වෙන්න එපා කෙල්ලෙ. මම එහෙම කිව්වෙ විහිළුවට'' රවි ශාන්තාව තුරුල් කර ගත්තේ ය. ඔවුනතර කෙටි නිහඬ බවක් ඇති වූනි.

''මෙහෙ බලන්න'' රවි ඇගේ මූහුණ ඔහු දෙසට හරවා ගත්තේ ය.

''එපා මා දිහා බලන්න''

''ඔහ්. තරහ ගියාම මූණෙ ලස්සන''

''එන්න එපා විහිළුවට''

''ඔයා එක්ක නැත්නම් මම කා එක්කද විහිළු කරන්නෙ'' රවි ශාන්තා ගේ ගෙල සිප ගනිමින් කීවේ ය.

''හැම දේකම සීමාවක් තියෙන්න ඕනෑ. ඕවා කිව්වම මට දුක හිතෙනව''

''ඉතින් නාඩ ඉන්නකො''

www.sinhalalibrary.com

''ඔෆිස් එකේ ලස්සන කෙල්ලො ඇති. ඒකයි මට දැන් ආදරේ නැත්තෙ''

''ඉන්නව ඕනෑ තරම්''

''ඒක හින්ද තමා මට ආදරේ නැත්තෙ''

ශාන්තා ගේ කතාව නිසා රවි ගේ සිතේ ඇති වූයේ කෝපයකි. තමා ශාන්තා වෙනුවෙන් දරන අවදානම ඇයට නො තේරෙන්නේ ඇයි? රවි ශාන්තා අතැර සිය අසුන වෙත ගියේ ය.

රවි කෝප වූ බව තේරුම් ගිය පසු ශාන්තා ගේ කඳුළු වියළී ගියේ ය. සැණින් අමනාප වන රවි ගේ දඟකාර හැසිරීම පිළිබඳව ශාන්තාට හොඳ අවබෝධයක් ඇත. හෙක්ටර් පියා සමග කතා කළත් රවි සමග කතාවට පට-ලැවෙන්නේ නැත. ශාන්තා රවි සිටි තැනට ගොස් ඔහු ගේ අතින් ඇල්லූ විට ඔහු අත ඉවතට ගත්තේ ය.

''මගෙ ආඩම්බර මහත්තයට තරහ ගියාද?''

''යනව යන්ඩ''

ශාන්ත රවි ගේ කණින් අල්ලා සොලවන විට ඔහු ගේ මුහුණේ සිනාවක් නැගුනි.

''එන්න එපා මා එක්ක කතාවට''

''අනේ ආඩම්බර කාරයො තරහ වෙන්න එපා. මම කිව්වෙ විහිළුවටනෙ. හොඳා හොඳා. මගේ හොඳම හොඳ මහත්තය කිසි කෙල්ලෙක් දිහා බලන්නෙ නැහැ''

''දැන් ඉතින් කියල වැඩක් නැහැ නෙ. මෙච්චර කල් නම් බැලුවෙ නැහැ. අද ඉඳල බලනව''

www.sinhalalibrary.com

''අහු උනාවෙකො ඒ කෙල්ල මම හොඳ වැඩක් කරනව''

''හොඳයි මම පෙන්වන්නම්කො''

''අද්දට මම හොඳ වැඩක් කරනව''

''ඇත්තද. එනව එයා ගෙ පින්තූරෙ පෙන්වන්න'' රවි ශාන්තා කැඳවාගෙන යාබද කාමරයේ කණ්ණාඩිය අසලට ගොස් ඇගේ ප්‍රතිබිම්බය පෙන්වූයේ ය.

''ඔන්න කෙල්ල. පුළුවන් දෙයක් කරනව'' රවි එක වරම ශාන්තා තුරුල් කර ඇගේ දෙතොල් සිප ගත්තේ ය. ඇය රවිගෙන් මිදී නිවස වෙත දුව ගිය පසු ඔහුට විශාල පාළුවක් දැනුනි. පරිසරය අතිශයින් නිහඬ ය. මුහුද සිප හමන සැඳෑ සුළඟ ජීවිබවින් යුතු ය. රවි ජනේලයෙන් ගෘහ උද්‍යානය දෙස බැලුවේ ය. තරුණ සඳරැස් ගෙමිදුල පුරා පැතිර ඇත. හදවතෙහි වූ උද්දමය නිසා එකාකාරි කාර්යාල කටයුතුවල යෙදීමට ඔහුට සිතුනේ නැත. මේ හඳ පායා ඇති නිහඬ සැඳෑ සමයේ ඇගේ අත ගෙන කොහෙ හෝ ඇවිදින්ට ඇත්නම්. රවි කාමරයේ දොර වසා දමා මගට බැස්සේ ය. එම මාවත කෙළවර වන්නේ මහ සයුර අසලිනි. ඔහු සයුර වෙත පියවර මැන්නේ ය. ඈත පෙනෙන නෙක් මානයක මිනිස් පුළුටක් වත් නැත. ඈත දියඹෙ සිට දිව එන අඳුරු වර්ණ දිය රැළි වෙරළ අභියස දී සළේ පැහැ ගනී. වෙරළට වී සිටින ඔහුට දියඹේ මාළු අල්ලන මිනිසුන් ගේ ඔරු වලින් නිකුත් වන පන්දම් එළි දිස් වෙයි. ඒවා ඔහුට පෙනෙන්නේ නිල් අහසේ දිලිසෙන කුඩා තාරකා මෙනි. තෙරක් නො පෙනෙන මහ සයුරේ හබල් අදින ඔවුන්ට ජීවිතයේ කොතරම් ප්‍රශ්න ඇද්ද. ඔවුහු එම ප්‍රශ්න වලට නො බියව මුහුණ දෙති.

ඔවුන් හා සසඳන විට තමා අන්ධයෙකැයි රවි ට සිතෙයි. ඇල්කඩුව තම ශ්‍රමයට සරිලන වැටුප් නොදී ශ්‍රම සූරා කෑමක යෙදෙන පරිද්දෙන් ම මුහුදේ මසුන් මරන්නා ද කිසියම් ව්‍යවසායකයෙකුට නතු වී ඇතැයි රවිට සිතෙයි. ගාමින් ධනපතියන් හෙළා දුටුවේ, ඔවුන්ට වෛර කළේ එබැවිනි. තනිව කල්පනා කරන විට ශාන්තා හා පෙම් බැඳීම වරදකැයි රවිට සිතෙයි. ඇති නැති භේදය වැනි ප්‍රශ්න ගැන නො සිතා තමා පෙම් කළේ තම සිත් ගත් යුවතියකටයි සිතන විට එහි වරදක් නැත. සුදු ඇඳුමෙන් සැරසී කෙස් කළඹ මුදු හැර හිම කුමරියක මෙන් තමා දෙසට එන ශාන්තා ඔහු ඈතදී ම හඳුනා ගත්තේ ය. සුළඟට අසු වූ කෙස් රැළි සුළඟින් ඒ මේ අත විසිර යයි. ඇගේ දෑතින් අල්වා ගත් රවි සෙමින් ඇය වටා කැරකුනි.

''මම හැම තැනම හෙව්ව. ඇයි නො කිය ආවෙ?''

''ඔයා ගියාම මගෙ හිතට ලොකු පාළුවක් තනිකමක් දැනුන''

''ඔයාගෙන් වෙන් වෙලා එන හැම දවසක ම මාත් විඳින්නෙ ඒ වගෙ වේදනාවක් තමයි. දැන් වෙලාව හතා-මාරයි. අම්මල අක්කල එන්න නව පැයක් තියෙනව......රවි''

''ඇයි ශාන්තා?''

''මේ වගෙ ඔයා ගෙ අත් දෙක අල්ලගෙන මුළු ජීවිත කාලෙ ම ඔයා එක්ක ඉන්න ලැබෙන්නෙ කවද ඉඳන්ද රවි?''

''කවදා හරි අපි දෙන්න එක් වෙයි. ඒත් අපි හිතන තරම් ලෙහෙසියෙන් නෙමේ. සිතන කාලයක නෙමේ''

''මොනව කරන්නද රවී. මට දුක ඔයා ගැනයි. මා හින්ද නේද ඔයා දුක් විඳින්නෙ''

''මේ අපිට අයිති කොටස් මිසක් දුක් වෙන්න වත් කණගාටු වෙන්න වත් උවමනා දේවල් නෙමෙ. අපි ශක්ති මත් වෙන්න ඕනෑ''

''ඉතින් රවී අපි යමු. ඔයාවි කෑමට එක්කගෙන යන්නයි මම ආවෙ''

''බැරිවෙලා වත් ගෙදර අය ඇවිදින් හිටියොත්?''

''ෂෝ එක ඉවර වෙන්න තව වෙලා තියෙනව. අපි ගිහින් කෑම ටිකක් කමු''

රවී ශාන්තා සමගින් නිවස දෙසට පියවර මැන්නේ ය. දෙමාපියන් නො පැමිණි නිසා ශාන්තා රවීට නිවසට එන මෙන් ආරාධනා කළා ය.

''අම්මල දන්න්ම එන්නෙ නැහැ රවී. අපි දෙන්නම ගෙට ගිහින් කෑම කමු''

''බෑ අනේ. පාලි ඉන්නව නේ''

''පාලි තමයි අපි දෙන්නට කෑමට ආරාධනා කළේ'' ශාන්තා රවී ගේ අතින් ඇදගෙන නිවස තුළට වැදුනා ය. රවී ඔර්ලෝසුව දෙස බැලුවේ ය. සිනමා දර්ශනය අවසන් වීමට තව විනාඩි හතලිස් පහක් පමණ ඇත.

''කමක් නැහැ. ජෝඩුවම ඇතුළට එන්න'' පාලි අසුනෙන් නැගී සිට සිනාසුනා ය.

''පාලි'' රවී සිනාසුනේ ය.

''අපි දැක්කා. මම ඩැඩී ආවම කියන්නම්කො''

''දුන් අපිටත් ඕනැ මේක කොහොම හරි කාට හරි කියල කියව ගන්න'' රවි සිනාසුනේ ය.

''බොරු අනේ. එන්න ගේ ඇතුළටම''

''මට ගේ ඇතුලට එන්න අයිතියක් නැහැ පාලි''

''ඒක වැරදියි. අනික් අයට වාගෙ මගෙ පොඩි මස්සිනාටත් මේ ගෙදර අයිතියක් තියෙනවා''

''නැන කැමතිද මා වාගෙ පොඩි මිනිහෙකුට මස්සිනා කියන්න?''

''ඇයි නැත්තෙ. මගෙ අනිත් මස්සිනාලට වඩා පොඩි මස්සිනාට මම ආදරෙයි''

''පාලි ඕහොම කිව්වම මෙයා තවත් ආඩම්බර වෙයි''

''එයා කවදටත් ආඩම්බරයි'' පාලි සිනාසුනා ය.

''මම මොනවටද නංගි ආඩම්බර වෙන්නෙ. මම දුප්පත් ලිපිකාරයෙක් විතරයි''

''ඔය කතාව පස්සෙ පුළුවනි: එන්න බත් ටිකක් කන්න''

ශාන්තා රවි ගේ අත ගෙන කෑම කාමරයට වැදුනා ය-

''පාලි බැරිවෙලා වත් කිව්වොත්?''

''එයා දූනගෙන හුඟක් කල්''

''යකෝ මෙකි මෙච්චර කල් මාව රවට්ටපු හැටි''

''නංගි මෙන්න ඔයාට රවී බනිනව''

''මස්සිනා මොකද කියන්නෙ?''

''එපයාර් එක දූනගෙනත් ඔයා රවි එක්ක කතා කළේ නැහැල්ලු''

‘‘කොහෙ කතා කරන්නද. මූණ කොරහ වාගෙ හද ගෙන යනකොට’’

‘‘කතා නෙමේ අරිනව කට’’ ශාන්තා බත් බෙදගෙන රවිට කැව්වා ය. ඇය කෑම කවන තෙක් රවි නවාංග රසකින් සමන්විත කෑම කාමරයේ සිරි නැරඹුවේ ය. ඔහු වෙනදාට වඩා කෑවේ ශාන්තා ගේ පෙරැත්තය ප්‍රතික්ෂේප කිරීමට නො හැකි වූ හෙයිනි. කෑම කා අවසන් වෙනවාත් සමගම පාලි පළතුරු සලාදයක් අතැතිව ආවා ය.

‘‘අනේ නැනෙ මේව කාල පුරුද්දක් නැනෙ’’

‘‘මොනව කැවත් බඩට නෙ ළමයො’’

‘‘ඒක නෙමේ. මම මෙහෙ ආ බව පාරංචි වෙයිද දන්නෙ නැහැ. හැබැයි මගෙ ශෝලය නම් කවදවත් කට හොල්ලන්නෙ නැහැ’’

‘‘ඔයා කාටවත් බය වෙන්න එපා රවි අයියෙ’’ පාලි ඉස්තෝප්පුව දෙසට ගියා ය.

‘‘අර තියෙන්නෙ ප්‍රියන්ති ගෙ කාමරේ, මේ ප්‍රින්සි අක්ක ගෙ කාමරේ. අර කෙරෝලෙම තියෙන්නෙ මගෙ කාමරේ’’

‘‘ඒ කාමරේට යන්න අවසරද?’’

‘‘ඔයා එන්න කැමති නම් ඕනෑ වෙලාවක ඇතුල් වෙන්න අවසරයි’’

රවි ශාන්තා සමග කාමරයට පිවිසුනේ ය. මනාව සකස් කර ඇති එහි ඇඳුම් වැට, පොත් මේසය, පිළිවෙල කට තබා ඇත. කාමරයට පිවිසි වහාම රවි ශාන්තා තුරුල් කර ඇගේ දෙතොල් සිප ගත්තේ ය.

''නංගි එයි'' ශාන්තා ඈත මෑත බලමින් කීවා ය.

''එයා එන එකක් නැහැ''

''මොකද ඔය හැටි තියෙන දුහලිල්ල''

''අක්කේ'' පාලි ගේ කටහඬ ඇසුනි.

''අපි මෙතන.........''

''දූන් ඉතින් හිටිය ඇතිනෙ. වෙලාව හරි එන්න''

''යන්න කලින් මෙතන ඉඹිනවකො''

''ම්හූ''

''එහෙනම් මම යනව. මේ අන්තිම සැරේ''

''මගෙ තොල් දෙක රිදෙනව වාගේ. මූණුත් වෙනසක් පේනවද?''

''නෑ'' රවී සිනාසී ශාන්තා ගේ දෙකපොල සිප කාමරයෙන් පිටත ආවේ ය.

ඔර්ලෝසුව දෙස බලා සිටි පාලි රවී එනු දැක සිනා සුනා ය.

''පොඩි නෑනා මාව එලව ගන්න හදනව. ඔන්න මම ගියා''

''ගුඩ් නයිට්'' පාලි සිනාසුනා ය.

රවී ශාන්තා ගෙන් සමුගෙන කාර්යාලයට ගියේ ය. ඔහු පැමිණ මඳ වේලාවකට පසු ඇල්කඩුව ගේ රථය වත්තට පිවිසුනි. රවී වැඩ නවතා දමා එදින නවාතැන වෙත ගියේ ය.

රවී ගේ සිතේ තිබූ එකම වේදනාව කිසි දිනක ඇල්කඩුව ගේ සිත පෙළීමට සිදුවේ ය යන්න ගැන ය. ඔහු

නිතර දෙවේලේ මේ පිළිබඳව කල්පනා නො කළද එය විසඳන මගක් දුටුවේ නැත. රවි පත්‍ර කාර්යාලයේ සේවය කළත් ඇල්කඩුව පෙර මෙන් රවිට හිමි වැටුප ගෙවි-වේ ය. නීති පන්තියේ වැඩ කටයුතු පවත්වාගෙන යාමට සේවකයෙක් සොයා ගන්නා මෙන් රවි ඇල්කඩුව ගෙන් ඉල්ලා සිටියද ඔහු එය දවසින් දවස කල් දැම්මේ ය. රවි නිවසේ සේවය කිරීම ගැන අසතුටු වූයේ හෙක්ටර් හා ප්‍රින්සි පමණි. තමාට කැමති පුද්ගලයෙකුට රවි ගේ තනතුර භාර දීමට හෙක්ටර් සිතා සිටියද ඇල්කඩුව නිසා ඔහුට එසේ කරනු බැරි විය. මෙනිසා හෙක්ටර් අමනාප වූයේ රවි සමගිනි. ඇල්කඩුව හෙක්ටර්ට වඩා රවි ව විශ්වාස කිරීම නිසා ප්‍රින්සි සෑහෙන කාලයක් පියා සමග අමනාප වී සිටියේ ය. ඇල්කඩුවට විනෝද වීමට අවශ්‍ය වූ විට ඔහු පැමිණ රවි කැඳවාගෙන යයි.

''ඔය හැට් මැරිගෙන වැඩ කරන්න එපා. එනව අද මා එක්ක දං අතක් අදින්න''

''මම දං අදින්න වැඩිය දන්නෙ නෑ සර්''

''මට ආරංචියි රවි සොයිසව පැරැද්දුවලු. එනව. එනව''

නිවසට පිවිසෙන විට ප්‍රියන්තා ඉදිරිපස අසුනකට වී පත්‍රයක් බලමින් සිටිනු රවිට පෙනුනි. හෙක්ටර් නිරුවත් උඩු කයින් යුතුව සඟරාවක් බලමින් සිට රවි දැක සාලයට ආවේ ය.

''අද පොඩි දම් පයිට් එකක් දාන්න. ප්‍රියන්තා ගේන්න දුව දම් බෝඩ් එක''

''තා එක්කද ඩැඩී'' හෙක්ටර් කමිසයක් අදිමින් එළියට ආවේ ය.

''රවී එක්ක''

''හැබැයි මම ඕනෑ කෙනෙක් එක්ක එනව ඔට්ටුවක් දනව නම්, මොකද රවී කියන්නෙ?'' හෙක්ටර් සිනා-සුණෙන් ය.

''මා ගාව සල්ලි නැහැ. මම දන්නෙත් නැහැ''

''අපොයි ඩැඩී එක්ක අදින එක මහ කජ්ජක්ද?''

''එනව රවී'' ඇල්කඩුව ඇසුන් ගත්තේ ය. දම් ක්‍රීඩාව ආරම්භ වුනි. නිවසේ සැවොම පැමිණ ක්‍රීඩාව නරඹන්ට වූහ. ප්‍රථම වාරයේ රවී පරාජය වුනි. රවී පරාජය කිරී-මෙන් ඇල්කඩුව සතුටුවන බව වැටහුන හෙයින් රවී දෙවන වරද ඇල්කඩුවට ජයග්‍රහණය හිමිවන සේ දම් ඇද්දේ ය. රවීට අවශ්‍ය වූයේ නිවසේ දම් සූරයා වන හෙක්ටර් පරාජය කිරීමට ය.

''රවී මොකද කියන්නෙ. ඔට්ටුවක් දනවද? බියර් බෝතලයක්''

''ඒක මදි. රුපියල් පනහක් දමු''

ශාන්තා රවීගේ කතාවෙන් තිගැස්සී සිටියා ය. රුපියල් පනහක් හෙක්ටර්ට සුළු දෙයක් වුවද රවීට විශාල මුදලකි. දක්ෂ දම් ක්‍රීඩකයෙක් වූ හෙක්ටර් පරාජය කිරීම කළ නො හැකි දෙයකි.

''රුපියල් පනහක් වැඩියි රවී'' ශාන්තා කිවා ය.

''රයිට් පනහකට මම කැමතියි. ඔන්න දැන්ම කිව්ව දිනුවොත් සල්ලි ආපහු දෙන්නෙ නැහැ''

''හා පටන් ගම්මු''

ප්‍රින්සි සැමියා ගේ පසට වී දැඩි ඕනෑකමකින් උනුසුම් තරඟය නැරඹුවා ය. රවී ට ලෙඩයෑ දීම සඳහා සිටියේ ශාන්තා පමණි, මුලින් ඉත්තන් කීප දෙනෙක් පරාජය වන විට ප්‍රින්සි, ප්‍රියන්තා සිනාසෙන්ට වූහ. තරඟය තියුණු මුහුණුවරක් ගත්තේ රවී ඉත්තන් කීප දෙනෙක් පරාජය වීමෙන් පසුව ය. රවී හෙක්ටර් නො දන්නා උපක්‍රම යොද ඉතා සුළු වේලාවක දී ඔහු ගේ බල බින්දේ ය. ශාන්තා ගේ මුහුණේ සිහින් සිනාවක් ඇඳී ගියේ හෙක්ටර් පරාජය වන ලකුණු දුටු හෙයිනි. රුපියල් පනහක් වැනි විශාල මුදලක් ඔට්ටු ඇල්ලීම ගැන දූන් ප්‍රින්සි ගේ සිතේ දුකක් ඇති වෙයි. හෙක්ටර්ට ජය ලැබීමට නො හැකි බව නම් දූන් හොඳම පැහැදිලි ය. ඇල්කඩුව ලජ්ජා වූයේ රවී තමා රැවටීම පිළිබඳව ය. අවසන් ඉත්තාද දිනා ගත් රවී අසුනෙන් නැගී සිටියේ ය. හෙක්ටර් අමනාපයෙන් මෙන් රවී අත මුදල් තැබුවේ ය.

''තව එක අතක් අදිමු''

''වෙන එක අතක් වත් අදින්නෙ නැහැ''

''දූන් ඇතිනෙ පුතා. රවීට මහන්සි ඇති''

''ඩැඩී මම රුපියල් පණහක් පරාදයි''

''රුපියල් සියයක අතක් නම් එනවා'' රවී සිනාසුණේ ය.

''රුපියල් සියයක්. දෙයියනේ! ජීසා සෙල්ලමක් ද? මේක සූදු පලක් වගේ නෙ කතාව'' ප්‍රින්සි කතා කළේ අමනාපයෙන් යුතුව ය.

''ඉස්සෙල්ල ඔට්ටුවට අදිමුයි කිව්වෙ මම නෙමෙ''

''කරුණාකරල කතාව නවත්වන්න. සල්ලි අයින් දිනපු කෙනාටයි. ගණංකාරය එනව මා එක්ක අදින්න'' පාලි සැමවාම සිනාස්සවමින් රවී ඉදිරිපසින් අසුන් ගත්තා ය.

''මට සල්ලි එපා'' රවී හෙක්ටර් ගේ මුදල් මේසය මත තබා නිවසින් පිට වී ගියේ ය.

# 7

නීති පරීක්ෂණය අවසන් වීමෙන් පසු රවිට සැනෙන විවේකයක් ලැබුනි. මෙම නිවාඩු කාලය තුළ රවි එක දිනක් වත් ඇල්කඩුව මහතා ගේ නිවසට ගියේ නැත. ශාන්තා දැකීමට තිබූ ආශාව ඔහු දැඩි ආයාසයකින් යටපත් කර ගත්තේ ය. ඇය ගැන සිතන හැම මොහොතකම රවිට ඇල්කඩුව සිහි වෙයි. ඔහු තමා කෙරෙහි තබා ඇති විශ්වාසය කිසි දිනෙක විනාශ වනු ඇතැයි සිතන විට ඔහු සිත ඇතිවන වේදනාව අති විශාල ය. පත්‍ර කාර්යාලයෙන් නවාතැනට එන රවි නීති පරීක්ෂණය සඳහා පොත් පත් බැලුවේ ය. වෙනදා මෙන් නොව දැන් ඔහුට ශාවින් හා උපේන්ද්‍ර ඇසුරු කිරීමට විවේක ලැබී ඇත.

''ඔය හැටි කල්පනා කරන්න එපා මිනිහෝ''

''මට කල්පනා කරන්න තියෙන දේවල් උඹලට උනා නම් ශාවින්..........''

''ගැනියෙක් ගැන තියෙන නිකං බොළඳ කතාවක් ගැටළුවක් වෙන්නෙ කොහොමද? මිනිස්සුන්ට ඔයිට වඩා ප්‍රශ්න තියෙනව. මේ රටේ දුක් විඳින ජනතාව සදාකාලිකව ඒ ප්‍රශ්න වලට මැදී වෙලා ඉන්න හැටි. ලොකු ධනපතීන්

www.sinhalalibrary.com

කම්කරුව ගෙ ශ්‍රමය සූරා කන හැටි, දවසින් දවස ඉහළ යන ජීවන වියදම නිසා සාමාන්‍ය ජනතාව දුක් විඳින හැටි, ඔව නෙ'බං ප්‍රශ්න''

''ඒව ප්‍රශ්න නෙමේ කියල මම කිව්වෙ නැහැ ගාවින්, ශ්‍රම සූරා කෑමට යටත් වුන, ඉගෙනීමේ තරමට රස්සාවක් නැති මම වාගෙ මිනිහෙක් ගෑනියෙකුට ආදරේ කිරීම ප්‍රශ්නයක් නෙමෙද?''

''ඔව විහිත් ඇතිකර ගත්ත ප්‍රශ්න. උඹ දැන් කිව්ව වාගෙ කතාවක් හොඳා බොළඳ චිත්‍රපටියකට. එහෙම නැත්නම් නවකතා පොතකට. කොල්ල හරිම දුප්පත් අහිංසකයි, රස්සාවක් නැහැ. කෙල්ල අන්තිම පොහොසත් දෙන්න අතරෙ ආදරේ..........''

ගාවින් සිනාසෙන විට රවි ගෙ සිතේ කෝපයක් ඇති වූවද ඔහු අපහසුවෙන් එය මැඩ ගත්තේ ය.

''ඇයි උඹ ඔච්චර පටු විදිහට මගේ ජීවිතේ දිහා බලන්නෙ. ඇයි උඹ උපහාසයෙන් අපේ ජීවිත දිහා බලන්නෙ. දුප්පත් පෝසත් භේදය නෙමෙ ගාවින් මාත් ලෝකෙ ආශාවක් තියෙන මිනිහෙක් නෙමෙ කියලද උඹ හිතන්නෙ?''

''මම කියන දේ වරදවා වටහා ගන්න එපා. කාගෙවත් ජීවිතයක් උපහාසයට ලක් කරල සතුටු වෙන්න තරම් කෲර, අමන හිතක් මට නැහැ රවි''

''උඹ හැම දෙයක්ම කියන්නෙ තරහට නෙමේ විත්තිය මම දන්නව''

''උඹ ශාන්තා බඳිනවට මගේ අකමැත්තක් නැහැ.
ඒ වාගෙ හිත තියෙන කෙල්ලෙක් හොයා ගන්න එක
ලේසි නැහැ''

www.sinhalalibrary.com

''මට තියෙන එකම වේදනාව බොසා ගෙ හිත රිදවන්න වෙන එකයි ගාවින්''

''යුද්ධ කරන කොට රජවරුන් මැරෙණව. ඇල්කඩුව කොච්චර හොඳ උනත් උඹට ශාන්තාව අමතක කරන්න බැහැ නෙ''

''ඒක නම් එහෙම තමා''

''නැන්ද මාමල යාලු කරගන්න එක එච්චර අමාරුද බං. ඒක නෙමේ උඹේ බඩු කෑල්ල එක්ක ටිකක් කතා කරන්න ආසයි රවි''

''ඒ මොනවටද?''

''අපෝයි මට අල්ල ගන්න නෙමේ. ආ මේ එන්නෙ උපේන්ද්‍රත්...... ඒයි උපේ මම කිව්ව රවිය ගෙ බඩු කෑල්ල එක්ක කතා කරන්න ඕනෑ කියල. ඒ පාර අලිය උනා''

''මට කීප වලියෙ හම්බ වෙනව. අපි මොටද නිකං කරදර කරන්න යන්නෙ. අන්තිමට කියයි......''

''උඹ හරි පල් මිනිහ බං. උඹ ශාන්තාව දැකල අහක බලාගෙන ගියාලු. උඹේ කටු බඩුව කොහෙදි දැක්කත් මම කතා කරනව නෙ. හිටපංකො''

''ඔව් ඉතින් අපි අල්ගෙන ඉන්නෙ කටු බඩු තමා. මෙච්චර හිටිය එක සල්ලිකාර කෙල්ලෙක් වත් අපි දිහා බැලුවෙ නැහැ නෙ''

''කතාව නෙමේ. උඹ කෑමට යනවද නේ එකක් දනවද? කියපං කුකර් එක පත්තු කරන්න හදන්නෙ''

''බොමු බොමු''

www.sinhalelibrary.com

උපේන්ද්‍ර රවි ගේ පොතක් ගෙන බලන්ට පටන් ගත්තේ ය. රවි භූමිතෙල් උදුන දල්වා කේතලය තබා කෝප්ප තුනක් සේදුවේ ය. මඳ වේලාවකට පසු ගාවින් කතා කරන හඬ ඇසුන නිසා රවි මිදුලට බැස්සේ ය. නවාතැන දෙසට එන ඇල්කඩුව දුටු රවි පුදුමයට පත් වූහ.

''සර් එන්න ඇතුළට'' රවි සිය කාමරයට පැමිණීමට ඇල්කඩුවට ආරාධනා කළේ ය. ගාවින් පුටුව මත තිබූ සරොම, කමිස, තුවා, යට ඇඳුම් සියල්ලම ඔසවා ඇඳට දමා ඇල්කඩුවට අසුන් ගැනීමට ඉඩ සැලසුවේ ය.

''නිවාඩු දුන්නට පස්සෙ ගෙවල් පැත්තෙ ආවෙ නැති හින්ද මම හිතුව අසනීපයක්ද කියල''

''ඒ හැටි වැඩකුත් නැහැ නෙ. මාත් මෙහාට වෙලා පාඩම් කළා''

''ඒක හොඳා. රවිට පොඩි ලයිබ්‍රරි එකක් තියෙන-වනෙ'' ඇල්කඩුව රවි ගේ පොත් දෙස බලමින් සිනාසුනේ ය.

ගාවින් තේ කෝප්පයක් සූදානම් කර පැමිණ එය රවිට දුන්නේ ය.

''සර් තේ එකක් බොන්න. අපේ නම් වරේ හෙම නැහැ. ඔක්කොම අතින් තමා''

''ඕව මොනවද අයියෙ ගන්නව මෙහාට'' ඇල්කඩුව සිනාසෙමින් කෝප්පය අතට ගත්තේ ය.

''මම ස්ටඩි කරන දවස් වල නතර වෙලා හිටියෙ දෙමටගොඩ. මගෙ කාමරෙත් මෙහෙම තමා. දැන් ඔය සුප්‍රිම් කෝට් ජජ් ගුණරත්නයි මායි කරපු දේවල්. අන්තිමේ ඒ බෝඩිමෙන් අපිට යන්න කිව්වා''

www.sinhalaebooks.com

''සර්රුත් නිකං ඉඳල නැහැ''

''කවුද අයියෙ කොල්ලො කාලෙ නටන්නේ නැත්තෙ. ඔය මගෙ මිසිස් සෙට් උනොත් ඕවට ගිහින් තමා'' ඇල්කඩුව සැවොම හිනස්සවමින් කීවේ ය.

''රවි එහෙනම් මම යන්නම්. මම පඩි පැකට් එකත් ගෙනාව. මෙන්න''

''තැන්ක්යූ සර්''

''මම හිතුවෙ හෙක්ටර් එක්ක අප්සෙට් එකක් වද්ද කියල. මොනව උනත් මිනිහත් හැමදාම රවිව මතක් කරනව'' ඇල්කඩුව සිනාසෙමින් කීවේ ය.

''මම හෙට හැන්දෑවට එන්නම''

රවි, ඇල්කඩුව මහතා රථයට පිවිසි පසු දොර වසමින් කීවේ ය. රථය පිටත්ව ගිය පසු ගාමිණී රවි ගේ කරට අත දමා ගත්තේ ය.

''මාම බැනව හොයන්න ඇවිදින්''

''මම දන්නව මෑන් මාව හොයාගෙන එන විත්තිය. වැඩ ඕක්කොම අප්සෙට් ඇති''

''මෑන් කොල්ල කාලෙ හොඳ සෙල්ලක්කාරයෙක් විගේ''

''නැතිව. ශාන්තල ගෙ අම්ම ගෙන සල්ලිකාර ගෑනි. මෑන් කොළඹ ඉන්න කාලෙ ගෑනිව සෙට්කර ගත්ත. මිස්ට ඇල්කඩුවට වඩා නෝන පෝසත්''

''දූන් උඹේ ඉස්ටෝරි එකත් එහෙම නේ'' උපේන්ද්‍ර සිනාසුනේ ය.

''සුමනා එකගමාරකින් ගියේ නැහැ. ශාන්තාගෙන් ඉන්න හම්බ වෙන එකක් නැහැ''

''යමු කාල තිඳුගන්නත් ඕනෑ'' ගාවින් කාමරයෙන් පිටත බැස්සේ ය.

රවි පසු දින කාර්යාලයට ගියේ සැඳෑ සමයේ ඇල්කඩුව ගේ නිවසට යාමට සිතමිනි. සැඳෑ පුවත්පතට පලකළ යුතු වාර්තාවක් පරීක්ෂා කරමින් සිටි රවි නාද වූ ටෙලිෆෝනය අතට ගත්තේ ය.

''රවී කතා කරන්නෙ''

''මම ශාන්තා''

''හලෝ ශාන්තා''

''එන්න එපා මා එක්ක කතා කරන්න''

''මගෙ හොඳ ළමය නෙ. තරහ වෙන්න එපා''

''මොකද රවි මෙච්චර කල් ආවෙ නැත්තෙ?''

''අනේ ශාන්තා මට තේරෙන්නෙ නැහැ මම මොනවද කරන්නෙ කියල''

''ඔයා ඔයා ගැනම සිතනව මිසක් මා ගැන කිසි ආදරයක් නැත්තෙ ඇයි රවි?'' ඇගේ දුබල හඬ ඔහුට ඇසුණි. රවි මඳ වේලාවක් නිහඬව සිටියේ ඇයට දියයුතු පිළිතුරක් ගලපා ගත නො හැකි වූ හෙයිනි.

''අඩන්න එපා ශාන්තා. හොඳ ළමය වාගෙ අඩන් නැතිව ඉන්න''

''මම ඔයා වෙනුවෙන් ඕනැම පරිත්‍යාගයක් කරන්න ඉන්දෙද්දිත් ඇයි රවි ඔයා මට මෙහෙම දුක දෙන්නෙ?''

රවි නිහඬව සිටියේ ය.

''තාත්ත ගෙ හිත රිද්දවන්න වෙන එක ගැන නේද ඔයා දුක් වෙන්නෙ? ඒ දුක මට නැහැ කියල හිතන්න එපා රවි. ඔයා සතුටුද මගේ ජීවිතය කාලකන්නි වෙනවා දකින්න''

''ඔයා නැතිව මට ඉන්න බැහැ කෙල්ලෙ. දූන් ඉතින් තාඩ ඉන්න. මම හෙට හවස එන්නම්කො''

''බෑ අද එන්නම ඕනෑ''

''තාත්ත රීයෙ මාව බලන්න ආව''

''ඔයා එන්නෙ තාත්ත කිව්ව නිසද්ද?''

''තාත්ත ගෙ විශ්වාසය කවද, හරි මට කඩන්න වෙනව''

''එහෙනම් ඔයාට මාව ඕනෑ නැහැ. තාත්තව රැක ගන්න''

''ඇත්තට ඔයාට මොලේ තියන එක නැද්ද ශාන්තා? ඔයාට මම කියන එක තේරෙන්නෙ නැද්ද?''

''මට මොලේ තියන එක කළදක් වත් තිබුණ නම්, මෙහෙම කරන්නෙ නැහැ නුමා''

ශාන්තා ටෙලිෆෝනය තබනු රවිට ඇසුණි. කළ යුත්තේ කුමක්ද? රවි කඩිනමින් චාර්තාව සකස් කර දින භාගයක නිවාඩුවක් ගෙන ශාන්තා හමුවීමට ගියේ ය. බස් නැවතුම් පලට වී ශාන්තා ගේ පැමිණීම බලාපොරොත්තු වෙන් සිටියද ඇය පැමිණියේ නැත. දූන් සැමෙන කලෙක සිට ඇල්කඩුව නමා ඇසුරු කරන්නේ මිත්‍රයෙක් ලෙසිනි. අජිත්, හෙක්ටර් වැනි අය සමඟ ඔහු වැඩි ඇසුරකට යන්නේ නැත. දක්ෂිණාංශික රජයක් පැමිණි වහාම රවිට හොඳ රැකියාවක් ලබා දෙන බව නිතරම ඔහු පවසයි. මෙතරම් සුහදව ඇසුරු කරන ඇල්කඩුව මෑත දිනකදී අමනාප වනු ඇත. තම හදවත දිනූ ශාන්තා ගේ පියකරු ලෝකය විනාශ කිරීමට ඔහුට පුළුවන් කමක් නැත. දිවා සමයේ ශාන්තා සමඟ ටැලිෆෝනයෙන් කළ කතාවේදී

www.sinhalaelibrary.com

තමා අතින් කියවුන වචන ගැන ඔහු කණගාටු වුනි. ජයයෙන් බැස යන ශාන්තා දුටු සැණින් රවි ගේ සිතේ ඇති වූයේ විශාල සතුටකි.

ඔහු නිහඬව ඇය වෙත ගියේ ය. රවි දුටු සැණින් ඇගේ මුව පියකරු සිනාවකින් පිබිදී ගියේ ය.

''කොහොමද?''

''කොහොමද තමා. නපුර''

''ඔය කතා නෙමේ. ගෙදර ගිහින් ඇඳුම් මාරු කර ගෙන පොඩි ගමනක් යන්න එන්න''

''මම ඒක කොහොමද කරන්නෙ? මට බැහැ''

''හොඳ බබා නෙ''

''පේනවද තියෙන කට්ට කමක මහත''

''මම මෙයා එන කල් පිස්සි වාගෙ පාර බලා ඉන්නව. ඔයාට මා ගැන දුක හිතෙන්නෙ නැද්ද රවි?''

''ආවෙ නැති හේතු, අරව මේව ඔක්කොම කියන්නම්. ගිහින් එන්නකො''

''ඔයා මෙතනම ඉන්න ඕනැ හරිද. එනව නම් පැයක් යන්න කලින් එනව. නැත්නම් නැහැ''

''මොනවද අනේ. අම්මව රවටන්න බොරුවක් කියන්න උගන්වන්න ඕනැද?''

''බොරු ජාති ඔක්කොම කියලයි තියෙන්නෙ අනේ. වෙලාවකට මට මේ ගැන දුකක් හිතෙනව. අරුන් දෙන්න හිටියොත් තමා අමාරු''

ශාන්තා කඩිනමින් නිවස බලා ගමන් ගත්තා ය. මුහුණ සෝද ගත් ඇ මවට පෙනෙන්ට බත් කටවල් දෙ තුනක් කෑවා ය.

‘‘මොකද ළමයො හිටගෙන කන්නෙ?’’

‘‘මම ටක්ගාල පබ් එකට දුවල එන්නම්’’

‘‘හෙට සෙනසුරාද වහලද?’’

‘‘ඔව් මිස්. මම වීගහට එනව’’

‘‘යන දිහාක ගිහින් ඉක්මනින් එන්න. මෙතන ඩැඩි ආවම කෑගහන්නෙ මටයි’’

‘‘මම ටක් ගාල එනව’’

ශාන්තා බස් නැවතුම් පලට එන විට මදක් ප්‍රමාද වී තිබුනි. රවි පෙනෙන්ට සිටියේ නැත. මොහොතකට පසු ඔහු එනවා දුටු නිසා ශාන්තා බස් නැවතුම් පලට ගියා ය. ඩබල් ඩෙකර් බසයක් එනු දුටු රවි ශාන්පාට එයට නැගීමට සංඥා කළ නිසා ඇය එයට ගොඩ වැදුනා ය. රවි ඇය අසලින් අසුන් ගත්තේ ය.

‘‘මම කලින් හිතාගෙන හිටියෙ කොළඹින් පිට කොහේ හරි යන්න කියල. දැන් ඒවට වෙලා නැහැ නෙ’’

‘‘මාව එක්කගෙන ගියාම ඉවර නෙ. එතකොට කොළඹින් පිට නෙමේ ඕනෑ දිහාක යන්න පුළුවන්’’ ශාන්තා සිනාසුනා ය.

‘‘හොඳයි දැන් යමු’’

‘‘ඔයා නම් එක්කගෙන යයි. බය ගුල්ල’’

‘‘දෙනව එකක් බස් එකෙන් එළියට විසි වෙන්න’’

‘‘ගෑනුන්ට ගහන්න ලැජ්ජ නැද්ද? දැන් මගෙ අත අල්ලගෙන ගියාට පහු වෙනකොට මට ගහයි බනියි නමා’’

‘‘ඔව් ඔව්. ඒව කියන්න බැහැ’’

www.sinhalalibrary.com

''මේ අනේ රවි. ඔයා මට මොනව හරි කිව්වොත් මට ඉන්න බැරි වෙයි''

''දුක ඇතිකර ගන්නෙත් අපිමයි. සැප ඇතිකර ගන්නෙත් අපිමයි''

මිගමු පාරට පිවිසි බසය සෙමින් ඉදිරියට ගමන් කරයි. ඉදිරි පස අසුන් කීපයක්ම මගීන්ට ඉඳ ගැනීමට බැරි තරම් අබලන් වී තිබීම නිසා ඔවුන්ට නිදහස්ව කතා බහ කිරීමට හැකි වුනි.

''ශාන්තා''

''ඇයි?''

''යම් විදිහකින් ගෙදර අයට අපේ සම්බන්ධය අහුවුනොත්?''

''රවි අපි මේ ප්‍රශ්නය ගැන කොච්චර කතා කරල ඇද්ද?'' ඇය සුසුමක් හෙලුවා ය.

''පත්තරේ එච්චර ගෙවන්නෙ නැහැ. මීට වඩා තව රුපියල් සියයක් ලැබෙන රස්සාවක් තියෙනව නම් බය නැහැ''

''ඉතින් ඔයා එහෙම හිතල ගෙදර නැව්දින් හිටියම මම ඉන්නෙ කොහොමද?'' ශාන්තා දෙනෙතේ නැඟුන කඳුළු පිස දමා ගත්තා ය.

බසයේ ගමනාන්තය වූ ඇලකන්දට ඇත්තේ ස්වල්ප දුරකි. බසය නතර කළ පසු ඔවුන් දෙදෙන හැමිල්ටන් ඇල අසලට වී මඳ වේලාවක් සිට ආපසු නිවෙස් බලා පිටත් වූහ.

www.sinhalaelibrary.com

# 8

ප්‍රියන්තා, ශාන්තා ගේ පෙම් සබඳතාවය මුලින්ම දැන ගත්තා ය. ඇගේ මිතුරියක් ශාන්තා ගේ පෙම් පුවත පිළිබඳව පැවසුවද, ඇය කවුරුන් හා සම්බන්ධ වී ඇද්ද යන්න ප්‍රියන්තා දැන සිටියේ නැත. ප්‍රියන්තා සිතුවේ සංඛ ගැන ය. මෙනිසා ඈ මේ රහස මවට හෙළි කළේ නැත. මිතුරියක සමග සාප්පු සවාරියක යෙදී තරුණ ක්‍රිස්තියානි සමිති ශාලාව අසලින් ගමන් කරන විට ඇය එකවරම නතරවුණි.

''ඔයා ගෙ මස්සිනාව කලින් දැකල නැත්නම් පෙන්-නන්නද?''

''ශාන්තා ගෙ බෝයි ෆ්‍රෙන්ඩ්ද. කෝ අනේ පෙන්-නන්න''

''වෙන් අත් කොට ෂර්ට් එකක් ඇඳල ඉන්නෙ''

ප්‍රියන්තා රවී දැකීමෙන් එකවරම නිගැස්සී සිටියාය.

''අර මැද ඉන්න හාදයද?''

''ඔව්. මිනිහ බොක්ස කෙනෙක්. හැබැයි ශාන්තා නම් හොයාගෙන තියෙන්නෙ හොඳ කොල්ලෙක්''

ප්‍රියන්තා සිතෙහි වූ කෝපය මිතුරියට නොපෙන්-
වීමට දැඩි උත්සාහයක් ගත්තා ය. ඔහු තම පියා යටතේ
සේවය කරන්නෙකැයි මිතුරියට පැවසීමට පුළුවන් කමක්
නැත. රවිට විරුද්ධව ප්‍රීන්සි අක්කා කතා කරන හැම
අවස්ථාවක ශාන්තා ඔහු ගේ පක්ෂය ගන්නේ ඇයි දැයි
ප්‍රියන්තාට වැටහෙන්නේ දැන් ය. රවි නිවසින් යවන
මෙන් නිතරම පැවසූ හෙක්ටර් අයියා ගේ අවවාද
ප්‍රියන්තාට සිහි වෙයි.

"ප්‍රියන්තා මිනිහව අඳුනනවද?"

"ම්හු. අපිට මොකද අපි යමු" ප්‍රියන්තා ඒ පිළිබඳව
යළි කතා කිරීමට ගියේ නැත.

එදින නිවසට පැමිණි ප්‍රියන්තා කල්පනා කළේ
පවුලට මුහුණ පෑමට වන අපහසු තත්ත්වය ගැන ය. පසු
දින ඇ ශාන්තා ඉගෙන ගන්නා පාසැලේ මිතුරියක් හමු වී
මේ ගැන සොයා බැලුවා ය. කතාව සත්‍යයකි. ඇ නිවසට
පැමිණියේ කලකිරුන සිතින් යුතුව ය. මේ නිසා තම
විවාහයට බාධ පැමිණේය යන බියකින් ඇගේ සිත වේද-
නාවට පත් වුනි. නිවසට පැමිණි ඈ මවට ශාන්තා හා රවි
පිළිබඳ කතාව හෙළි කළා ය.

"මොනව ප්‍රියන්තා!" මව දියණිය දෙස පුදුමයෙන්
බලා සිටියා ය.

"හොඳයි මම කියන්නෙ බොරු නම් තේජා නංගි
ගෙන් අහල බලන්න"

"කතාව ඇත්ත නම් සිද්ධ වෙන්න යන්නෙ මහ නස්
පැත්තියක්"

"මම්යි, ඩැඩියි හෙක්ටර් අයිය කීව දේවල් පිළි-
ගත්තෙ නැහැ. කැලේ ඉන්න නයි ගෙට දාගෙන"

''ඩැඩීට හෙම එකපාරටම මේව කියන්න එපා''

ඇල්කඩුව මැතිනිය කාමරයට වැදුණේ දැඩි වේදනාවකින් යුතුව ය. කලෙක සිට ශාන්තා ගේ හැසිරීමෙහි වෙනසක් තිබූ බව ඇයට වැටහෙන්නේ දැන් ය. දිවා ආහාරය ගැනීමට තරම් වත් සතුටක් ඇගේ සිතේ තිබුනේ නැත. පාසල් ඇරී නිවසට එන ශාන්තා දුටු ඇගේ දෙනෙතේ කඳුළු නැගුනි. ඇය පවුලට කර ඇති ව්‍යසනය අති විශාල ය. බත් කටවල් දෙක තුනක් කා ඇඳට වැදුන ශාන්තා කල්පනා ලොවෙහි තනි වී සිටින අයුරු ඇයට පෙනේ. සැඳෑ වරුවේ රවි එන වෙලාවට ශාන්තා ගෙමිදුලේ ඒ මේ අත ඇවිදින හැටි සිය කාමරයට වී ඇල්කඩුව මැතිනිය බලා සිටියා ය. ගේට්ටුව විවෘත කරමින් වත්තට පිවිසෙන රවි දෙස ඇය බලා සිටියා ය. ඔහුගේ තේජස්වී මුහුණේ රැඳුන ජීවී සිනාව ඇයට පෙනෙයි. එක් අතකින් රවි වැනි පිරිමියෙකුට දියණිය පෙම් බැඳීමේ පුදුමයක් නැත. එහෙත් ඔහු වැනි සාමාන්‍ය මිනිහෙකුට දියණිය විවාහ කර දෙන්නේ කෙසේද? ඔවුන් ගේ හස්ථ සංඥා ඇයට තේරුනේ නැත. ශාන්තා සිනාසෙමින් කාමරයට දුව එනු දුටු නිසා ඇල්කඩුව මහත්මිය ජනේලය අසලින් ඉවත් වූවා ය. මඳ වේලාවක් ඇඳට වී කල්පනා කරමින් සිටි ඈ ඇඳෙන් බැස සූදානම් වූවා ය. රියදුරා ලවා රථය ගෙන්වා ගත් ඈ කිසිවෙකුට නො දන්වා නිවසින් පිට වූවා ය.

ශාන්තාගේ පංතියේ අධ්‍යාපනය ලබන ඥාති සොයුරියක ගේ දියණියක් වන තේජා හමුවීමට ඇය ගියේ මෙහි සත්‍යාසත්‍ය දැන ගැනීම සඳහා ය. දසනායක මැතිනිය ගේ නිවසට පිවිසි ඈ ඔවුන් ගේ ආරාධනයෙන් තොරවම අසුන් ගත්තා ය.

‘‘ඇයි අක්ක හදිසියෙන්ම වාගේ?’’

‘‘පොඩි පටලැවිල්ලක් නංගි. කෝ තේජා දුව? එයාට කතා කරන්න’’

මඳ වේලාවකට පසු තේජා ඇල්කඩුව මැතිනිය ඉදිරියට ආවා ය.

‘‘මට පොඩි කරදරයක් වෙලා.......... දුව මම අහන ප්‍රශ්න වලට ඇත්ත කියන්න ඕනෑ’’

‘‘මම දන්න දෙයක් නම් කියන්නම්’’

‘‘ශාන්තා දුව කා එක්ක හරි යාළු වෙලා ඉන්නවද?’’

එම ප්‍රශ්නයෙන් තේජා තිගැස්සී සිටියා ය. රවි හා ශාන්තා පිළිබඳ පෙම් පුවත පාසැලට රහසක් නො වූවද ඇගේ දෙමාපියන්ට කියන්නේ කෙසේද? ඇය නමා සමඟ අමනාප වනු ඇත. තේජා නිහඬව සිටියා ය.

‘‘දුව අපි අපේ පවුල් වල තත්ත්වය ආරක්ෂා වෙන විදිහටයි වැඩ කරන්න ඕනෑ. කාඩියා කාඩ වැඩ කළාට අපි ඒවට ඉඩ තියන්නෙ නැහැ’’

‘‘තේජා දන්න දෙයක් තියෙනව නම් නැන්දට කියනාව’’ මව ගේ කතාව විධානයක් ලෙස ඇයට සිතුනි.

‘‘ඔව්. යාලුයි’’

‘‘කා එක්කද දුව?’’

‘‘රවි එක්ක’’

‘‘එහෙනම් කතාව හුඟක් දුර දිග ගිහින්’’ ඇය පුටුවේ ඇල වුනේ දැඩි වෙහෙසකින් යුතුව ය. තේජා වතුර වීදුරු වක් ගෙන ඒමට යැවූ ඇය ඥානි සොයුරියට එම විස්තරය කීවා ය.

www.sinhalalibrary.com

''දැන් ඉතින් අයියට කියල ඕනව අදම එළියට දම්ම වන්නයි තියෙන් නෙ''

''අනේ නංගියෙ ඒ වැඩේ නම් එච්චර ලේසි වෙන්-නෙ නැහැ. රවි කියන එකා හරි පෝරිසාදයෙක්. කාටවත් බය නැහැ''

''ඇයි හෙක්ටර් ළමය ඉන්නෙ''

''හෙක්ටර්ව ඒ කොල්ල ගණන් ගන්නෙත් නැහැ. මම කියන්නෙ පිරිමින් ගෙ වරදවල් නෙමෙ. මේ අපේ බැල්ලි දැන ගන්න ඕනෑ තමුන් ගෙ තත්ත්වය හැටියට වැඩ කරන්න''

''මෙච්චර විපතක මහත!''

ඇය වතුර වීදුරුව උගුරට දෙකට අවසන් කළා ය.

ඇල්කඩුව මැතිනිය නිවසට යන විට හොඳට අඳුරු වැටී තිබුනි. ප්‍රියන්තා හා අජිත් නිවසින් බැහැරව සිටීම ගැන වුවද ඇගේ සිතේ ඇති වූයේ කෝපයකි. ශාන්තා ඉදිරි පසට වී පොතක් දෙස බලා සිටිනු ඇයට පෙනෙයි. තමාට නො දන්වා හදිසි ගමනක් ගියේ ඇයි දැයි ඇල්කඩුව විමසුවද ඇය ඔහුට පිළිතුරු දුන්නේ නැත.

''විල්සන් මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනෑ''

''ඉතින් සාරා කියන්න තියෙන දෙයක් කියන්න''

''අපි ගෙදරින් පිට වෙලා කතා කරමු''

ඇල්කඩුව සිය බිරිඳ දෙස ඕනෑකමින් බලා සිටියේ ය. ඇය කිසියම් ප්‍රශ්නයකට මැදි වී ඇතැයි ඔහුට සිතුනි.

''මේ දැන්ම එන්න ඕනෑද?''

''ඔව්. මේ දැන්මම''

ඇගේ කතා විලාශය නිසා ඔහු ගේ සිත නො සංසුන් විය. කඨිනමින් සැරසුන ඔහු රථයට වැදී බිරිඳ සමගින් ගියේ ය.

ශාන්තා බලා සිටියේ මව හා පියා නිවසින් පිට වන තෙක් ය. සෑහෙන කලකින් ලැබුන නිදහස නිසා ඇගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේ ය. ඇය අදහස් කළේ රවි සමග මුහුදු වෙරළට යාමට ය. කාමරයට දුව ගිය ඈ රවි ගේ මේසය ඉදිරි පස පුටුවේ අසුන් ගත්තා ය.

''යනව ළමයො ලෙඩ දන්නෙ නැතුව''

''ලෙඩ දන්න දෙයක් නැහැ. ලෙඩේ වැටිල ඉවරයි''

''මොනව!'' රවි ශාන්තා දෙස බැලුවේ පුදුමයෙන් යුතුව ය.

''ගණංකාරය බය උනා. ඒකට මොකද කට නං......''

''මට බය නමුසෙ හිත්ද මිසක්, මා හිත්ද නෙමේ අයිසෙ. මට නැති වෙන්න දෙයක් නැති මිනිහෙක්''

''මට ඇති වෙන්න දේවල් මිසක් නැති වෙන්න දේ වල් නැහැ''

''දැන් ඇති වෙලාද?'' රවි සිනාසුනේ ය.

''මොකක් හරි වල් කතාවක් හිතාගෙනයි ඒ වචනෙ කිව්වෙ. හැදිල ඉවරයි'' ශාන්තා අසුනෙන් නැගිට රවි ගේ කණෙන් අල්වා ගත්තා ය.

''මේ සෙල්ලම් නෙමේ. අත හරිනව''

''කියනවද වල් කතා. කණ කඩනව'' ඇය සිනාසෙමින් කීවා ය.

''මාව උඹට හදන්න බැහැ ගැනියෙ''

''ගැනියෙ................මොකක්ද ඒ කතාව. මම තවම කෙල්ලෙක්. මම තමයි ගෝරිකාරයව හදන්නෙ''

''මේ අම්මල කොහෙද ගියේ?''

''ඒ අයටද අනේ ගමන් නැත්තෙ''

''මට ඊයෙ ප්‍රියන්තියි අජිතුයි හම්බ උනා පැටා වලදි. අජිත් නම් හිතා උනා අක්ක ගෙ මූණ මෙන්න සයිස් එක''

''ඔයා මොටද අක්ක ගෙ මූණ බලන්න ගියේ?''

''මම බලන්න ගිය ඇති එකක් නැහැ. මොකද අනේ ඔච්චර අහංකාර. අක්කල නංගිල කවිරුත් එක තමා''

''එන්න එපා පව කෙලින්න. ඔයා තමා ඒ දවස්වල මට අහංකාර කම් පෙන්නුවෙ''

''මම ආව. මගෙ රස්සාව කළා ගියා එච්චරයි''

''මෙහෙම කියන බව දන්නවී නම් කවදා වත් ඔයා දිහා බලන්නෙ නැහැ''

''මම දන්නව ඇයි සංබ හිටියෙ''

රවි ගේ වචනය ඇසුන සැණින් ශාන්තා කෝප වූවා ය. සංබ පිළිබඳව පවසනවාට ඇය කිසිසේත් කැමති නැත. සැණින් ඇගේ දෙනෙතේ කඳුළු නැඟුනි. ඇය නැගිට යාමට සූදනම් වන විට රවි ඉදිරියට පැන්නේ ය.

''එහෙම යන්න දෙන්න බැහැ..........ශා ශා ශා කඳුළුත් ඇවිදින්'' රවි පහත් වී ඇගේ මුහුණ දෙස බලන විට ඇය කඳුළු පිරි දෙනෙතින් යුතුව සිනාසෙමින් ඉවතට හැරුනා ය.

''මට යන්න දෙන්න. නැත්නම් මම කෑ ගහනව''

www.sinhalaelibrary.com

''මුලු දිවුරන්නම් මීට පස්සෙ එහෙම කතා කියන්නෙ නැහැ''

''ඇත්තද?''

''ඇත්තමද්දත් කියල අහනව. මේ අපි හෙට පින්තූර යක් බලමුද?''

''ඔයා එක්ක පින්තූර බලල ආවම ඇඟ රිදෙනව''

''කරාටි ෂෝ බලපුවහම ඔහොම තමා''

''මෙච්චර කල් පින්තූර බැලුව. එක චිත්‍රපටියක් වත් හරියට බලා ගන්න දුන්නෙ නැහැ නෙ''

''දැන් ඉතින් බය වෙන්න එපා. සිංහ කොඩිය දපු වෙලේ ඉඳන් නිමි කියන කල් බලන්න දෙනව''

''ඔහ්! විනාසයි කාර් එක එනව'' ශාන්තා විදුලියක වේගයෙන් කාමරයෙන් පිටත පැන්නා ය. කර කියාගත දෙයක් නැතිව රවි එදෙස බලා සිටියේ ඇඩි වේදනාවකින් යුතුව ය. මෙතෙක් නිරූපද්‍රිතව පැවැති සෑම ක්‍රියාවකම අවසන් ලකුණක පෙර නිමිති ඔහු දුටුවේ ය. රවි ගේ කාමරයෙන් පිටත පනිනවාත් සමග ම මව හා පියා ඉදිරි යෙන් සිටීම නිසා ඇයට කරගත හැකි දෙයක් නො විය. දෙමාපියන් යන තෙක් සිට රවි ගේ කාමරයෙන් ආවා නම්,

''දුව කොහෙද ගියේ'' ඇල්කඩුව සන්දුන්ව ප්‍රශ්න කළේ ය.

''මල............මේ පැත්තට ගියා'' ශාන්තා මල් ගොමුව දෙස දක්වමින් කිවා ය.

''කාමරේ රවි ඉන්නවද?''

ඔව්............නෑ............නෑ මම හිතන්නෙ ඇති''

ඇල්කඩුව ගේ හරස් ප්‍රශ්නයෙන් ශාන්තා ගේ බොරුව බිඳ වැටුනි. ශාන්තා සිය කාමරයට වැදුනේ බියෙන් යුතු ව ය. රාත්‍රි ආහාරයට කැඳවන විට ඇය සිටියේ සයනයේ වැතිර ගෙන ය. කෑම මේසයට ගියේ එහි නො ගොස් බැරි නිසා ය. ආහර ගනිද්දී වෙනදා මෙන් දෙමාපියන් අතර කතාවක් වූයේ නැත. ප්‍රියන්තා වුවද සිටියේ රකුසු මුහුණකින් යුතුව ය. මෙම ප්‍රශ්නය මුළුමනින් දැන සිටියේ ප්‍රියන්තා පමණි. බත් කටවල් කීපයක් කා කාමරයට වදින විට රවි ගේ කාර්යාලය අඳුරෙන් පිරී තිබෙනු දැකීමෙන් ඇගේ දෙපා වෙව්ලන්ට පටන් ගත්තේ ය. 'ඇයි රවි ඔයා මාව දාල ගියේ?' ශාන්තා ඇඳේ වැතිර කොට්ටයේ මුහුණ ඔබා ගත්තා ය.

පසු දින පාසැල් යාමට සූදානම් වූ මුත් ඇය උදේ ආහාරය ගත්තේ නැත. කෑම නො කැවේ ඇයි දැයි කිසිවෙක් ඇගෙන් විමසුවේ නැත. ඔගට පිවිස මඳ වේලාවක් ගිය පසු ශාන්තා පාලිට කතා කළා ය.

''නංගි ගෙදර මොනව හරි වෙනසක් තියෙනවද?''

''මට නම් මොනවත්ම ආරංචි නැහැ. හැබැයි මා එක්ක අම්ම, අක්ක කව්රුවත් කතා කළේ නැහැ''

යළි ඔවුනතර කතාවක් වූයේ නැත. පාසැලට පිවිස මොහොතක් ගත වෙන්ට ප්‍රථම තේජා ශාන්තා සොයා ආවා ය. කොරිඩෝරය දිගේ මඳ දුරක් ගිය තේජා, ශාන්තාට කතා කළා ය.

''ඔන් ශාන්තා වැඩේ ඔක්කොම ගැස්සිලා. ඊයෙ නැත්ද අපේ දිහා ආවනේ''

''ඒ මොටද?''

''ඔයයි රවියි යාලුයි කියන එක දැනගෙන ඒක ඇත්තද කියල අහන්න අපේ දිහා ආව''

''ඇත්තද? ශාන්තා පහත් හඬින් ඇසුවා ය.

''ඉතින් මොනවද කරන්නෙ?''

''කරන්න දෙයක් නැහැ. කවද හරි අම්මලත් දැන ගන්න ඕනැ නෙ''

''ඔයාට ඔහොම කියල ලේසියෙන් ගැලවෙන්න ලැබෙන්නෙ නැහැ. ටිකක් රවිට පරිස්සම් වෙන්න කියන්න''

ශාන්තා දිවා සමය වන තෙක් පංතියේ සිටියද ඉගැන්වූ එක පාඩමක් වත් මතක සිටියේ නැත. විවේක කාලයේදී යාබද තැපැල් කාර්යාලය වෙත ගිය ඈ රවිට කතා කළා ය.

''රවි මම ශාන්තා''

''කොහොමද ඊයෙ වැඩේ ෂේප් කර ගත්තද?''

''දැන් ඉතින් බොරු කියල වැඩක් නැහැ. ඊයෙ මමියි ඩැඩියි ගිහින් ඇවිදින් තියෙන්නෙ අපේ කතාව ආරංචි වෙලා ඒක ගැන හොයන්න''

''දෙය්යෝ සාක්කි ?''

''දෙය්යො විතරයි රවි සාක්ෂියට ඉන්නෙ. වෙන කව්රුවත් දන් නැහැ''

ශාන්තා ඉකි ගසන හඬ ඔහුට ඇසුනි.

''අඩන්න එපා ශාන්තා''

''මම අඩන්නෙ බයට නෙමෙ. ඔයාව දකින්න නැති හින්දයි''

''මම එනව කෙල්ලෙ. උඹ බය වෙන්න එපා'' රවි කතා කළේ අමුතුම ශක්තියකින් යුතුව ය.

''ඉතින් ඔයා කවදවත් අපේ දිහා එන්න එපා''

''ඒ මොකද?''

''ඔයාට තාත්ත අනතුරක් කරාවි''

''ඒ ජාතියෙ වැඩවලට මම බය නැහැ ශාන්තා''

''හෙක්ටර් අයිය ඔයා එක්ක තරහෙන් ඉන්න මිනිහ මේක ආරංචි උනාම ඔයා එක්ක කලබල කරන්න එයි''

''මට ජාති දන්න ආමෝක් හෙක්ටර් ගෙ කණ පැලෙන්නයි ගහන්නෙ''

''කෝ ඉතින් ඔයා එක්කනෙ බැරි. ඔයාට මාව විශ්වාසද රවි''

''ඔව්. සත්තයි''

''ඔයා කා එක්ක වත් කෝලාහලෙට යන්නෙ නැහැයි කියල පොරොන්දු වෙන්න''

''මම යන්නෙ නැහැ. මට පිද්දුවොත්?''

''මම මෙහෙ හිතේ කරදරෙන් ඉන්නව. ඔයා පිටදි හොඳින් නො හිටියොත්?''

''හා..........හා''

''මම ලියනකල් හරි, ඔයාට කතා කරල කියන කල් හරි මෙහෙ එන්න එපා''

''මටත් ඔයා ගෙ තාත්තට මූණ දෙන්න බැහැ. ඔයා මොනව කිව්වත් අහගෙන ඉන්න. දන්නව නෙ මම කියල තියෙනවනෙ තත්ත්ව ය''

''හොඳයි රවී''

''මම අද ඔයා බලන්න එන්නද?''

''එපා රවි එපා. මම කියන්නම්. පරිස්සමින්''

ශාන්තා පාසැල ඇරී නිවස වෙත ගියේ සැලෙන හද වතින් යුතුව ය. නිවසෙහි පැතිර තිබුණේ මළ පාළුවකි. දිවා සමයේ වුවද රළ ඝෝස පැහැදිලිව නිවසට ඇසුණි. ඇඳේ වැතිර දෑස් පියාගෙන සිටින ඇයට කාමරයට කිසි වෙක් පිවිසි බව හැඟුන නිසා යාන්තමින් දැස් විවර කර එදෙස බැලුවා ය. අම්මා සහ ප්‍රියන්ති අක්කා දොර රෙද්ද අසලට වී සිටිනු ඇය දුටුවා ය.

''නින්ද ගිහින්ද කොහෙද පස්සෙ කතා කරමු'' මව ගේ කටහඬ ඇයට ඇසුණි.

ප්‍රියන්තා යළි කාමරයට පිවිසියේ පැයකට පමණ පසුව ය. කොණ්ඩය අතින් සකස් කරගත් ශාන්තා ඇඳේ ඉඳ ගත්තා ය.

''මොකෝ ශාන්තා ඔයා ඇඳටම වෙලා ?''

''නිකං''

''නිකං නමයි. ඔන්න අම්මලට ආරංචි වෙලා''

ශාන්තා කිසිවක් කීවේ නැත.

''ඔයාට මොළේ කියන එක බිංදුවක් වත් තිබුනෙ නැද්ද අනේ. හොඳ කෙනෙක් එක්ක යාලු උනා නම් අම්මල විරුද්ධ උනත් මම හෙල්ප් කරනව. බලන්න රවි අපේ වැඩකාරයෙක් වගේ මිනිහෙක් නේද?''

''ඩැඩී මොකද කියන්නෙ?''

''ඩැඩී ගෙ හැටි ඔයා දන්නවනෙ නංගි. අපි එක්ක යාලුවො වාගෙ ආශ්‍රය කළාට එයාට තරහ ගියාම එච්චර නරක මිනිහෙක් ලෝකෙ තවත් නැහැ. මමී වාගෙ ඩැඩී කොච්චර හරි කියවන්නෙ නැහැ. එයාට තියෙන්නෙ එක වචනයයි''

ශාන්තා නිහඬව සිටියා ය.

''රවී එක්ක යාලු වෙලා හිටියට කමක් නැහැ. දූත් ඒක හිතෙන් අතහරින්න. ඔයිට වඩා එන්ගේජ් වෙලත් අත හරින්නෙ''

''මම ඒ ගැන තීරණයක් ගන්නම්''

''මොකක්ද තීරණය? ඔයා රවී එක්ක තියෙන යාලු කම නවත්වන්න ඕනැ''

ප්‍රියන්තා කාමරයෙන් පිට වී ගියා ය. වෙනද ඉතා සුළු දේකට පවා බනින අම්මා මෙම ප්‍රශ්නය ගැන දැන දැනත් කිසිවක් නො කීම ශාන්තා ගේ පුදුමයට හේතුවකි. ඇය කටයුතු කරන්නේ පියා ගේ උපදෙස් පරිදි යැයි ඇය සිතුවා ය. මව නිවසේ ඇති වන සාමාන්‍ය කතා බහේදී ශාන්තා ගේ සිතට වදින සේ පොදුවේ සෑම දියණියකට ම අවවාද කළා ය.

''අපිට කියනට විගහට මංගල්ලෙ ගන්න කියල. අපිට බැහැ තව කල් බලා ඉන්න''

''මමී අපි පයිනල් ගන්න ගමන් මැරි කරනව කිව්ව'' ප්‍රියන්තා කීවා ය.

''මට බැහැ කොච්චර හරි උඹලව මුර කරන්න. පිරිමි නෙමෙ, විශේෂයෙන් ගෑනු ළමයි දැන ගන්න ඕනැ තමුන් ගෙ නත්වයත්, දෙමව්පියන් ගෙ නත්වයත් ආරක්ෂා වෙන විදිහට වැඩ කටයුතු කරන්න''

ශාන්තා තේ කෝප්පය තබා නැගිටීමට සූදානම් වූවා ය.

''ශාන්තා කොහෙද යන්නෙ? ඔහොම ඉන්නව'' මව ගේ විධානය නිසා ඇය අසුනේ නතර වූවා ය.

''උඹ ලැස්ති වෙන්නෙ අපේ මූණෙ දැලි ගාල මේ එක කෙල්ලෙකුට වත් පාරෙ බැහැලි යන්න බැරි වෙන්න වැඩ කරන්නද?''

ශාන්තා නිහඬව මේසය මත වැටුන වතුර බිංදුවක් ඇඟිල්ලෙන් ඒ මේ අත යවමින් සිටියා ය.

''ඩැඩීට පිස්සු වාගෙ. ඒ මනුස්සය උදේ හිටන් ඌ වෙන කල් කල්පනා කරනව. තරහ රස්සාව උනත් කර ගන්න බැරි වෙලයි තියෙන්නෙ''

''ඩැඩීට පිස්සු හැදෙන්නෙ මොනවටද?''

''බලන්න මම් මෙයා ගෙ කතාව, ඩැඩීට දුක දෙන්න ඔයාට පව් නැද්ද ශාන්තා. ඔයා ඔක නවත්තනව කියල පොරොන්දු වෙන්න''

''මම ඔයාට කිව්වනේ ප්‍රියා''' ශාන්තා සිය කාමරයට වැදුනා ය,

''මොනවද ප්‍රියා, ශාන්තා කිව්වෙ?''

''එයාට නව කල්පනා කරන්න ඕනැලු. ආ..........මේ එන්නෙ හෙක්ටර් අයියයි අක්කයි''

''ප්‍රින්සි තේ බොන්න. එන්න පුතා මේසෙටම''

ප්‍රින්සි හිටියේ තරහෙන් රතු වූ මුහුණින් යුතුව ය.

''ආරංචිද අක්කෙ?'' ප්‍රියන්කා ඇසුවා ය.

''ඔව්. මට හෙක්ට කීවා. කෝ..........?''

''අර කාමරේ ඉන්නව. දූන් මොනවත් කියන්න එපා. අපි උදේ ඉඳන් කියලයි තියෙන්නෙ''

''ඔව් ප්‍රින්සි, ඔයා ඒක පාරටම ගිහින් කඩා පනින්න එපා. ටිකක් යාප්පුවෙන් කියල හිත වෙනස් කරවන්න''

ප්‍රින්සි, ශාන්තා ගේ කාමරයට ගොස් දොර රෙද්දෙන් හිස පොවා ඇය දෙස බලා සිට යළි සාලය දෙසට ගියා ය.

ඇල්කඩුව පැමිණ සාලයට වී තේ වීදුරුවක් පානය කළේ ය

''ප්‍රින්සි දූන්ද ආවෙ?''

''ඔව් ඩැඩී''

ඔවුනතර දිගු නිහඬ බවක් ඇති වුනි.

''හෙක්ට කට කැඩෙන කල් ඩැඩීට කිව්ව ඔය බල්ලව ගෙදරට වද්ද ගන්න එපා කියල. දූන් ඉතින් මොකද උනේ?''

''ඔව් දුව. මම ඒ වරද පිළිගන්නව'' ඇල්කඩුව පයිප්පය දල්වා ගිනි පෙට්ටියෙන් පයිප්පයේ මුහුණත වසා කිප වරක් උරා යළි කතා කළේ ය.

''ඒත් මේ ගැන මම රවිට චීතරක් දෙස් කියන්නෙ නැහැ. ගැනු ළමයි දූන ගන්න ඕනැ අපි කවුද? මොන වද කරන්නෙ කියල''

''ඩැඩීට තවම රවි විශ්වාසයි''

''හෙක්ට මම කවදවත් රවිට දෙස් කියන්නෙ නැහැ. මේ අපේ බැල්ලි දූන ගන්න ඕනැ තමුන්ගෙයි, දෙමව් පියන්ගෙයි තත්ත්වය ආරක්ෂා කරන්න. කොල්ලො කියන ජාතිය එහෙම තමා''

''එක අතකට ඩැඩීගෙ කතාව ඇත්ත'' ප්‍රින්සි පහත් හඬින් කිවා ය.

''සාරා හෙට ඉඳන් ශාන්තා ගෙ ඉස්කෝලෙ ගමන් නවත්වන්න. මගෙන් අවසරයක් නැතිව කිසිම ගමනක් එයාට යන්න දෙන්න එපා''

''විභාගෙට තව තියෙන්නෙ..........''

''විභාග කිසි දෙයක් ඕනැ නැහැ. හෙට ඉඳන්........... හෙක්ට මම ඇඳට යනව'' ඇල්කඩුව සාලයෙන් පිට වී ගියේ ය.

''ඩැඩීට පිස්සු වගේ'' ප්‍රින්සි සුසුමක් හෙලුවා ය.

''රවි තවම ආවෙ නැද්ද?''

''එදට පස්සෙ නැහැ''

''මේ ගෙදර හරි පාළුයි. ප්‍රින්සි අපි යමු''

''හුම්''

www.sinhalaelibrary.com

# 9

පාසැල් ජීවිතයට ආයුබෝවන් කියන අවසාන දිනය අදයි. ඇගේ නෙතඟ කඳුලෙන් පිරී ගියේ ය. එමෙන්ම තම ජීවිතයේ තීරණාත්මක දිනය අද යැයි ඇයට සිතුනි. කිසිම දෙයක් ගැන පැහැදිලි තීරණයක් ගැනීමට පුළුවන් වූයේ නැත. මවගෙන් අපහසුවෙන් ලබා ගත් මෙම දිනයේත් උපරිම ප්‍රයෝජන ගත යුතු යැයි ඇයට සිතුනි. පාලි සමගින් මගට පිවිසි ශාන්තා ප්‍රථමයෙන්ම කළේ රවිට පණිවුඩයක් දීම ය. උද්ගතව ඇති තත්ත්වයෙන් ගොඩ ඒමට රවි සිටිය යුතුම ය. එසේ නො වුව හොත් තම මුළු ජීවිතයම සදාකාලික බැහැර කළ නො හැකි අඳුරකින් වැසී යනු ඇත.

''නංගි දැන් මම මොනවද කරන්නෙ?''

''අනේ මට නම් තේරෙන්නෙ නැහැ අක්කෙ. ඔයා ගන්න තීරණයකට මාත් කැමතියි එච්චරයි''

''මම අද රවී හම්බ වෙන්න යනවා''

''ඒක හොඳා. ගිහින් මොනවට හරි තීරණයක් ගන්න''

www.sinhalaelibrary.com

ශාන්තා පාසැලේ සිටියේ දිවා විවේකය වන තෙක් පමණි. තමාට උද්ගත වී ඇති තත්ත්වය මිතුරියන් දෙදෙනාට පැවසූ ඈ මගට බැස්සාය.

රවි දැකීමෙන් පසු ඇගේ සිතේ දුක පහව ගියේ ය.

'කෙල්ලව දවසට දෙකට ඇදිල ගිහින්' රවිට සිතුනි. මේ ප්‍රශ්න පිළිබඳව කතා කරගැනීමට නිදහස් තැනකට යා යුතු යැයි ඔහුට සිතුනි.

''අපි අද කොහෙ හරි ගිහින් හොඳට කතා කන්න ඕනැ''

''සමහර විට ඒක මම ඔයාගෙන් කන අන්තිම කෑමත් වෙන්න පුළුවන්'' ශාන්තා හෝටලයට පිවිස අසුන් ගනිමින් කීවා ය.

''මගෙන් මොනවත් අහගන්න එපා''

''නෑ රවී මට අදින් පස්සෙ ඔයාව දකින්න වත් කොලේජ් එකට වත් යන්න වෙන්නෙ නැහැ''

''ඒක කියන්නෙ මොකොමද?''

'මට සමාවෙන්න''

''අද මම කවන්නම්'' රවී ශාන්තාට බත් කැව්වේ ය. ආවරණය කරන ලද කාමරය තුළ සිටි නිසා ඔවුන් කිසිවෙකුට පෙනුනේ නැත.

දිවා ආහාරයෙන් පසු සිනමා ශාලාවකට පිවිසි පසු ශාන්තා රවි ගේ අතින් අල්වා ගත්තා ය.

''පහු ගිය සුමානෙ ඇතුලත හිතේ සන්තෝසෙන් හිටියෙ අද විතරයි රවී''

''තව ටික දවසක් ඔය විදිහට ඉන්නකො''

''ටික දවසක් කිව්වෙ?''

''ඔයාට ගෙදර නවතින්න කිව්වට වෙන කරදරයක් උණේ නැහැ නෙ''

''ඔයා නො දැක ගෙදරට වෙලා ඉන්න එක තරම් වෙන දඬුවමක් මට තියෙනවද රවී''

''මොනව කරන්නද ශාන්තා. මට ගෙදරට එන්න විදිහකුත් නැහැ නෙ''

''එහෙනම් මාව එක්ක යන්න රවී''

''ඔයාව එක්ක යන්න තරම් ශක්තියක් මට නැහැ ශාන්තා''

''ඔයා තියයි රවී. මම ඔයා උනා නම් කරන දේ තීරණය කරල''

''ඔයාට මම අදත් පොරොන්දු වෙන්නම් අපි දෙන්නට ජීවත් වෙන්න පුළුවන් රස්සාවක් ලැබුන වහාම එක් වෙනව කියන එක''

''ඒ කියන්නෙ හොඳ රක්ෂාවක් නො ලැබුනොත් ඔයා මාව අමතක කරනව කියන එකද?''

''මම එහෙම දෙයක් අදහස් කළේ නැහැ. මට නම් මොනව උනත් කමක් නැහැ. ඒත් එච්චර දුකක් විඳින්න ඔයාට හුරු නැහැ''

''අපි දෙන්න සිතුම් පැතුම් අතින් හුරුවෙන්න පුළුවන් උනා නම් ඕනෑ දුකක් විඳින්න මට බැරි නැහැ රවී''

''ඔය ඔක්කොම බොල් වචන විතරයි. ප්‍රැක්ටිකලි එච්චර ලේසි නැහැ''

www.sinhalalibrary.com

''ඔයාට වැරදිලා රවි. මම ඔයා තරම් උගත් නැහැ. මම අදහස් ප්‍රකාශ කරන වචන කොච්චර හිස් බොල් උනත් මගේ හිත බොල් නැහැ''

ශාන්තා අසුනෙන් නැගී සිටියා ය. රවි වැනි තීරණයක් ගැනීමට නොහැකි අයෙක් හා ඇසුරු කිරීම පිළිබඳ ඈ දුක් වූවා ය.

''ඇයි නැගිට්ටෙ?''

''මට දැන් යන්න ඕනැ''

''ඔයා මා එක්ක තරහ උනාද?''

''ඔයා එක්ක තරහ වෙලා ජීවත් වෙන්න පුළුවන් උනා නම් ඒක කරල හුඟක් කල්. ඒත් මට ඒක කරන්න බැහැ'' ශාන්තා දුකින් මුහුණ වසාගෙන අඬන්ට වූවා ය.

''අඬන්න එපා ශාන්තා''

''අඬල හිත සැහැල්ලු කර ගන්න එක විතරයි මට තියෙන සතුට රවි. මට දැන් යන්න ඕනැ''

''ශාන්තා මම කියන එක අහන්න''

''කරුණා කරල මට යන්න දෙන්න''

ඔවුන් නිහඬව සිනමා ශාලාවෙන් පිට වූහ. බස් නැවතුම් පලට පැමිණි ප්‍රථම බසයෙන් ශාන්තා රවිගෙන් වෙන්ව ගියා ය. ඇය නිවසට යන විට හොඳටම අඳුර වැටී තිබුනි. රවි වෙනුවෙන් තැබූ විශ්වාසයේ ඉදිරවීම නිසා ඇගේ හදවත වැලපුනා ය. ඔහු වැනි තීරණයක් ගත නොහැකි පුද්ගලයෙක් හා ඇසුරු කිරීම නිසා තමා වැටුන තත්ත්වය ගැන ඇගේ සිතේ වේදනාවක් ඇති වෙයි. බසයේ සෑහෙන දුරක් එන විට යළි ඇයට රවි සිහි වුනි.

www.sinhalalibrary.com

තමා රවී මග හැර ඒම සාධාරණද? ඔහු මෙවැනි තත්ත්වයකට පත් වූයේ තමා නිසා නොවේ දැයි ඇයට සිහි වූ පසු ඇගේ දෙනෙතේ කඳුළු නැගේ. ආපසු රවී දැක්මට යාමට තරම් දුකක් ඇති වුවද ඇය එය අපහසුවෙන් දරා ගත්තා ය. නිවසට පිවිසෙන විට සැවොම ඉදිරි පසට වී සිටියද ශාන්තා නිහඬව නිවසට වැදුනා ය. තමා ගේ ප්‍රමාදය නිසා ඔවුන් කලබල වී ඇත. හෙක්ටර් අයියා හා අක්කා කලින්ම පැමිණ ඇත්තේ තම ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කිරීමට විය හැක. කාමරයට පිවිසි ශාන්තා ඇඳුම් මාරු නොකරම ඇඳේ ඉඳ ගත්තා ය.

''නංගි කොහෙද ගියේ?'' ප්‍රින්සි කාමරයට පැමිණ ඇසුවා ය.

''යාලුවෙකු ගෙ දිහා ගියා''

''කියල නො ගියෙ ඇයි?''

''මම කාට හරි කියන්න ඇති''

''මොකද ඔය හැටි අමතක? ගෑනු ළමයෙක් උනාම ටිකක් සිහි කල්පනා වෙන් වැඩ කරන්න ඕනෑ''

ශාන්තා සොයුරිය ගේ කතාවට සවන් නොදී ඉවත බලා ගත්තා ය. ප්‍රින්සි අක්කා එන්ට ඇත්තේ මේ ප්‍රශ්නය ගැන විසඳුමක් සෙවීමට විය හැක. හෙක්ටර් ගේ හඬින් ප්‍රින්සි ඔහු සිටි තැනට ගියේ ය.

''හැම දේකටම වෙලාවක් තියෙනාව ප්‍රින්සි. මෙ ආපු හැටියෙම කඩා පනින්න ගියාම හොඳද?''

''මේක අහපු වෙලාවෙ ඉඳන් මට ඉන්න බැහැ හෙක්ට. රටේ මිනිස්සු නැතිවද මේකි මෙ කාලකන්නි මහුලක පටලැවුනෙ''

''ඔයාට විතරක් නෙමේ. මමී, ඩැඩී කොයි කාටත් වේදනා තමයි. ඒ උනාට යමක් කරන කොට ටිකක් කල්පනා කරල සාකච්ඡා කරල......''

''උසාවි වල නඩු වලට කතා කරන කොට වාගෙ පොයින්ට්ස් වලින් මේව කඩන්ට බැහැ හෙක්ට. මේ කෙල්ලව පොළඹව ගත්ත අරූ ගෙ ඉලි ඇට කඩන්ට ඕනැ''

''හොඳයි අපි හිතමු මේ ප්‍රශ්නය නුහක් දුර දිග ගිහින් කියල. බැරි වෙලා වත් මිනිහෙක් දම්මල රවීට මොනව හරි කෙරෙව්වොත් නංගි ජීවත් වෙයිද?''

''ඕව නඩු පොයින්ට්ස් හෙක්ට''

''ඔයා දන්න නඩු පොයින්ට් එක. ඕනැ නැති එකටයි එපා එකටයි කට දානව. මේක මනුස්ස ප්‍රශ්නයක්. මම කියන එක තේරෙනව නේද මමී''

''ඔව් පුතා. ඩැඩී කියන්නෙත් ටිකක් ඉවසල වැඩ කරන්න කියන එක තමයි''

''රවි කියන හාදය නරක මිනිහෙක් නෙමේ පුතා. විශ්වාස වන්ත මිනිහ. නමුත් කොහොම හරි මගෙ හිතට වේදනාවක් දුන්න''

''ඉතින් වැඩි කියන්නෙ ඩැඩී මේකට කැමතියි කියන එකද?''

''නෑ දුව මම රත්නරං පිහිය කියල පපුවට ඇන ගන්නෙ නැහැ. මේ දෙන්න ගෙ සම්බන්ධෙ සෑහෙන කාලයක් තිබිල තියෙනව. ඒක ගහල බැනල වෙනස් කරන්න බැහැ. හොඳම විදිහ තමයි රවි ව මෙහාට ගෙන්නල තත්ත්වය විස්තර කරන පිළිවෙලක් කරන එක''

www.sinhalalibrary.com

''අනේ ඩැඩී අජිත්ට වත් මම කිව්වෙ නැහැ. බැරි වෙලා වත් දැන ගත්තොත් විනාශයි''

''ඩැඩී මේකට මොනව හරි කළේ නැත්නම් අපිට පාරෙ බහින්න බැරි වෙයි''

ඇල්කඩුව අසුනෙන් නැඟී සිටියේ ය. ප්‍රින්සි ශාන්තා ගේ කාමරයට ගොස් ඇය නිදි සිටි නිසා සැමියා සමග නිවස බලා ගියා ය.

ඇල්කඩුව මැතිනිය කාමරයට පිවිසෙන විට ශාන්තා ඇඳෙන් නැගිටීමට සූදානම් වූවා ය.

''නැගිටින්ට එපා. මට පොඩි දුව එක්ක කතා කරන්න ඕනැ''

''ශාන්තා බිම බලා ගත්වනම සිටියා ය.

''අපි හැම වෙලාවෙම අපේ පවුල් වල තත්වය ආරක්ෂා කරගන්න ඕනැ. අපි අතින් වරදක් උනොත් නැදෑ පරම්පරා වල් අපිට ශාප කරයි''

ශාන්තා කතා කළේ නැත.

''දුව රවී එක්කල සම්බන්ධයක් තියෙනවද?''

''ඔව්'' ශාන්තා පහත් හඬින් කීවා ය.

''ඔව් කිව්ව අපූරුව්. උඹ මොනව කල්පනා කරලද ඔව කළේ. රවී අපේ ගෙදර වැඩ කළ මිනිහෙක් නේද?''

''එයා අපේ ගෙදර වැඩ කළේ පඩියට. මහන්සියට පඩි ගැනීම මෙහෙකාර කමක් නෙමේ''

''අනේ ඔතාපිට උගත්නපුව. මීට පස්සෙ පාලි එක්ක උඹ කතා කරන්න වත් එපා. මේ විදිහට ගියොත් ඒ දරුව වත් හදගන්න බැරිව යනව''

www.sinhalelibrary.com

''ඉතින් මට මොනවද කරන්න කියන්නෙ අම්මෙ?''

''කරන එකද? ඩැඩි කරන දේවල් කිය කියා ඉන්න මිනිහෙක් නෙමේ. උඹේ හිතේ රවි ගැන ආශාවක් තියෙනව නම් අතැරල දාපං''

මව පිට වී ගියේ කෝපයෙන් පුපුරමිනි. මඳ වේලාවකට පසු කෑමට එන ලෙස පාලි කතා කළද ඇය ගියේ නැත. අවසානයේ මව පැමිණියා ය.

''ඇවිදින් කෑම කනව''

''මට එපා''

''හොඳා මම ඩැඩීව එවන්නම්''

ශාන්තා මුහුණ සෝදගෙන කෑම මේසයට ගියා ය. දූන් සෑහෙන දින ගණනක සිට නිවසේ අය සතුටු සාමිචියෙහි යෙදෙන්නේ නැත. උසාවියෙන් පැමිණි වේලේ පටන් රාත්‍රී අහර ගන්නා තෙක් ගිනි වතුර විදුරු හිස් කරන ඇල්කඩුව කෑම මේසයට එන්නේ හොඳටම වෙරි වී මෙනි. 'තාත්තෙ මට සමා වෙන්න. මම කොහොමද මගෙ රවි අතැරල සන්තෝසෙන් ඉන්නෙ. මා නින්ද තේද ඔය විදිහට බොන්නෙ?' ශාන්තා කඳුළු පිරි දෙනෙතින් යුතුව පියා දෙස බැලුවා ය. ඔහු ගේ මුහුණ ලෙහෙ පැහැගැන් වී ඇත. 'මොකද්ද දූවේ මේ නටන්න හදන නාඩගම. වෙනද නම් මම ටිකක් බීල හිටියොත් හරියට අම්මණ්ඩි වාගෙ මා එක්ක වාදෙට එනව. කෑමට ගියාම අරව බෙදන්නද මේව බෙදන්නද කියල කරදරේ. ඒත් අද උඹ මා එක්ක කතා නැහැ. මම දරුවන්ට කොච්චර ආදරේ උනත් මේ වගෙ වැඩ මම අනුමත කරන්නෙ නැහැ. හොඳයි මම මේකට විසඳුම ලබදීම දෙනව' ඔහු තනිව සිතා ගත්තේ ය.

'කාලකන්නි කෙල්ලෙ උඹ මේ මොනවද කරන්න හදන්නෙ? අපේ කවුරුවත් මෙහෙම හිහන්නො ඒක්කු පැටලිලා නැහැ. එන්නෙ නැහැ පාහරය' ඇල්කඩුව මැතිනිය බත් ඇනුවා විනා කටවල් දෙක තුනකට වඩා කෑවේ නැත. වෙන දිනවල අහර ගන්නා විට රටේ තොරතුරු, නගරයේ පෙන්වන චිත්‍රපට, හෙක්ටර් ගේ දරුවන් ගේ දඟකාර කමක් ගැන කතා කළද අද එවැනි කතා ඇසෙන්නේ නැත.

'මේ ගෙදර අයට මොනව වෙලාද? මේ ගොල්ලො අද ඊයෙ දූන ගත්තට ශාන්තක්ක ඉස්සෙල්ලම කිව්වෙ මට. මම දෙන්නට උදව් කළ බව දන්නව නම් අම්ම මාව මරයි. අපේ ලොක්කිට හෙක්ටර් අයිය වීරය උනාට මට නම් රවි තරම් හොඳ නැහැ. ශාන්තාට පවු දෙයියනේ. ඒකි දවස් ගානකින් හරියට බත් කටක් කෑවෙ නැහැ. මොනව උනත් මගෙ උදව්ව ඒ දෙන්නට දෙනව. හැබැයි හොරෙන්' පාලි සොයුරිය දෙස බැලුවා ය. ඇල්කඩුව ප්‍රථමයෙන් කෑම මේසයෙන් නැගිට ඒඹිප්පය දල්වා ඉස්තෝප්පුවට ගියේ ය. මඳ වේලාවකට පසු ඇල්කඩුව රවි ගේ සේවකයාට කතා කළේ ය.

''සිරිසේන..........''

සැණින් සිරිසේන ඇල්කඩුව ඉදිරියට ආවේ ය.

''උඹ කෑවද?''

''ඔව් සර්''

''උඹ දන්නවද මේ දවස් වල රවි ඉන්න තැන?''

''නෑ සර්''

''කාර් එක අරගෙන වරෙන්''

www.sinhalalibrary.com

ඇල්කඩුව අසුනෙන් නැගිට කාමරයට ගොස් බිරිඳට කතා කළේ ය. තමා බිරිඳට කතා කළේ ඇයි දැයි ඇල්කඩුව නො දනී. ඇය වහා කාමරයට ආවා ය.

''මට කතා කළාද?''

''ඔව්''

''ඇයි මොනවත් ඕනැද?''

''නැහැ මම නිකං කතා කළේ. ඔයා යන්න''

ඇය ඇල්කඩුව දෙස මොහොතක් බලා සිට කාමර යෙන් පිට වී ගියා ය. ඔහු ගේ හැසිරීම ඇයට තේරුම් ගැනීමට අසීරු තරම් ය. තොප්පිය හා දුම් කෝව අතට ගත් ඔහු රථයට වැදී අරමුණකින් තොරව රථය ධාවනය කළේ ය. ලිබර්ටි සිනමාහලේ රාත්‍රී සිනමා දර්ශනය අවසන් වී ඇත. මහ මග ගමන් ගන්නා ගැහැනු මිනිස්සු ඔහුට පෙනෙයි. මැක්සි ගවුන්, කොට ගවුන්, සාරි හැඳගත් තරුණියන් දකින විට ඔහුට ශාන්තා සිහි වෙයි. මෙහි වරද කාගේද? ප්‍රධාන මාවතේ රතු එළිය ඉදිරි පස ඔහු රථය නතර කළේ ය. මිනීමැරුම්, දූෂන නඩු, අපහාස නඩු, අල්ලස් නඩු වශයෙන් විවිධ වර්ගයේ නඩු වලට විත්තිය වෙනුවෙන් පෙනී සිට ජය ලැබූ තමාට මෙම කුඩා ප්‍රශ්නය විසඳීමට බැරි හැටි. කහ, කොළ එළිය. රථය යළි පිටත් වුනි. ගාළු මුවදොර සමුද්‍ර හෝටලය අසල රථය නතර කළ ඔහු ඉන් පිටත බැස්සේ ය. විශාල තන පිටියේ කිසිවෙක් නැත. මහ සයුර අතිශයින් අඳුරු බවින් යුතුව ය. දුම් කෝව දල්වා ගත් ඔහු මඳ වේලාවක් වෙරළට වී සිටියේ ය. පාර්ලිමේන්තු ගොඩ නැගිල්ල දෙස සිට කිසිවෙක් පැමිණෙනු දුටුවද ඔහු ඒ පිළිබඳව සැලකිල්ලක්

www.sinhalalibrary.com

දැක්වූයේ නැත. ඇල්කඩුව ප්‍රථමයෙන්ම උපේන්ද්‍ර හඳුනා ගත්තේ ය. ඊට පසු ඔහු රවි දුටුවේ ය. තමා දුටු සැණින් රවි ගේ මුහුණේ ඇති වූ වෙනස ඇල්කඩුව දුටුවේ ය.

''සර් තනියම. මේ වෙලාවෙ කොහෙ ආවද?''

''මම මේ යාලුවෙක් ඇරලන්න ආව රවි. හා උපේන්ද්‍ර කොහොමද''

''ඉන්නව'' ඔහු සිනාසුණේ ය.

''ළඟදි ඉන්දියා යනව කියල අම්ම දවසක් කිව්වා''

''ඔව් ටුවෙන්ටි සෙකන්ඩ් වල විතර යන්නයි ඉන්නෙ''

''ඒ පැත්තෙන් යනව නම් ලිප්ට් එකක් දෙන්න පුළුවන්''

''ස්තුතියි. අපි බස් එකේ යනව''

''රවි හෙට ගෙවල් පැත්තෙ එනවද?''

''එන්නම්''

ඇල්කඩුව රථය මහ මගට ගත්තේ ය. රවි පැමිණි වහාම මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කර තීරණයක් ගත යුතු ය. 'තීරණය කියන්නෙ මොනවද? පඩි දීල එළියට දානව. ඒ විතරක් නෙමෙ. ශාන්තා එක්ක සම්බන්දෙ නතර කරන්න කියනව. ප්‍රින්සි පැවසූ ලෙස මැරයින් ලවා රවිට පහර දුන්නොත්' ඇල්කඩුව දෙහිවලට රථය පදවා ගෙන ගියේ ය. හෙක්ටර් ගේ නිවසට රථය හැර වූ ඇල්කඩුව සීනුව නාද කළේ ය.

ප්‍රින්සි දොර හැර එළියට ආවා ය.

''ඩැඩී මොකද මේ මහ ර. එන්න ඇතුලට''

‘‘කෝ හෙක්ටා’’

‘‘එයා ලයිබ්‍රරියෙ ඉන්නව. ඉන්න මම කතා කරන කල්’’ ප්‍රින්සි පුස්තකාලයේ සිටි සැමියා කැඳවාගෙන ආවා ය.

‘‘මොකද ඩැඩී, මොනවත් කරදරයක්ද?’’

‘‘නෑ පුතා, මට එන්න හිතුනා’’

‘ඩැඩී සරමක් ඇඳගෙන කවදවත් මෙහෙම ඇවිදින් නැහැ. මොනව හරි කරදරයක්’ ප්‍රින්සි සිතුවා ය.

‘‘නංගි මොකද කියන්නෙ ඩැඩී?’’ ප්‍රින්සි ඇසුවා ය.

‘‘රවි එක්ක සම්බන්ධයක් තියෙනවලු’’

‘‘බලන්න හෙක්ට, මම නම් දෙය් කියන්නෙ මමීටයි. ගෑනු ළමයි ගැන ඔයිට වඩා නොදින් බලන්න ඕනැ’’

‘‘දැන් ඔය කතා කියල වැඩක් නැහැ දූව. දැන් මේ එන ගමන් මට රවි ගෝල්පේස් එකේදි හම්බ උනා’’

‘‘මොනවද කිව්වෙ. ඩැඩී බැන්නෙ නැද්ද?’’

‘‘අපිට එහෙම තැන් තැන්වල කෝලාහල කරන්න පුළුවන්ද?’’

‘‘ඩැඩී රවිට බයෙන් කතා කරන්නෙ’’ ප්‍රින්සි අමනාපයෙන් කීවා ය.

‘‘ප්‍රින්සි ඔයා ටිකක් නිශ්ශබ්ද වෙලා ඉන්න. ඩැඩී මොනව හරි පිළිවෙලක් හිතේ තියාගෙන නැතැ’’

‘‘හෙට උදේ හෙක්ටරුයි, දූවයි ගෙදර එන්න ඕනැ. මම රවිටත් එන්න කිව්ව. මේ සම්බන්ධෙ හතර කරනව

www.sinhalalibrary.com

නාම ඉල්ලන තරමක් සල්ලි දෙනවයි කියමු. මිනිහට සල්ලි වලට නාමම ගන්න අමාරු වෙන එකක් නැහැ''

''මොනවට්ද සල්ලි දෙන්නෙ. කණට දෙකක් ගහල එළවනව මිසක්''

''සල්ලි වගේද පුතා මේ අවනම්බුව''

''එක අතකට ඒකත් හරි තමා''

''මිනිහ බැහැයි කිව්වොත්?''

''ඒකටත් මම පිළිවෙලක් කතා කරගෙනයි තියෙන්නෙ. අපේ බින්දුට දූව බන්දල දෙනව. ස්පෙෂල් පර්මිෂන් එකකින් දෙන්නව බන්දල දෙනව. ශාන්තා හිතන විදිහට නටන්න මම දෙන්නෙ නැහැ''

''හොඳයි ඩැඩී. හොඳයි. නියම යෝජනාව. එත කොට මේ ප්‍රශ්න නැහැ. රවී අකුලගෙන යයි'' ප්‍රින්සි සිනාසුනා ය.

''මම කිව්වෙ නැද්ද ප්‍රින්සි ඩැඩී අපට වඩා ප්‍රශ්න විසඳන්න දක්ෂ බව. ඩැඩී එහෙනම් ඉක්මනට යන්න. මම් බලාගෙන ඇති. ඩැඩීට මොනව හරි ඩ්‍රිංක් එකක් දෙන්න ප්‍රින්සි''

''ඩැඩී කූල් ඩ්‍රිංක් එකක්?''

''හොඳයි බොමු''

ඇල්කඩුව සිසිල් බීම වීදුරුව පානය කර නිවස බලා ගියේ ය. ශාන්තා හැර සැවොම මිදුලට වී මග බලා සිටිනු ඇල්කඩුවට පෙනුනි. රථය නතර කර ඔහු නිවසට ඇතුල් වුනි.

www.sinhalalibrary.com

''මම ප්‍රින්සිල ලග ගෙදර ගියා'' ඇල්කඩුව සැප පුටුවක ඉඳ ගනිමින් කීවේ ය.

''ඇයි මිට නො කිය ගියේ? මම හිටියෙ හරි බයෙන්''

ඔවුනතර නිහඬ බවක් ඇති වුනි.

''ඔය තරම් හිත කරදර කරගන්න එපා'' ඇය සැමියා දෙස බලා සිටියේ දුකෙන් යුතුව ය.

''සාරා බින්දු පුතාට කැමතිද?''

''ඇයි නැත්තෙ. බින්දු ශාන්තාට කැමතියි කිව්වද?''

''ඒ ළමය එක පයින් කැමතියි''

''මම ඒ කාලෙ ඉඳන් හිතේ තියාගෙන හිටියෙ බින්දු ගැන තමා'' ඇල්කඩුව මහත්මිය ගේ මුහුණ සතුටින් ඉපිලී ගියේ ය.

''අපි හෙට ඉතුරු ටික කතා කරමු. මම දූන් ඇඳට යන්න ඕනැ. පාලි මොකද ළමයො ඇහැරිල ඉන්නෙ. ගිහින් නිදගන්න''

''මේ වැඩෙ නිසා පොඩි කෙල්ල බිය වෙලා වගෙ'' පාලි පිටව ගිය පසු ඇල්කඩුව කීවේ ය.

පාලි කඩිනමින් සොයුරිය නිදන කාමරය වෙත දුව ගියා ය. දුස් පියාගෙන සිටියද ශාන්තා නිද සිටියේ නැත. අම්මයි තාත්තයි ලෑස්ති වෙන්නෙ බින්දුට ශාන්තාව බන්දල දෙන්න. ඒකට ශාන්තා සතුටු උනොත් ඒ එයා ගෙ අවාසනාව තමා. පව් දෙයියනේ. පාලි ඇඳේ සිටින සොයුරිය වෙත ගොස් පහත් වී ඇගේ කම්මුල මත සිය මුහුණ තැබුවා ය.

www.sinhalalibrary.com

''අඩන්න එපා අක්කා. අඩල මොනවත් කරන්න බැහැ නෙ''

''පාලි හොඳ නංගි වාගෙ මට මෙහෙම ඉන්ඩ දෙන්න''

''මෙහෙම ඉන්න දෙන්න. ඒක මට කරන්න බැරි දෙයක්. මට ඔයාට රහසක් කියන්න තියෙනව''

''මොකද්ද?''

පාලි ශාන්තා ගේ කණට ළංවී රහස පැවසුවා ය.

''මොනව ඩීන්දු එක්ක මම යන්න?''

''හෙමින් කතා කරන්න. අන්තිමට ගෙදර කතා වෙන දෙයක් වත් මට හොයා ගන්න බැරි වෙයි''

''ඒක හරි මනමාල මිනිහෙක්. ඩැඩි උගෙ හැටි දන්නව නම් මාව නෙමේ නරහ කාරයෙක් වත් කසාද බඳිනවට කැමති වෙන එකක් නැහැ''

''ඒක හරි වල් මිනිහෙක් අක්කෙ. දවසක් මතකද අපි පැමිලි එකම පින්තූර බලන්න ගියා. පින්තූරෙ බලද්දි ගවුම අස්සෙන් අත දල මගෙ කකුල අත ගෑවා. පස්සෙ මං අම්ම ඉන්න තැනට ගියා. එදයින් පස්සෙ මම උගෙ මූණ දිහා බලන්නෙ වත් නැහැ''

''ඉතින් ඉතින් වෙන මොනවද කිව්වෙ?''

''හෙට අනිද්ද දිහාවෙ ඒ ගැන තීරණයක් ගනීවි''

''ඔයාට ස්තූතියි නංගී''

''හොඳයි අපි හෙට උදේ කතා කරමු. ඊට කලින් මොනවක් කියන්න තියෙනවද?''

''මහු''

පාලි සොයුරියගෙන් සමුගෙන කාමරයට වැදුනා ය.

www.sinhalalibrary.com

# 10

පසු දින රවි ඇල්කඩුව මහතා ගේ නිවසට පිවිසියේ තැතිගත් හදවතින් යුතුව ය. වෙනදා මෙන් කාර්යාලයට නො ගොස් ඔහු මිදුලේ ඒ මේ අත කරකැවෙමින් සිටියේ ය. හෙක්ටර් හා ප්‍රින්ස් ඉස්තෝප්පුවට පැමිණ කිප වරක්ම බලා ගියේ ය. සිරිසේන දුකින් යුතුව රවි දෙසට ආවේ ය. ඔහු ගේ මුහුණ වියලී ගොස් ඇත.

''සර් ඇල්කඩුව මහත්තය ගේ ඇතුලට එන්න කිව්වා''

''හොඳයි සිරිසේන යන්න. මම එන්නම්''

රවි නිහඬව නිවසට ඇතුල් වූනි. ඔහු කෙලින්ම ඇල්කඩුව මහතා ගේ කාමරයට ගියේ ය.

''සර් මට කතා කළාද?''

''ඔව් රවි ඇතුලට ඇවිදින් ඉඳ ගන්න. කමක් නැහැ මෙතනින් වාඩි වෙන්න'' ඔහු හුවපහසු අසුනක් දක්වමින් කීවේ ය.

පරිසරයේ දැඩි නිහඬ බවක් ඇති වුනි. සිය හෘද ස්පන්දනය වැඩි වී ඇතැයි රවිට සිතෙයි. දැන් ඇල්කඩුව

www.sinhalaelibrary.com

තමාට හිතිනු ඇතැයි ඔහුට සිතුනි. ඉහළ උසාවියේදී දක්ෂ නීතිවේදියෙක් වූ ඔහුට තමම ප්‍රශ්නය ආරම්භ කිරීමට බැරි ඇයි? නළලත හා ළය ඩාදියෙන් තෙත් වී ඇත. ඇල්කඩුව උපැස් යුවල ගලවා මේසය මත තැබුවේ ය.

''රවි දූන් මා ළඟ වැඩට ඇවිදින් කොච්චර කල් වෙනවද?''

''ජූලි පළවෙනි දට අවුරුදු තුනක් වෙනව''

''අවුරුදු තුනක්. ඔව් ඒක දිග කාලයක්''

ඔවුනතර යලි නිහඬ බවක් ඇති වූනි.

''මම අද රවිට එන්න කිව්වෙ ඉඩම් නඩු, බෙදුම් නඩු, මිනී මැරුම් නඩු වල පිටපත් පරිවර්තනය කරන්න නෙමේ. ඊට වඩා වැදගත් රවිගෙයි මගෙයි ජීවිත වල තීරණාත්මක අවස්ථාවක් ගැන යුක්ති සහගත විනිශ්චයක් ලබා ගන්නයි''

හෙක්ටර් හා ප්‍රින්ඩි කාමරයට පැමිණ අසුන් ගත්හ.

''මෙලින් කතා කරන්න රවි. ශාන්තා එක්ක මොනවත් සම්බන්ධයක් තියෙනවද?'' ඔහු ප්‍රශ්නය නැගූ වේගවත් හඬින් රවි එකවරම තිගැස්සුනේ ය.

''කතා කරන්න. ශාන්තා එක්ක යාලු කමක් තියෙනවද?''

''ඔව්''

''ඇයි එහෙම දේකට පෙළඹුනේ?''

''මට ඒ ප්‍රශ්නෙට හරියට උත්තර දෙන්න බැහැ''

''රස්සාවක් නැතිව රස්තියාදු වෙවී ඉන්න කොට මම කළ උදව් හින්දද මේ වගෙ කරදරයක් මගෙ පපුවට දෙන්නෙ?''

''ඇයි අපේ පවුලට මේ වගෙ අවනම්බුවක් කළේ?''

''මෙක හරියට අපෙන් පලි ගන්න අපේ පවුල්වලට මඩ ගහන්න කළ දෙයක් වගේ'' හෙක්ට උස් හඬින් කිවේ ය.

''මේ අවුරුදු තුන ඇතුලත මම උඹට හොඳ පඩියක් ගෙව්ව නේද මිනිහෝ?''

''සර් මම ඒ පඩිය ගත්තෙ පඩියටත් වඩා වැඩ කරලයි'' රවි කතා කළේ දූඩි සිතින් යුතුව ය.

''දැක්කද ඩැඩී කතාවක තරම'' හෙක්ටර් කිවේ ය.

''මම කිව්වෙ ඇත්ත''

''තමුසෙ ගෙ කට වැඩියි හාදය. මම මෙච්චර කල් ඉවසුවෙ තාත්ත මෝඩකමට හැම දෙයක්ම වැදගත් විදිහට කරන්න හදන හින්දයි. තමුසෙ හෙක්ටර් අඳුනනවද?''

''තමුසෙ හෙක්ටර් නෙමේ වික්ටර් උනත් මට කමක් නැහැ අයියෙ. මට අවවාද කරන්න තමුසෙ කවද?''

''මම නම් උඹ ගෙ බොස් ගෙ දුව බැඳල ඉන්නෙ. මේ ගෙදර වැඩ කටයුතු හොයල බලන්න මට අයිතියක් තියෙනව''

''දුව බැඳගත්ත නම් ගිහින් දුව හද ගන්නව''

''නරිය'' හෙක්ටර් දත්කුරු සැපුවේ ය.

''වැදගත් විදිහට කතා කරනව හෙක්ටර්. තමුයෙ නරිය බව මම දන්නව''

''නිශ්ශබ්ද වෙයල්ලා'' ඇල්කඩුව මේසයට ගසා කෑ ගැසුවේ ය.

‘‘සර්. සර් මට ගැහුවත් ඉවසනව. මෙයාට බැහැ මට අවවාද කරන්න’’

‘‘ඩැඩී ඔය කියන්නෙ අහගන්න’’ ප්‍රින්සි රතු වූ මුහුණින් යුතුව කීවා ය.

‘‘ප්‍රින්සි කරුණා කරල ඔය දෙන්න නිශ්ශබ්ද වෙන්න’’

හෙක්ටර් කෝපයෙන් සැලෙමින් දුම් වැටියක් දල්වා ගත්තේ ය.

‘‘මට රස්සාවක් නැති වෙලා ඉන්න කොට සර් මට කළ උදව් මම අමතක කරන්නෙ නැහැ. මම නියම ස්වාමියෙක් විදිහට ගෞරව කරනව’’

‘‘සර්ට ගෞරව කරන හින්ද වෙන්න ඇති මේ පාදඩ වැඩේ කළේ’’

රවි හෙක්ටර් දෙස රවා බැලුවා විනා කතා කළේ නැත. කාමරයෙන් නැගුන ඝෝෂාව නිසා ඇල්කඩුව මැතිනියද ඇල්කඩුව සිටි තැනට ගියා ය.

‘‘සර් මාව මෙච්චර වෙහෙසන්න ඕනැ නැහැ. ඔය ලැස්ති වෙන්නෙ මට රස්සාවට එන්න එපා කියන්න නෙ’’

‘‘ඒක වෙනම කතාවක්. රවී මගෙ දුව එක්ක තියෙන සම්බන්ධකම නැති කරල දාන්න ඕනැ. මට ගෞරව කරනව නම් මා වෙනුවෙන් රවිට කරන්න තියෙන්නෙ එච්චරයි. මම වෙන කිසි දෙයක් ඉල්ලන්නෙ නැහැ. ඒකට වන්දි වශයෙන් මොනවද ඕනැ. සල්ලි ඕනැද. සල්ලි කොච්චර ඕනැද?’’ ඇල්කඩුව අවසන් වචන කීවේ ගොත ගසමිනි. ඔහු ගේ දෙනෙතේ කඳුළු රැඳී තිබෙනු රවිට පෙනුනි.

‘‘සල්ලිද?’’ රවි සෙමින් සිනාසුනේ ය.

www.sinhalelibrary.com

''ඔව්. සල්ලි තමයි. කොච්චර ඕනැද?'' ඇල්කඩුව මැතිනිය දැඩි උද්යෝගයෙන් කතා කර රවි ගේ මුහුණ දෙස බලා සිටියා ය.

''මට සල්ලි එච්චර වටින්නෙ නැහැ නෝනා. අන්න අර වගෙ මිනිසුන්ට සල්ලි දෙන්න. මට සල්ලි එච්චර ලොකු නැහැ''

''මොනවද යකෝ කිව්වෙ?'' හෙක්ටර් කෑ ගසමින් ඉදිරියට පැනීමට සූදානම් වන විට රවිද අසුනෙන් නැගී සිටියේ ය. ප්‍රින්සි හඬමින් සැමියා අල්වා ගත්තා ය.

''අනේ ඉවසන්න හෙක්ට. ඔයා......'' ඇය ඔහු අල්වා ගෙන හඬන්ට සූදානම් වන විට හෙක්ට යළි අසුන් ගත්තේ ය.

''සර්''

''මට සර් කියන්න එපා. ඔබ දැන් මගෙ සේවකයෙක් නොමේ. සාමාන්‍ය විදිහට මට ඇල්කඩුව කිව්වට කමක් නැහැ''

''හොඳයි ඇල්කඩුව මහත්මයාණෙනි මට ඔබෙන් එක තඹ දෙයිකුවක් එපා. මම අවුරුදු තුනක් තිස්සේ ඔබේ දුවට ආදරය කළා. අද ඒකෙ තීරණාත්මක දවස. ඔබ කෝටි පතියෙක් උනත් ඔබේ දුවට ආදරය නොකරන්න තරම් මගෙ හිත දුප්පත් නැහැ. ඒත් මම ඔබට එක අවස්ථාවක් දෙනව''

''මොකද්ද ඒ?'' ඇල්කඩුව රවි දෙස බැලුවේ ය.

''මම ඔබේ දුවගෙන් වෙන් වෙන්න කැමතියි''

ඇල්කඩුව මහතා ඇතුළු සැම දෙනාගේම මුහුණු නිවී ගිය බවක් පෙනුනි.

''මම වෙන් වෙන්නෙ ඔබේ දූව ශාන්තා මෙතෙන්ට ඇවිදින් මගෙන් වෙන් වෙන්න කැමතියි කිව්වොත් විතරයි. නැතුව මට බැහැ තනියම තීරණයක් ගන්න. අපි දෙන්න අවුරුදු ගානක් ඇසුරු කළා. නිවටයෙක් වගෙ තනියම තීරණයක් ගත්තොත් ශාන්තා මා ගැන මොනව හිතයිද?''

රවි ගේ කතාවෙන් යළි ඇල්කඩුව ගේ මුහුණ අඳුරු වී ගියේ ය.

''අද ඉඳල මම මෙහෙ සේවකයෙක් නෙමෙ. මම දැන් කාමරේට ගිහින් මගෙ ඇඳුම් පොත් පත් ලෑස්ති කර ගන්න ඕනැ. මම තව හරියට පැය භාගයකින් ශාන්තා ගෙන් පිළිතුර ගන්න එනවා'' රවි හෙක්ටර් දෙස මඳ වේලාවක් බලා සිට කාමරයෙන් පිට වී ගියේ ය.

රවි පිට වී ගිය වහාම ඇල්කඩුව හිසේ දෑත් ගසා ගෙන දෑස් පියා මඳ වේලාවක් නිහඬව සිටියේ ය.

''ප්‍රින්සි'' හෙක්ට කතා කළේ ය.

''ඇයි?''

''දැන් ඉතින් බලා ඉඳල වැඩක් නැහැ. අරූ තව පැය භාගයකින් එයි. ඔයයි අම්මයි ගිහින් කොහොම හරි ශාන්තාව කැමති කරව ගන්න. ඊළඟට මම එන්නම්. ඒත් බැරි උනොත් ඩැඩී එයි. දූත් ඩැඩීට ටිකක් විවේක ගන්න ඉඩ දීල අපි යමු'' හෙක්ටර් අසුනෙන් නැගිට කාමරයෙන් පිටව ගියේ ය.

''හොඳින් කියල බලන්න. බැරි වුනොත් ගහල තරවට්ටු කරල හරි අරූගෙන් වෙන් වෙන්න කැමතියි කියව ගන්න ඕනැ. මමත් පැත්තකින් ඉන්නම්'' හෙක්ටර් ඔවුන්ට උපදෙස් දෙමින් ශාන්තා ගේ කාමරය දෙසට ගියේ ය.

ඒ වන විට ශාන්තා ඇදේ හාන්සි වී කල්පනා කරමින් සිටියා ය. රවි පැමිණ සිටි බව ඇය දැන ගන්නට ඇත. ඔහුට කරදරයක් වේදෝ යන බියෙන් ඇය හැඬුවා විය හැක.

ප්‍රින්සි දුටු සැණින් ශාන්තා කඳුළු පිසදමා ගත්තා ය.

''ශාන්තා මේ බලන්න නංගි. මෙයි අම්මෙයි ආවෙ ඔයා එක්ක වැදගත් කාරණයක් කතා කර ගන්නයි''

ශාන්තා වරළස අතින් සකස් කර ගත්තද යළි එය ඇගේ මුහුණට වැටුණි.

''ඔයා දන්නවනෙ නංගි අම්මල තාත්තල අපිට ආදරේ කරන හැටි''

''ඉස්කෝලෙ යන කාලෙදී තරුණ වයසෙ ළමයි මේ වගෙ සම්බන්ධකම් ඇතිකර ගන්නව. කාඩ කොල්ලො හිතල මතලම ගෑනු ළමයි අමාරුවෙ දන්න මේ වගෙ වැඩ කරනව. මේ මෝඩ වැඩ හින්ද මේ ගෙදරට මොකද වෙලා තියෙන්නෙ. ඩැඩී හැමදම කනම්දය වාගෙ බීගෙන. කාටවත් කෑමක් බීමක් හිතේ සන්තෝසයක් නැහැ''

''අක්ක කියන්න තියෙන දෙයක් කෙටියෙන් කියන්න. මට මොනවද කියන්න ඕනැ?''

''ඔයා රවි එක්ක සම්බන්ධයක් තියෙනව නේද?''

''ඔව්. මම ඊයෙ මම් එක්ක කිව්ව''

''ශාන්තා මේ අහපං මගෙ දුවේ. උඹ ඔය සම්බන්ධෙ නතර කරනව කියල, උඹ මේකට අකමැතියි කියල රවිට කියපං''

''නතර නො කළොත් වැඩ දිග් ගැහෙන්න ඉඩ තියෙනවා'' හෙක්ටර් පසෙක සිට කීවේ ය.

''ඒ මොකද?''

''ඒව දැන්ම කියන්න ඕනෑ නැහැ''

''හෙක්ටර් අයිය ඔයා තරහ නැතිව නිශ්ශබ්ද වෙලා ඉන්න''

''මොකද එයාට නිශ්ශබ්ද වෙලා ඉන්න කියන්නෙ. උඹල ගෙ හැම කටයුත්තකටම තාත්ත වාගේ ඉදිරිපත් වෙලා කටයුතු කරන හින්දද මෙහෙම කතා කරන්නෙ. මම උඹේ අක්ක විත්තිය අමතක වෙලාද?''

''මම ඒ ඔක්කොම පිළි ගන්නව අක්කෙ. ඒ උනාට මොනව හරි කියන පිළිවෙලක් තියෙනව''

''මොකක්ද බොල කියන පිළිවෙල? මගෙ මහත්තය මේ ඉලව් ගෙදර නෙමෙ රජ ගෙදර උනත් තියන්න පුළුවන් කෙනෙක්. ඔයිට වඩා මැති ඇමතිවරුන් උපදෙස් ගන්න එන්නෙ එයාගෙන්. කෑම දිරවන්න නෙමේ එයා මං හින්ද එනව මීසක්''

''ප්‍රින්සි දුවේ ඔච්චර හයියෙන් කෑ ගහන්න එපා. මිසිස් සමරනායකට කනේ තිබ්බ වගෙ ඇහෙනව''

''අහල පහළ මිනිස්සු හිනාහ වෙන දවස වැඩි ඈත නැහැ අම්මෙ''

''දුවේ ශාන්තා ඇයි උඹ අපිට තමච්චර දුක දෙන්නෙ?'' මව කතා කළේ නෙත් වූ දෑසින් යුතුව ය. ඇය ඉවත හැරී හඬන්නට වූවා ය.

''මගෙන් වරදක් උනා නම් සමාවෙන්න අම්මෙ. මේ දෙන්නට යන්න කියල අපි දෙන්න විතරක් කතා කරමු''

''ප්‍රින්සි එළියට එනව'' හෙක්ටර් කෑ ගැසුවේ ය.

ඔවුන් කාමරයෙන් ගිය පසු ශාන්තා මව දෙස බලා සිටියා ය.

''අපි දූන් රවි එක්ක කතා කළා. ඒ ළමය කියනව ඕනැම් වෙලාවක ඒ අදහස අතහරින්න කැමතියි දූව වෙන් වෙන්න සතුටුයි කිව්වොත්''

''මොනව අම්මෙ රවි එහෙම කිව්වා''

''ඔව් එහෙම කිව්වා. මේ දූන් කිව්ව මව උද්යෝගයෙන් යුතුව කීවා ය.

''මට රවි අමතක කරන්න බැහැ අම්මෙ''

''ඇයි බැරි?'

''මට එයා අමතක කරන්න බැරි හේතු තියෙනව''

''මොනව'' මව කතා කළේ හඬන ස්වරයෙනි. ඇය හඬන්නට වූවා ය. ශාන්තාට හැඬුනේ හදවතෙහි වූ වේගය ඉවසා දරා සිටීමට අසීරු වූ හෙයිනි.

''රවි නිසා උඹට මොනවත් උ..........උනාද?''

මව ඇසූ ප්‍රශ්නය ඇයට පැහැදිලිව ඇසුණේ නැත. ඇය හිස වැනුවා විනා පිළිතුරු දුන්නේ නැත.

''ඔව් අම්මෙ'' ඇය කඳුළු සලමින් කිවේ ප්‍රශ්නය පැහැදිලිව වටහාගෙන නොවේ. ඇය අදහස් කළේ රවි හා තමා අතර අවුරුදු ගණනක සිට ඇති සෙනෙහසත්, ඔහු දුප්පත් වුවත් කිසිවෙකුට බිඳලිය නො හැකි තරම් නිරසාර බවත්, ඔහු නියම මිනිසෙකු බවත් පැවසීමට ආපසු හැරුනද මව පෙනෙන්ට සිටියේ නැත. යාබද කාමරයේ සිට වැලපෙන මව ගේ කට හඬ ඇයට ඇසෙයි.

www.sinhalaelibrary.com

එහෙත් ඇයට කාමරයෙන් පිට වීමට සිතුනේ නැත. හදවතේ වූ වේදනාව දෙනෙතින් පිට වෙයි. මව ගේ හැඬුමට ප්‍රින්සි අක්කා ගේ හැඬුමද එක් වුනි. ඔවුන් නිහඬ කිරීමට වෙහෙසෙන හෙක්ටර් ගේ හඬත් එක් වී ඇත. එකවරම නිහඬ බවක් ඇති වුනද වරින් වර මව ඉකි ගසන හඬ ශාන්තාට ඇසෙයි.

ඇල්කඩුව බිරිඳ ගේ කාමරයට පිවිස ඉන් පිටත ආවේ ය. ඔහු කාමරයේ ඒ මේ අත සක්මන් කළා විනා කිසිවෙක් සමඟින් කතා කළේ නැත.

''සරා ඔය ඇඩිල්ල නවත්ත ගන්නයි කිව්වෙ.......... තවත් ලෝකය හිනස්සන්න හදනව''

ඇල්කඩුව ආලින්දයට පැමිණ ඒ මේ අත ඇවිදින්නට පටන් ගත්තේ ය. ඇල්කඩුව මැතිනිය යළි උස් හඬින් හඬන්ට වූවා ය.

''කව්ල පොව්ල හදල වඩල මට උඹ මෙව අහන්න සිද්ද කළා''

ප්‍රින්සි හෙක්ටර් සමඟින් රහස් සාකච්ඡාවක යෙදෙමින් සිටියා ය.

''අම්මට ඔහොම සෑ ගහන්න එපා කියන්න ප්‍රින්සි. අල්ලපු ගෙදර මිනිස්සු බලාගෙන ඉන්නව''

''අනේ මන්ද හෙක්ට. මේ වගෙ ලජ්ජාවක් නම් අපි කවදවත් විදල නැහැ. විජ් විතරක් පර බැල්ලි. මම්ටයි ඩැඩීටයි දෙන මේ වදේට ඕකිව කවදවත් හරියන්නෙ නැහැ''

''ඔයා ගෙ කට මමී ගෙ කටට වඩා අන්තයි ප්‍රින්සි. ටිකක් හෙමීන් කතා කරන්න''

''එන්න හෙක්ට අපි කාමරේට යමු'' ප්‍රින්සි කාමරයේ ඇඳ උඩ ඉඳ ගත්තේ දැඩි වෙහෙසකින් යුතුව ය.

www.sinhalalibrary.com

''නංගි මොනවද ඔම්ට කියල තියෙන්නෙ?''

''එයා..........එයා අනාථ වෙලා'' ප්‍රින්සි හෙක්ටර්ට කීවේ කඳුළු සලමිනි. ඇගේ කතා වෙන් හෙක්ට තිගැස්සුනි. ඔහු වචන ගලපා ගත නො හැකිව මුව අයා බිරිඳ දෙස බලා සිටියේ ය.

''ශාන්තා කියලද?''

''ඔව්''

''දෙයියනේ මොන නැස්පැත්තියක්ද මේකි මේ කර ගත්තෙ. ඩැඩී දන්නවද?''

''නුවම නැහැ. අනේ හෙක්ට තුවක්කුව ගලෝල දන්න''

හෙක්ටර් තුවක්කුවේ පතරොම් ඉවත්කර මඳ වේලා වකට පසු ඇල්කඩුව හමුවීමට ගියේ ය.

''ඒ වන විට ඇල්කඩුව සැප පුටුවට වී ඉහ අත්බැද සිටියේ ය.

''හෙක්ට ශාන්තා මොනවද කියල තියෙන්නෙ?''

''අනේ ඩැඩී මම මේක කොහොම කියන්නද මන්ද''

''ඇයි හෙක්ට?''

''ඩැඩී කලබලයක් කරන්නෙ නැහැ කියල පොරොන්දු වෙන්න'

''නෑ හෙක්ට. මාව විශ්වාස කරන්න''

හෙක්ට ප්‍රින්සි පැවසූ කතාව ඇල්කඩුව මහතාට පැවසුවේ ය. මුව අයා එම පුවත අසා සිටි ඔහු ගේ පෙනුම සැණින් වෙනස් වී ගියේ ය. එහෙත් ඔහු වචනයකුදු කතා කළේ නැත. ඔහු ගේ මුහුණ අසරණ බවින් පිරී ගියේ ය.

www.sinhalaelibrary.com

''හෙක්ට නව ටිකකින් මාව හමුවෙන්න එන්න. මට ටිකක් විවේක ගන්න ඕනෑ'' ඔහු දුබල හඬින් පැවසුවේ ය. හෙක්ටර් ගිය පසු දොර ජනෙල් වැසූ ඔහු දැඩි කල්පනාවකට මැදි වුනි. දෙනෙත් කඳුලෙන් පිරී යනු ඔහුට දැනෙයි. 'මම දරුවො හැදුවෙ මේව අහන්නද?' රේඩියෝව දැමූ පසු කාමරය පුරා පැතිර ගිය හඬවල් ඔහු දෙසවනට දැනුනේ නැත. ඔහු ගේ හැඬුම ඉකියකට පරිවර්තනය වුනි. ඇල්කඩුව කාමරයට වී කුඩා දරුවෙක් මෙන් හැඩූවේ ය.

ජීවිත කාලය තුළ කඳුලක පහස නො ලද දෙනෙත් ඇල්කඩුව ගේ දුක සමනය කළේ නැත. කිසියම් ප්‍රශ්න-යක් පිළිබඳව පැහැදිලි තීරණයක් ගැනීමට ඔහුට පුළුවන් වූයේ නැත. ශාන්තා රවි ගේ කාමරයේ සිට පැමිණි හැටි ඔහුට සිහි වුනි. මෙලෙස ඔවුන් කී වතාවක් නම් හමුවන්ට ඇද්ද.

හෙක්ටර් කීප වරක් දොරට තට්ටු කළද පිළිතුරක් ආවේ නැත. ඔහු බෙහෙවින් බිය වුනි. ඔහු කෑ ගසමින් දොරට ගැසුවේ ය. නින්දෙන් පිබිදුන අයෙක් මෙන් ඔහු දොර විවෘත කළේ ය. හෙක්ටර් ගේ මුහුණේ තිවුනු බවක් ඇති වුනි.

''ඩැඩී මම කරදරයක් කරනවද?''

''නෑ හෙක්ට. එන්න ඇතුලට''

යළි ඔවුනතර නිහඬ බවක් ඇති වුනි.

''හෙක්ට කියන්න තියෙන දෙයක් කෙටියෙන් කියන්න''

''මම අඳුනන ඩොක්ට කෙනෙක් ඉන්නව. මේ වැඩේ අපිට කරදරයක් නැතිව කරගන්න පුළුවන්''

www.sinhalalibrary.com

''ඒ මොකක්ද?''

''ඒ ඩොක්ට හරි විශ්වාසයි. මාස තුනක් උනත් කමක් නැහැ. මේක නැති වෙන්න බේතක් දෙන්න පුළුවනි''

''එපා හෙක්ට. ඒක හරි පාප කර්මයක්. ඒක වැරදුනොත් මේ කාලකන්නියවත් මැරිල යයි''

''එතකොට ඩැඩී මේ ගැන මොනවද කියන්නෙ?''

''මම කරන දේ තීරණය කරල ඉවරයි''

දොරට තට්ටු කරන ශබ්දයක් ඇසුනි.

''ඇතුලට එන්න'' ඇල්කඩුව දුබල හඬින් කීවේ ය. රවි ඇඳුම් බෑගයද අතැතිව කාමරයට ආවේ ය.

''ඉඳ ගන්න''

''ස්තුතියි'' රවි අසුන් ගත්තේ ය.

''දැන් රවි කොහෙ යන්නද කල්පනාව?''

''අද මට වැඩ ගොඩක් තියෙනව'' රවි, හෙක්ටර් දෙස බැලුවද ඔහු ඉවත බලා ගත්තේ ය.

''මම ඇහුවෙ යන්නෙ කොහෙද කියලයි''

''බෝඩිමට යනව''

''මම රවිට සල්ලිත් දෙන්න තියෙනව''

''ඒක පස්සෙ මගෙ නමට තැපෑලෙන් එවන්න''

''ආයෙ මේ පැත්තෙ නො එන්නද කල්පනාව?''

''මට එන්න එපා කිව්ව නෙ'' රවි ගේ මුහුණේ සිනාවක් නැගුනි.

www.sinhalelibrary.com

''අර ප්‍රශ්නය ඉවරයක් දකින්න ඕනැ. කෝ ශාන්තා තවම ආවෙ නැද්ද?''

''හෙට අපි ශාන්තාව රවිට විවාහ කරල දෙනව''

ඇල්කඩුව ගේ කතාව නිසා රවි පුදුමයට පත් වූහි. හෙක්ටර් රවි දෙස බලා අමනාපයෙන් ඉවත බලා ඇල්කඩුව දෙසට හැරුනි.

''ශාන්තා..........මට!''

''එහෙනම් වෙන කාටද? වෙන කව්රුත් ශාන්තාව් බඳින්න එන්නෙ නැහැ''

මේ විශ්වාස කළ නො හැකි පිළිතුර නිසා පුදුමයට පත් රවි කතා නො කර මඳ වේලාවක් සිටියේ ය.

''පුදුම වෙන්න දෙයක් නැහැ. හෙට තමුසෙ ශාන්තාව බඳිනව'' හෙක්ටර් කතා කළේ තරහෙන් යුතුව ය.

''මේ කතාව විශ්වාස කරන්න කියලද මට කියන්-නෙ?''

''මගෙ වචන දෙකක් නැහැ රවි. මතක තියා ගන්න ශාන්තාව බඳින්නෙ හෙට උදේ 9. 30 ට. ඒවට යන වියදම් ඔක්කොම මා ගානෙ. මෙන්න පසු ගිය මාසෙ පඩි සල්ලි''

''ස්තූතියි''

''දැන් ගිහින් ශාන්තා හමුවෙලා හෙට කරන්න ඕනැ දේවල් කතා කරගන්න''

රවි බැගය අනැතිව ඇල්කඩුව පසු පස ගියේ ය. මේ කිසිවක් තේරුම් ගැනීමට අසීරු වූ හෙක්ටර් පුටුවට වී

සිටියේ ය. ශාන්තා ගේ කාමරය අසලට ගියද ඔහුට මේ කිසිවක් තේරුම් ගැනීමට අසීරු ය. තමාගෙන් පළි ගැනීමට කරන ලද කුමන්ත්‍රණය කැයි වරෙක ඔහුට සිතුනි. එහෙත් ඇල්කඩුව ගේ කතාව ඔහු විශ්වාස කළේ ය. කාමරයට පිවිසි ඔහු දොර අඩවල් කර ශාන්තා දෙස බැලුවේ ය. කොට්ටයේ මුහුණ හොවා හඬන ශාන්තා දුටු ඔහු සිත තුළ ඇති වූයේ දැඩි සංවේගයකි. ඇයට මේ වේදනා හිමි වූයේ තමා නිසා නොවේද? ඔහු පහත් වී ඇගේ ගෙල සිප-ගත්තේ ය. එක වරම හිස එසවූ ශාන්තා වචනයකුදු නො දෙඩා ඔහු ගේ ගෙල බද හඬන්ට වූවා ය. එහෙත් තමා සිටින්නේ කොහි දැයි සිතුනු වහාම ඇය ඇඳෙන් නැගී සිටියා ය.

''රවී''

''ඇයි ශාන්තා?''

''යන්න රවී. අම්මල එයි. හෙක්ටර් එයි. ඒ අය ඔයාට කරදරයක් කළොත්''

''නෑ කෙල්ලෙ මම ඇවිදින් ඉන්නෙ ඒ ගොල්ලන්ගෙ අවසර ඇතිව''

''මම දන්නව. ඔයාට ආදරේ නැතැයි කියල මගෙ කටින් කියව ගන්න හේද රවී ඔයාට ඕනැ. ඒත් ඒ වචනෙ කවදවත් මම කියන්නෙ නැහැ. ඔයා කැමති තීරණයක් ගන්න. ඒත් මට ඔයා ඕනැ'' ඇය හඬමින් ජනේලය අසලට ගියා ය.

ඇය නිහඬ වන තෙක් රවී මඳ වේලාවක් සිටියේ ය.

''ඔයා කවදවත් එහෙම කියන්නෙ නැති බව මම දන්නව නේ''

''රවි මට ඔයා ආදරේද රවි?''

''ඔක මගෙන් අහන්න ඕන දෙයක්ද?''

''ගෙදර අය අපි දෙන්නට මේ දීල තියෙන්නෙ අවසාන හමුවීමද?''

''ඔව'' රවි සිනාසුනේ ය.

යලි ඇගේ දෙනෙත් කඳුලෙන් පිරී ගියේ ය.

''ශාන්තා''

''ඇයි රවි?''

''අපි දෙන්න හෙට උදේ 9. 30 ට බඳිනව''

''ඔයා මේ මොනවද කියන්නෙ?''

''මම කියන දේ විශ්වාස කරන්න ශාන්තා. ඩැඩී කිව්ව හෙට අපි දෙන්නට බඳින්න කියල''

''මොකද්ද රවි ඔයා මේ කියන කතාවෙ තේරුම?''

''තේරුම තමා කිව්වෙ''

''එහෙනම් ඔයා කියන්නෙ මේ කතාව මට විශ්වාස කරන්න ඕනැ කියන එකද?''

''සත්තෙන් ඔව''

එහෙත් ඇගේ මුහුණේ වූ අඳුර පහව ගියේ නැත.

''හොඳයි මොන විදිහකින් හරි අපි එක් වෙනව නේ. ඇත්තටම රවි ඔයා කියන්න මා ඔයා ගෙ සහකාරි කර ගන්න කැමතිද?''

''නැත්නම් මම මෙච්චර දුක් විඳිනවද? මේ කතාව මේ විදිහට කෙලවර වුනේ නැත්නම් අපි දෙන්නට යන්න තිබුනෙ හඳපානෙ. මම ඒකට ඔක්කොම ලෑස්ති කරලයි ආවෙ'' ඔහු සිනාසුනේය.

''හොඳ ළමය''

''හොඳ ළමය නෙමේ. අනික මේක සෙල්ලම් වැඩකුත් නෙමේ. ඔයා දන්නව ඇති මට ලැබෙන පඩිය. මේ වගෙ ක්ෂණික තීරණ වල ප්‍රතිඵල ඒ තරම් සුභ නැහැ''

''කමක් නැහැ රවි. මම ඔයාට හැමදාම කියනව නේද මම ජීවත් වෙන්න බය නැහැ කියල. ජීවත් වීම ගැන පූර්ව නිගමන ගන්න එපා කියල''

''එහෙනම් හෙට ඉඳල ජීවත් වෙලා බය නැතිකර ගන්න පුළුවන්. කැමතිද?'

''කැමතියි''

''හා හා මම එන්නම්''

''හා හා මම එන්නම්'' ශාන්තා සිනාසුනා ය.

''මාස ගානකට පස්සෙ යාන්තම් හිනාවක් දැක්ක'' රවි සිනාසුනේ ය.

''දැන් ඉතින් වෙන් ඉඳින්නද?''

''දැහලිල්ල එක පාරටම පටන් ගන්නද හදන්නෙ. අම්මල, තාත්තල, ඔක්කොම එළියෙ''

''අපි ඉස්සරත් කළේ එහෙම නෙ''

පාලි කතා කරන හඬ ඇසුන රවි නැගී සිටියේ ය.

''රවි ඔයා මේ දෙරට මුවා වෙන්න. මම නිදා ගන්නම්''

පාලි කාමරයට පිවිසියේ සිනාසෙමිනි.

''අක්කේ කෝ දෙන්න අත. ඉස්සෙල්ලම සුභ පැතුම් පිළිගන්න''

www.sinhalaelibrary.com

''මට කරදර කරන්න එපා නංගි''

''කරදර. උඹ හරි වාසනාවන්තියෙක් අක්කෙ. හෙට රවි එක්ක යන්න ඔයාට වාසනාව''

''මම එයාව හිතින් අමතක කළා''

''මොනව!''

''ඔව් නංගි මම හින්ද මොනවටද ගෙදර අය කරදර විඳින්නෙ. මම බින්දුට කැමතියි කිව්ව''

''මොනවටද ඔයා එහෙනම් රවි එක්ක යාලු උනේ? ඔයාට ලැජ්ජ නැද්ද අනේ''

''ඔයා රවිට කියන්න අපි සහෝදරයො වාගේ ආශ්‍රය කරමු කියල''

''ඔයා හිතින් කියා ගන්න''

පාලි ආපසු හැරෙන්නට සූදානම් වන විට රවි ඇගේ දෙනෙත් වැසුවේ ය.

''බින්දු ඔන්න නංගි ඔයාට බැන්න'' ශාන්තා සිනාසුනා ය.

''අත හරින්න මට යන්න''

''ඔන්න එහෙනම් බලා ගන්නවා''

ශාන්තා සිනාසුන පසු රවි ඇගේ දෙනෙත් මිදුවේ ය.

''අනේ අනේ මාව රවට්ටපු හැටි. ඉඳා උඹට'' පාලි රවි ගේ උරහිසට පහරක් ගසා ඔහු ගේ අත මිරිකා ගත්තා ය.

''පොඩි මස්සිනේ මෙන්න මගෙ සුභ පැතුම'' ඇය සිනාසෙමින් කාමරයෙන් දුව ගොස් මඳ වේලාවකට පසු රස කැවිලි බන්දේසියක් රැගෙන ආවා ය.

''දැන් හෙට මොනවද කරන්න තියෙන්නෙ?''

''මුදු මාල ගන්න නම් සල්ලි නැහැ''

''ඒව එපා රවි. අපි දෙන්නට එක් වෙන්න මාල මුදු ඕනැ නැහැ. මුදු දමගෙන කසාද බැන්ද බව පෙන්වන බාහිර සහතික මට එපා''

''තව එකක්. ඔයා සාමාන්‍යයෙන් අඳින ඇඳුම් හැරෙන්න හොඳ සාරි, රත්‍රන් විදි බඩු මොනවත් ගන්න එපා''

''නෑ මම මොනවත් ගේන්නෙ නැහැ''

''ඉතින් හෙට වෙනකල්..........''

''ආයුබෝවන්'' ශාන්තා රවි තුරුලට වී සිට ඔහු ගේ අත සිප ගත්තා ය.

''තව එකක් තියෙනව''

''ඇයි රවි?''

''පොඩ්ඩක් ඉඹල යන්න බැරිද?''

''හැබැයි කඳුලයි. මෙන්න මෙතන විනාඩියි''

''වෙන නැන් බැහැ?''

''දෙනව එකක්. මනමාලය''

රවි සිනාසෙමින් කාමරයෙන් පිට වී ගියේ ය.

හෙක්ටර් නිවසට ගියේ කලකිරුන සිතින් යුතුව ය. රවිට පාඩමක් ඉගැන්වීමට නො හැකි වීම නිසා සිත තුළ ඇති වූ කෝපය තවම ඔහු වෙතින් ඉවත් වී නැත. ශාන්තා රවි සමග විවාහ වන්නේ ය යන වචනය ඇසීම වත් ඔහු ප්‍රිය කළේ නැත. හෙක්ටර් සිතේ වේදනාව පහකර ගත්තේ ප්‍රින්සිට බැණ වැදීමෙනි. ප්‍රින්සි වෙනදා මෙන් හෙක්ටර් සමග වාදයට නො ගියේ ශාන්තාට සිදු වූ විපත සිහි කරමින් ඔහු නිතරම බැණ වැදුන බැවිනි.

''මා එක්ක කේන්ති අරගෙන මොනව කරන්නද හෙක්ට. ගෑනු ළමයි උනාම ටිකක් පරිස්සමින් වැඩ කරන්න දැන ගන්න ඕනෑ''

''මම ඔයාට බනින්නෙ වෙන දෙයක් හින්දා නෙමෙ. මම්ලට වඩා ඉගෙන ගත්ත ගෑනි නංගිල ගැන මට්ට ඇඩ්වයිස් දුන්නෙ නැත්තෙ ඇයි?''

''හෙක්ට මොනවද අනේ ඔයා මේ කියන්නෙ. අපි දන්නවද නංගියි රවියි මොනවද කළෙ කියල''

''ඕකි රෑට රෑට රවි ඉන්න කාමරේට යන්න ඇති''

‘‘අපි ඕව දන්න එකක් නැහැ’’

‘‘හැම පිරිමියම අපි වාගෙ හොඳ නැහැ’’

‘‘අනේ මගෙ කට අවුස්ස ගන්න එපා. බඳින්න ඉස්සර මගෙ කාමරේට රිංගගෙන කරපු දේවල්..........එනව දූන් හොඳ මිනිහ වෙන්න. කොයි පිරිමියත් එකයි’’

‘‘ඒවට ඔයත් සතුටු උනෙ’’ හෙක්ටර් සිනාසෙමින් කීවේ ය.

‘‘ඒ කතාවලින් දූන් වැඩක් නැහැ. දූන් ඒකී අපේ පවුලෙ කෙනෙක් නෙමෙ. ඕය තියෙන දේකින් තඹ සතේක දෙයක් දෙන්නෙ නැහැ කියල ඩැඩී කිව්වා’’

එම කතාවෙන් හෙක්ටර් ගේ සිතට තරමක සහනයක් දැනුනි. ශාන්තාට කොටසක් නො දුන්නොත් එය පවුලේ ඉතිරි අයට බෙදී යනවා ඇත. එවිට ප්‍රින්සිටද කොටසක් හිමි වෙයි. කොළඹ පිහිටි ගෙය හා ඉඩම ලැබුනොත්. ඔහු කල්පනා ලොවේ තනි වී සිටියදී ටෙලිපෝනය නාද වුනි.

‘‘ඔව් ඩැඩී හෙක්ට කතා කරන්නෙ. දූන් හෙට වැඩ කටයුතු කොහොමද?’’

‘‘මොනවද වැඩ කටයුතු. මම රෙජිස්ටර්ට කිව්ව, හෙට උදේ උන් දෙන්නව බන්දල දයි. හෙක්ට සාක්කි යට අත්සන් කරන්නෙ කව්ද?’’

‘‘අනේ ඩැඩී මම නම් එන්නෙ නැහැ’’

‘‘මම දූනාට කිව්වෙ නැහැ’’

‘‘රවී ගෙ ගෝලය සිරිසේනට කියමු’’

www.sinhalalibrary.com

"ඕ..........හරි. කොහොම උනත් හෙට උදෙන් ප්‍රින්සිත් එක්ක එන්න"

"මම උත්සාහ කරල බලන්නම්"

ඇල්කඩුව තවම නිදි නැත. ඔහු රාත්‍රී ආහාරය වශයෙන් කිසිවක් කෑවේ නැත. විස්කි බෝතලය නො තිබුනා නම් මෙතරම් වත් කරදරවලින් ගොඩ ඒමට ලැබෙන්නේ නැත. වරෙක ඔහු ගේ දෙනෙත් කඳුලෙන් තෙත් වෙයි. ශාන්තා ලැබෙන්ට රෝහලට ගිය බිරිඳට අමාරු වූ අවස්ථාවේ එළිවන තෙක් රෝහල අසලට වී සිටි අයුරු ඇල්කඩුවට සිහි වෙයි. දොස්තර වරුන් ගේ දක්ෂකම් වලින් ශාන්තා ගේ ජීවිතය බේරා ගත් හැටි ඔහුට සිහි වෙයි. කුඩා වියේ ඇය නිද ගත්තේ ඇල්කඩුව ගේ තුරුලේ ය. එද කී සුරතල් වදන් ඔහුට ඇසෙන්නාක් වැනි ය. අනිත් දූ වරුන්ට වඩා වෙනස් ගති පැවතුම් ඇති ඈ සිය සහකරු වශයෙන් රවී තෝරා ගත් හැටි. ඔහු නිසා අනාථ වී තම අනාගතය විනාශ කරගත් අයුරු. 'දුවෙ.....' ඇල්කඩුවට ඉකි ගැසුනේ ය. දෑතින් මුහුණ වසා ගත් ඔහු කඳුළු පිසදමා බිරිඳ සිටින කාමරයට ගියේ ය. නිවස ගිලගෙන තිබුනු අඳුරු වලාවන් ඝණ වී දිස් වෙයි බිරිඳ ගේ කාමරය අසලට ගිය ඔහුට ඇය වැළපෙන හඬ ඇසෙයි. ඇල්කඩුව බිරිඳ ගේ කාමරයට පිවිස ඇඳ කෙලවරේ අසුන් ගත්තේ ය. ඔහු වචනයක් ගලපා ගත්තේ සෑහෙන වෙලාවක් ගත වූ පසුව ය.

"අඬල වැඩක් නැහැ සාරා. මේ ඒකි ලබා උපන් හැටි"

"අනේ දෙයියනේ මෙව දකින්ට නැතිව. අහන්ට නැතිව, මාව මැරිල ගියා නම් ඉවරයි"

''මෝඩ කතා කියන්න එපා. අපිට තව දරුවො දෙන්නෙක් ඉන්නව නේද? හිත හදා ගන්න. අපි ඒකි මළා කියල හිතමු''

''ඔයාට එහෙම කරන්න පුළුවන්ද විල්සන්?''

''ඔව් මට පුළුවන්. ඔයාට කලින් මාව මළොත් මගෙ මළගමට වත් ඔකිව ගෙන්වන්න එපා''

''ඒත් මම අම්ම කෙනෙක්. ඉපිල, වඩල, හදල ලොකු කරපු මේ හැම එකෙක්ම මගෙ දරුවො. මොන දේ කළත් මගේ හිතේ තියෙන්නෙ කාටත් සමාන ආදරයක්''

''කරුණාකරල නිශ්ශබ්ද වෙලා නිදා ගන්න. හෙට උදේ ඔයා කච්චේරියට යනවද?''

''ඔව්'' ඇය කතා කළේ හඬමිනි.

සැමියා ගිය පසු ඇල්කඩුව මැතිනිය දූස් පියා ගත්තද එළිවන තෙක් ඇය වෙත නින්ද ළඟා වූයේ නැත.

එදින පාලිකා නිදා ගත්තේ ශාන්තා සමඟිනි. අතීතය සමරමින් ඔවුහු කඳුළු සැලූහ. මැදියම් රැයෙහිදී ශාන්තාට යාන්තමින් නින්දක් ලැබුණි. නිදා ගත් මඳ වෙලාවකින් ඇයට පිබිදෙන්ට සිදු වූයේ පාලි ඇය පුබුදු කළ හෙයිනි.

පසු ගිය උපන් දිනය වෙනුවෙන් රවී දුන් සාරිය හැඳ ගත් ඇ කණ්ණාඩිය ඉදිරිපස සිට ගත්තා ය. ඇයට ඇගේ ප්‍රතිබිම්බය පෙනෙයි. 'අනේ ශාන්තා උඹ අද මනමාලියක් නේද? කිසි දෙයක් නැහැ. හොඳ සාරි, සුදු වෙල් ඇඳුම්, මල් මේ මොනවත් නැහැ' ශාන්තා නිහඬවම තම රූපය දෙස බලා සිටියා ය. තේ පානය සඳහා ඇය එදින කාම–

www.sinhalalibrary.com

රයෙන් පිටත ගියේ නැත. සොයුරිය ගේ පෙරත්තය නිසා පාන් පෙත්තක් කෑවා විනා ඇයට කුස ගින්නක් දැනුණේ නැත.

එළිය වැටුන වේලේ පටන් නිවසේ පැවැතුනේ මුසල පෙනුමකි. ඇල්කඩුව රැවුල කැපීමට ගොස් නදබිල ලෙස මුහුණ තුවාල කරගෙන බෙහෙත් දමමින් සිටියේ ය. ඇල්කඩුව මහත්මිය සාරියකින් සැරසී අපූතාකට වී ශාන්තා ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියා ය. ඇගේ මුහුණ සෝ වලාවන් ගෙන් වැසී ඇත. ඈය වරින් වර සුසුම් හෙළමින් ළය සැහැල්ලු කරගන්නා ය. ඇල්කඩුව සාලයට පිවිස ඔර්ලෝසුව දෙස බැලුවේ ය. මඳ වේලාවකට පසු ශාන්තා සොයුරිය කැටිව කාමරයෙන් පිටත ආවා ය. ශාන්තා සෙමින් සෙමින් මව ඉදිරියට පැමිණ ඇය ඉදිරියේ දණ ගසා දෙපා සිප ගත්තා ය. "මට..........සමා වෙන්න අම්මෙ" ඇය වචන ගලපා ගත්තේ දැඩි අයාසයකිනි. දියණිය ගේ කඳුලෙන් දෙපා තෙත් වන බව මවට දැනුණි. මව එකවරම නැගී සිට ශාන්තා ගේ දෙවුරෙන් ඔසවා හඬමින් ඇය තුරුල් කරගත්තා ය.

"එපා දුවේ අඬන්න" ඇය හඬමින් කීවා ය.

"ඇයි උඹ මට මේ විත්තිය කලින් කිව්වෙ නැත්තෙ? එහෙම කිව්ව නම් මම උඹව මෙහෙම නෙමේ ගෙදරින්......"

"අඬන්ට එපා අම්මෙ. මා අතින් වරදක් උනා නම් මට සමා වෙන්න"

"උඹ යන තැනක ගිහින් හොඳින් හිටපං."

ශාන්තා මවගෙන් වෙන් වී පියා ඉදිරියේ දණ ගසා ඔහුට වැන්ද ය. ඇල්කඩුව වචනයකුදු කතා කළේ නැත.

ප්‍රියන්ති දැඩි සිතින් යුතුව ශාන්තාගෙන් සමු ගත්තා ය. නිවසේ සේවක සේවිකාදීන් ගෙන් සමු ගත් ශාන්තා අවසානයේ ගියේ කාමරයට වී කඳුළු සලන පාලි වෙත ය.

“අඬන්න එපා නංගි. මට ආයෙ කවදුවත් මේ ගෙදරට එන්න වෙන්නෙ නැහැ. ඒත් අපේ කවදුවත් වෙනසක් නැහැ”

“ඔයා කොහෙ හිටියත් මගෙ වෙනසක් නැහැ අක්කෙ. මට දුකයි. ඒත් රවී එක්ක යන එක ගැන මම කැමතියි”

“මම යන්නම් නංගි”

ශාන්තා පාලිගෙන් සමු ගෙන රථයට වැදී නිහඬව සිටියා ය. සොයුරි නිවසින් පිට වූයේ හිස් අතින් බව හැඟී ගිය හෙයින් පාලි විහාම මව් වෙත දුව ගියා ය.

“මමී ශාන්තා ඇඳුම් මොනවත් අරන් නැහැ”

“ඇයි එයා ගෙ ඇඳුම් එයාට ගන්න කියන්න”

පාලි වහාම රථය වෙත දුව ගියා ය.

“අක්ක ඔයාට අඳින්න ඇඳුම් ගන්නෙ නැද්ද?”

“හොඳ ඇඳුම් මොනවත් එපා. මමී කැමති නම් අහල අල්මාරියෙ වම් පැත්තෙ තියෙන ඇඳුම් ටික ගේන්න”

පාලි ආපසු දුව ගියා ය. ඇය ඇඳුම් බෑගය ගෙනවිත් රථයට දැමූ සැණින් රථය පිටත් වූනි. ශාන්තා ආපසු හැරී නිවස දෙස නො බැලුවේ සිත වාවාගත නො හැකි බව දන්නා හෙයිනි. ‘අද මගේ විවාහ දිනයට කවරුත් නැහැ. අම්මා, තාත්තා, අක්ක, නංගි සැමෝම අනැර අද මා යනවා. අද මා සමඟින් එන්නෙ තුන් දෙනයි. සිරිසේන නිහඬව රථයේ ඉදිරිපස අසුනේ සිටියි. රථය පදවා ගෙන

යන පියා ගේ මුහුණ වියළී ඇත. මව ගේ දෙනෙත් තවම වියළී නැත. කච්චේරියට පිවිසෙන විට ඉදිරි පස දොරටුව අසල සිටි රවි දුටු සැණින් ඇගේ දෙනෙතේ කඳුළු නැගුනි. විවාහය ලියා පදිංචි කිරීමට වැඩි වේලාවක් ගතවූයේ නැත. හෙක්ටර් පැමිණ සිටියද ශාන්තාගේ ශාක්ෂියට අත්සන් කළේ සිරිසේන ය.

අඹු සැමියන් වශයෙන් දිවුරුම් දුන් පසු රවි කාර්යාලයෙන් පිටත ඒමට ප්‍රථම ශාන්තාට කතා කළේ ය.

''යන්න කලින් මේ ඉන්න අයට කතා කරන්න''

''ඔයත් අම්මටයි තාත්තටයි කතා කරන්න ඕනැ. යමු දෙන්නම''

රවි ශාන්තා සමඟ ඇල්සඩුව මහතාට හා මැතිනියට ආචාර කර ඉතිරි අයගෙන්ද සමු ගත්හ. රථයට පිවිසුනද ශාන්තා ගේ ඇඬුම නතර වූයේ නැත.

''දැන් ඉතින් හොඳ ළමිය වගේ නාඬ ඉන්න ශාන්තා''

ඇය නිහඬව ලේන්සුවෙන් කඳුළු පිස දමා ගත්තා ය. උපේන්ද්‍ර ගේ නිවස වෙත යන විට ඔහු ඉස්තෝප්පුවට වී මග බලා සිටිනු රවිට පෙනුණි. ඔවුන් පැමිණෙන්ට ප්‍රථම ගාවින් පැමිණ සිටියේ ය. රෝහණ ශාන්තා ගේ බෑගය සාලයට ගෙන ගියේය.

''පිළි ගැනීමේ ගීත නැහැ. මල් වෙඩි නැහැ. නෑදෑයො නැහැ. ඒ උනාට මම උඹල දෙන්නව අපේ මිත්‍රයො වෙනුවෙන් පිළි ගන්නව'' ගාවින් රවි ගේ හා ශාන්තා ගේ දෑත් අල්වා ගනිමින් කීවේ ය.

''දැන් කිච්ච කිසි දෙයක් එපා මචං. උඹල ගෙ හිත හොඳයි නෙ. මට ඒ ඇති''

ශාන්තා සමහර විට දන්නෙ නැතිව ඇති. මේ ගෙදර ඉන්නෙ අම්මයි මායි විතරයි. අක්කට අසනීප වෙලා අම්ම පාදුක්කට ගිහින්''

''උඹේ ඔය කතාව නවත්තල මොනව හරි සංග්‍රහයක් පවත්වපංකො උපේ. මනමාල ජෝඩුවක් නේද බං'' රවී සිනාසුනේ ය.

''සත්තෙන් මට මතකැයි. දැන් ළමා සාරි හා ලුන්ජි ඇඳගත්තු අය සංග්‍රහයට එනව ඇති'' උපේන්ද්‍ර සිනා සෙමින් කිවේ ය.

මින්පෙන්, රෝහණ කැවිලි බත්දේසි අතැතිව සාලයට පිවිසෙනු රවී බලා සිටියේ ය.

''මුන් දෙන්නද සංග්‍රහයට දල තියෙන්නෙ. නෝ මනමාලයගෙ පැත්තෙ අයත් ඉඳ ගනිල්ලා'' රවී ගාමිනිට කතා කලේ ය.

සිසිල් බීම පානයෙන් පසු රවී නැගී සිටියේ ය.

''රවී, ශාන්තා එක්ක අර කාමරේට ගිහින් ටිකක් විවේක ගනින්. මම පොඩි ගමනක් දුවල එන්නම්'' උපේන්ද්‍ර කුලී රිය වෙත යමින් කීවේ ය.

''ඕක්කොම හරි..........''

රවී ශාන්තා සමගින් මැද සාලය අසල වූ ඔවුන් දෙදෙනා වෙනුවෙන් පිළියෙල කළ කාමරයට පිවිසි වහාම ශාන්තා ඔසවා ගත්තේ ය.

''දැන් ඉතින් මොනවද කියන්නෙ?''

''ඉස්සර කිව්ව දේවල්මයි'' ශාන්තා රවී ගේ ගෙල බදා සිනාසුනා ය.

''ඒ මොනවද?''

''ආදරෙයි, ආදරෙයි. මුළු ජීවිතෙන්ම ආදරෙයි''

ඔහු ඇගේ මුහුණ ළයට මැදිකර ගත්තේ ය. ඔවුනතර ඇති වූයේ දැඩි නිහඬ බවකි.

නිවස ඉදිරි පස රථයක් නතර කළ හඬ ශ්‍රවනය වූ නිසා රවි ශාන්තා ඇගෙහි තබා එළියට ගියේ ය. උපේන්ද්‍ර හා අනුරුද්ධ බඩු මලු ඔසවාගෙන එනු රවිට පෙනුණි.

''කොහොමද අනුරුද්ධ?''

''පලයං මිනිහො යන්න. උඹ මා එක්ක කතාවට එන්න එපා'' අනුරුද්ධ නිවස තුළට ගියේ ය. මඳ වේලාවක ට පසු ඔහු එළියට ආවේ ය.

''කතා කරපං උඹේ ගෑනිට'' අනුරුද්ධ සිනාසෙමින් කතා කළේ ය.

රවි කාමරයට ගොස් ශාන්තා කැඳවාගෙන ආවේ ය.

''මචං උඹෙයි, ශාන්තා ගෙයි ජීවිතේ සාර්ථක වෙච්චා කියල මම ප්‍රාර්ථනා කරනව'' ඔහු රවි ගේ හා ශාන්තා ගේ අත් අල්වා ගනිමින් කීවේ ය.

''ස්තූතියි'' ශාන්තා පහත් හඬින් කීවා ය.

''අපිට දෙන්න දෙයක් නැහැ රවි. අපේ පංතියෙ මිනිසුන් ගෙ තියෙන්නෙ හිත විතරයි''

''හිත කන්ඩද බං. අර පොයල දෙනවයි කිව්ව ගේ ගෙටම පොයල දීපං'' ශාවින් සාලයේ අසුන් ගනිමින් කීවේ ය.

''මොනවද මිනිහො ගෙට. වගේන් මේ දැන් වගේනෙ''

''අද නම් එන්න බැහැ. දෙන්නට අද විවේක ගන්න ඉඩ දෙමු''

''එහෙනම් හෝඩුවටමයි කියන්නෙ මම ගිහින් එන්නම්''

''උඹ ගිහින් හතියම් හෙම එන්න එපා. කල්පනාත් එක්කගෙන එන්න ඕනැ''

අනුරුද්ධ ගිය පසු ගාවින් හා උපේන්ද්‍ර යළි කුස්සියට යාමට සූදානම් වූහ.

''රවී උඹල ගිහින් රෙස්ට් ගනිල්ල. ශාන්තාට නානව නම් නාන්න කියපං. තව ටිකකින් වතුර නවත්වනව''

රවී ශාන්තා සමඟ කාමරයට ගියේ ය.

''පව් දෙයියනේ මුන් ටික හරියට වියදම් කරගෙන''

''අපි බඳින බව යාළුවන්ට කිව්වද?''

''කාටවත් කිව්වෙ නැහැ. ගාවිනුයි, උපේන්ද්‍රයි විතරයි දන්නෙ''

රවී කමිසය ගලවා පුටුව මත දැම්මේ ය.

''ඔයා නානවද?''

''බෑ රවී මම මූණ හෝද ගන්නම්'' ශාන්තා රවී අසල ළඟුන් ගත්තා ය.

''අද නාන්න හොඳ නැද්ද?''

''විලා..........'' ශාන්තා රවී ගේ කණ මිරිකුවා ය.

''මම මොනවද කිව්වෙ?''

''මම මොනව හරි කිව්ව කියල හිතා ගන්නව''

''හොඳයි හාමු''

''හේයි. මොකක්ද ඒ කතාව. මම හාමු නැති නිසා ද නේ ළමයො ඔයාට මාව අයිති වුනේ'' ශාන්තා රවී ඉදිරියේ දණ ගසා ඔහු ගේ අත සිප ගත්තා ය.

නාන කාමරයට වැදී මුහුණ සෝදගත් ශාන්තා කුස්සිය දෙසට ගියා ය. ගාවින් හිරමනය මතට වී පොල් ගානු දුටු ඇගේ මුවග සිනාවක් නැඟුනි. හාල් හෝදන මිත්‍ර අතින් සහල් අපතේ යනු ශාන්තා බලා සිටියේ කණගාටු වෙන් යුතුව ය.

''හොහ් මනමාලි ඇවිදින්'' ගාවින් සිනාසුනේ ය.

''බඩගිනිද ශාන්තා? ඉන්න තව පැයකින් කන්න දෙනව'' උපේන්ද්‍ර මස් සෝදමින් සිනාසුනේ ය.

''කෝ, මිත්‍ර නැගිටල යන්න''

''ශාන්තා ගෙට යන්න. ඔයා වැඩ කරන්න එපා'' ගාවින් කීවේ ය.

''තුන් දෙනාටමයි කියන්නෙ. කරුණාකරල එළියට යන්න. උපේන්ද්‍ර යාළුවො ටික එක්ක යන්න''

''ඒක හරි නැහැ'' මිත්‍ර කීවේ ය.

''විරෙන් බිං විරේන්'' ගාවින් වැඩ නවතා එළියට ආවේ ය.

ශාන්තා කාමරයට ගොස් ඇඳුම් මාරු කර ගෙන ආවා ය. මඳ වේලාවකට පසු මිතුරන් සාලයේ කතා කරමින් සිටිනු දුටු රවී ඔවුන් වෙත ගියේ ය.

''තෝ ශාන්තා?''

www.sinhalalibrary.com

''ඒකි අම්ම එලවගෙන කෑම උයනව''

''කමක් නැහැ වැඩ කළාවෙ''

''ඒ උනාට අද ඒ තරම් ඇඟ වෙහෙසන්න හොඳ නැහැ රවී'' ශාවින් සිනාසුණේ ය.

''ඒයි ශාවින් ශාන්තාම උයපුවාවෙ. අපි ඉව්වොත් මස් මාලු ටික නාස්ති වෙයි.'' උපේන්ද්‍ර සිනාසුණේ ය.

රවි මුළුතැන් ගෙට යන විට ශාන්තා කෑම පිසිමින් සිටියා ය. නිවසේදී ඇය නො වෙහෙසෙන බව රවි දනී. ඇය මුළුතැන් ගෙට වැදී වැඩ කරනු දකින විට වරෙක ඔහු සිත සතුටක් උපදියි. රවි පිඟන් රාක්කයේ තිබූ පිඟන් සෝදා තැබුවේ ය. කෑම පිස හමාර වන විට දිවා භෝජනයට පැමිණ සිටි රවි ගේ මිතුරන් ගේ සංඛ්‍යාව සිව් දෙනෙකි. ශාන්තා මුහුණ සෝදා සාලයට පැමිණියා ය. අනුරුද්ධ සිය පෙම්වතිය සමඟ නිවසට ගොඩ වදිනු දුටු රවි අසුනෙන් නැගී ඉදිරියට ගොස් ඔහු ගේ අත ගත්තේ ය. අනුරුද්ධ ගේ පෙම්වතිය ශාන්තා ගේ මුහුණ සිප ගත්තා ය.

''කල්පනා එන්න බැහැයි කිව්වෙ නැද්ද අනුරුද්ධ?''

''රවි ගෙ මංගල්ලෙ කිව්වම හරි සතුටෙන් ආව''

''ඉතින්''

''මට හරි සන්තෝසයි රවි''

''ඔය කතාව නවත්තල ඉන්න අයට කෑමට ආරාධනා කරපං රවි. මට බඩගිනියි'' ශාවින් කිවේ ය.

''හා රයිට් කෑමට වරෙල්ලා........''

''එහෙම නෙමේ රවි. චතුර විදුරුවක් දීල කෑමට එන්න ආරාධනා කරන්න ඕනැ'' ශාන්තා කිවා ය.

www.sinhalalibrary.com

''මොන පිස්සුද. වරෙල්ලා..........'' රවි සිනාසුනේ ය. එහෙත් කිසිවෙක් පැමිණියේ නැත. ගාවින්, උපේන්ද්‍ර, මිත්‍ර, අනුරුද්ධ ඉදිරිපස කාමරයට ගියහ. මඳ වේලාවකට පසු ගාවින් කතා කළේ ය.

''රවි පොඩි පණිවිඩයක් කියන්න තියෙනව මෙහාට ඇවිදින් පලයං''

රවි ශාන්තා දෙස බලා සිනාසුනා විනා එකවරම එහි ගියේ නැත.

''ඉතින් මා දිහා බලා ඉන්නෙ මොටද? මම දන්නව කාරණේ ගිහින් එන්න. හැබැයි වැඩිය එපා. මෙන්න මෙච්චරයි'' ඇය සුළඟිල්ලෙන් කුඩා ප්‍රමාණයක් දක්වමින් සිනාසුනා ය.

''මනමාලයෝ..........ගැනි බනිනව නම් එන්න එපා. අන්තිමට අපට දෙස් අහන්න වෙයි'' ගාවින් දොරෙන් එබී කම් කර කීවේ ය.

''මම අකමැති නැහැ එයා සතුටු නම්. හැබැයි අද විතරයි. ඕව පුරුද්දට තියාගන්න බෑ..........''

''මම ටිකක් ගිහින් එන්නම්'' රවි සිනාසුනේ ය.

''අනුරුද්ධ බොන්නෙ නැද්ද කල්පනා?''

''නොබොන මිනිහ. තව ටිකකින් බලන්න බැරියැ. හා අර ඉන්නෙ. මේ. මේ හලෝ පොඩ්ඩක් මෙහාට එන්න'' කල්පනා අනුරුද්ධට කතා කළා ය.

''ඇයි?'' ඔහු කට පිස දමමින් ආවේ ය.

''ඔන්න කලින්ම කිව්ව. බිව්වට කමක් නැහැ ගානට''

''ඔයා කියනව නම් මම කවදාවත් නො කිය ඉන්නම් කල්පනා''

''මෙයා හරි කට්ටයි ශාන්තා. ඔන්න අනූ වැඩිය හෙම බිව්වොත් මම ඔයා එක්ක යන්න එන්නෙ නෑ''

''ඒ බීල තිබුණොත්නෙ. මම පොඩ්ඩක් මෙහාට ගිහින් එන්නම්කො''

''පලයං කට්ටය'' කල්පනා අනුරුද්ධ ගේ පිටට පහරක් ගැසුවේ ය.

''අනේ ගොනා ගැනුන්ගෙනුත් ගුටි කනව'' ගාවින් කෑ ගැසුවේ ය.

''මේවල වාඩුව මම එක දවසක ගන්නම්කො''

''මොනවත් කිව්ව කියල හිතා ගනින්''

''මූන් ටික හරි චල් අනේ'' කල්පනා ශාන්තා සමඟින් කාමරයට වැදුනා ය.

ශාන්තා මඳ වේලාවක් කල්පනා හා කතා කරමින් සිටියා ය. ඉදිරිපස කාමරය දෙසින් මිතුරන් උස් හඬින් කතා කරනු ශාන්තාට ඇසුනි.

''කල්පනා අරගොල්ලන් ගෙ කට වැඩියි. අපි එළියට යමු ද?''

''ඔව් ශාන්තා පිය්සු නටන්න කලින් අපිත් යමු''

කාමරයෙන් පිටත පැමිණි ශාන්තා රවීට කතා කලේ ය.

''අපි රෙඩි'' සැවොම කාමරයෙන් පිටත පැමිණ කෑම මේසය වටා අසුන් ගත්හ. අනුරුද්ධ කල්පනා දෙස හොරැහින් බලා පිහාන අතට ගත්තේ ය.

www.sinhalalibrary.com

රවී ශාන්තා අසලින් අසුන් ගත්තේ ය.

''ඔක්කොම හොරු'' ශාන්තා සිනාසුනා ය.

''ඇත්තෙන් මේ මිනිසුන් සුරා පානයෙහි යෙදෙන්නේ ඇයි?'' අනුරුද්ධ ශාන්තාට කෑම බෙදමින් ප්‍රශ්න කළේ ය.

''තර්ක කළ යුතු වැදගත් ප්‍රශ්නයක්'' ගාමිණී රවීට බත් බෙදමින් කීවේ ය.

''ශරීර වර්ධනයට මද්‍යසාරය සෑහෙන ප්‍රමාණයක් අවශ්‍ය වෙනව'' ගාමිණී මිතුරාට සහාය වූහ.

''මධ්‍ය පානයට තියෙන්නෙ දීර්ඝ ඉතිහාසයක්. වෛදික ග්‍රන්ථවල සෝම පානය කියල කියන්නෙත් මේ සුරාවට''

''දැන් නමයි හොඳ හොඳ ව්‍යාකරණයි, ඉතිහාසෙයි මතක් වෙන්නෙ. ඉන්නවකෝ උපේන්ද්‍රට හොඳ වැඩක් කරන්න. අම්ම ආවදෙන්කෝ''

''දැක්කද මගෙ පෙම්වතිය සමාජය දෙස හෙළන ආකල්පය''

''මොනවද අනූ ඔයා මිරිකන්නේ. කනව නම් කන්නකෝ'' කල්පනා අනුරුද්ධට කතා කළේ අමනාපයෙනි.

ආහාර ගනිමින් ඔවුහු සතුටින් කතා කළහ.

දිවා ආහාරයෙන් සෑහෙන වෙලාවකට පසු මිතුරු මිතුරියන් නිවෙස් බලා ගියහ. රාත්‍රී අහර පිළියෙල කිරීම සඳහා උපේන්ද්‍ර අරක්කැමියෙක් කැඳවා තිබූ නිසා ශාන්තා ඇඳේ ඇලවී සිටියා ය. පෙර දින පහන් වන තෙක් නිදි

වරව සිටි නිසා මඳ වේලාවකට පසු ඇය වෙත නින්ද ලඟා වුනි. ශාන්තා පිබිදුනේ බොහෝ වේලාවක් ගත වූ පසුව ය. කාමරය මුළුමනින්ම අඳුරෙන් පිරී ඇත. තමා සිටින්නේ කොහේදැයි ඇයට සිතා ගැනීමට අසීරු වුනි. සැහෙන සංඛ්‍යාවක් නිවසේ කතා බස් කරනු ඇසුනද එම හඬවල් අඳුනා ගැනීම ඇයට අසීරු කරුණකි. තමා සිටින්නේ කොහේද? ඇගේ මතකය අළුත් වූයේ රවි ගේ කට හඬ ශ්‍රවනය වූ පසුව ය. තමා මේ සිටින්නේ රවි සමඟින් නො වේ දැයි සිතෙන විට ශාන්තා ගේ සිතේ බලවත් ප්‍රීතියක් ඇති වෙයි. ගත වූ අතීතයේ සිදු වූ ලොකු කුඩා හැම සිදුවීමක්ම එකිනෙක ඇගේ මතකයට ගලා ආවේ ය. කිසි විටක මනසින් බැහැර කළ නො හැකි මේ හැම සිදුවීමක්ම ඇගේ සිතෙහි ඇති කළේ දැඩි දුකකි. කුඩා කළ සිට අපරිමිත සෙනෙහසකින් තමා ඇති දැඩි කළ, හැම මොහොතකම තම දියුණුව අපේක්ෂා කළ දෙමාපියන්ට තමා අකෘතඥ වී යැයි වරෙක ඇයට සිතෙයි. සෙමින් සෙමින් ඇගේ දෙනෙත් කඳුලෙන් තෙත් වෙයි. 'මම රවි එක්ක ආවෙ නැත්නම් කවදාවත් මට සතුටෙන් ජීවත් වෙන්න බැහැ අම්මෙ. මම එයාව අමතක කළා නම් බින්දු එක්ක යන්න වෙනව. මට ඒ දේ සිහි කරන්නවත් බැ' දෙමාපියන් සිහි වූ පසු යළිත් ඇයට ඇඩුම ආවේ ය 'මට සමා වෙන්න අම්මේ. මම මේ ගමන ආවෙ..........' ඇය කොට්ටයේ මුහුණ හොවා ගත්තේ තම හඬ කාමරයෙන් පිටත ඇසේවි යන බියෙනි. මඳ වේලාවකට පසු රවි කාමරයට පැමිණ විදුලි පහන දල්වනු ඇයට පෙනුනි.

''දැන් ඉතින් නැගිටින්න'' ඔහු මෘදු ලෙස කතා කර සෙමින් ශාන්තා ගේ ගෙල සිප ගත්තේ ය. එහෙත් ඇය හිස එසෙව්වේ නැත. රවි සෙමින් ඇගේ හිස ඔසවා මුහුණ දෙස බැලුවේ ය.

''මුකුත් නැහැ'' ඇය කඳුළු පිස දමමින් වියළි සිනාවක් මුහුණේ නගා ගත්තේ ය. දුකින් අඳුරු වූ ශාන්තා ගේ මුහුණ දකින විට ඔහු සිත තුළ විශාල වේදනාවක් ඇති වෙයි.

''ඔයා මා එක්ක තරහද ශාන්තා''

''ඇයි මම ඔයා එක්ක තරහ වෙන්නෙ?''

''මම කළේ වරදක් ඒත්..........''

''අපි තේරුමක් නැති කතා නතර කරමු රවි. මට ඇඬුනෙ ගෙදර අය සිහි වෙලයි. මම මේ ගමන ආවෙ ඔයාට ආදරේ හින්දනෙ. වරදක් උනා නම් මට සමා වෙන්න''

''දැන් ඉතින් නැගිටල ලෑස්ති වෙන්න. මගෙ යාලුවො ඔයා බලන්න ඇවිදින්''

''මොනව!''

''නැගිටල එන්නකො''

''ම්හු'' ශාන්තා ඇඳේ අනෙක් පසට හැරුණා ය.

''එහෙමද? හොඳයි මම ලෑස්ති කරන්නම්'' රවි ශාන්තා ඔසවා ගත්තා ය. ශාවින් රවි අමතමින් දෙරට තට්ටු කෙළේ ය.

''වරෙන් ඇතුළට'' රවි ශාන්තා බිම නො තබාම කතා කළේ ය.

''උඹල කාමරේට රිංගගෙන ආ...........'' ගාවින් කතා කරමින්ම කාමරයට පැමිණ, රවි ශාන්තා ඔසවා සිටිනු දුක එකවරම නැවතුනි.

''සමාවෙන්න'' ගාවින් ආපසු හැරී යන්ට සූදනම් වුනි.

''ගාවින් ඔහොම හිටපං. මගෙ අම්මෙ මේකි ගෙ බර''

''මේ වගෙ භයානක වෙලාවල කාමරවලට එන්න හොඳත් නැහැ. ඉන්න හොඳත් නැහැ''

''හරි වැඩෙනෙ උනේ. වඩාගෙන ඉන්න කියනව. අතින් බහින්නෙම නැහැ''

''බොරු ගාවින් මෙයා ගෙ තියෙන නැට්ල්ල. මට බිමට බහින්න දෙන්නෙ නැහැ නෙ''

''දෙන්නගෙන් කව්රු හරිද කියන්න මම දන්නෙ නැහැ. තව පැය දෙකක් ඉවසපල්ල. ළර යාලුවො ඇවිදින්''

''මෙයා මට කාමරයෙන් එන්න දෙන්නෙ නැහැ ගාවින්'' ශාන්තා රවි ගේ අතින් බිමට බසිමින් කීවා ය.

''මේකි ගෙ බොරු බං''

ගාවින් ගිය නොබෝ වේලාවකින් ශාන්තා මනාව සැරසී රවි සමඟින් එළියට පැමිණියා ය. රවි විවාහ වූ බව දුන සිටියේ ගාවින් හා උපේන්ද්‍ර පමණි. ඔහු ළඟින් ම ඇසුරු කළ මිතුරන් තිප දෙනෙක්ම පැමිණ සිටිනු දකිමෙන් රවි ගේ සිතේ ඇති වූයේ බලවත් සතුටකි. ශාන්තා ගේ මුහුණේ අඩුරක සේයාවක් වත් නැත. ශන් පානයෙන් පසු මිතුරන් ගී ගයන්ට වූහ. සංගීත භාණ්ඩ නො තිබුනත්

දෙරට, බෙලෙක්ක වලට තට්ටු කරමින් ඔවුන් ගැයූ ගී වලින් ඇය සතුටු වූවා ය. එම සැඳෑ සමය ගෙවී ගියේ ඇගේ හදවතට සතුට සමීප කරවමිනි. මිතුරන් ගිය පසු රාත්‍රී ආහාරයට සිටියේ ගාවින් හා මිත්‍රා පමණි. රවි ගේ ආරාධනය අනුව ගාවින් හා මිත්‍රා පමණක් නිවසේ රැඳුනි.

රවි ශාන්තා සමඟ කාමරයට පිවිසි සැහෙන වේලාවකට පසු අවට පරිසරයේ පැතිරුනේ විශාල නිහඬ බවකි. නිහඬ රැයෙහි වරින් වර ගාවින් ගේ ගොරෝප්පු සිනා හඬ රවිට ඇසෙයි. ඔවුන් නිහඬ වූ මඳ වේලාවකට පසු රවි අසුනෙන් නැගිට ශාන්තා අසුන් ගෙන සිටි තැනට ගියේ ය.

අඩක් විවර වූ කවුළුවෙන් කාමරයට සිසිල් සුළං රැලි නෙරපෙයි. අහසේ නැගී සිට නව සඳ රැස් යකඩ ග්‍රීලය තුළින් කාමරයට පිවිසෙයි. ඔහු ඇගේ අත ගෙන කවුළුව අසලට ගොස් සිට ගත්තේ ය. ඔවුනතර ඇති වූයේ පැහැදිළි නිහඬ බවකි. ශාන්තා ආශ්වාස ප්‍රාශ්වාස කරන හඬ පවා ඔහුට ඇසෙයි.

ශාන්තාට දක් වූ සෙනෙහස මෙ වැනි අනපේක්ෂිත විලාගයකින් විසදේවි යයි රවි කිසි දිනෙක සිතුවේ නැත. සිය සෙනෙහය පිළිබඳ වූ කතාව අද්භූත ජනක ලෙස අවසන් වේ යයි ශාන්තා ද සිතන්ට නැත.

රවි ඇගේ පසු පසින් සිට ඇගේ දෙවුරෙන් අල්වා ගත්තේ ය. ඔවුනතර නිහඬ බවක් ඇති වුනි. කොතරම් කරදර බාධක තිබුණත් ජීවිතයේදී සමීප විය යුතු එක්තරා කෙළවරක් ඇත. එහෙත් එම අවස්ථාව මෙන ළඟා විය හැක්කේ කීයෙන් කී දෙනාටද. මෙම සමාජ ව්‍යූහය තුළ අපේක්ෂා භංගත්වයට පැමිණි අසරණ වූ ජීවිත කොත

රම ඇද්ද? ඉදිරි අනාගතය කොතරම් අපහැදිළි වුවත් ශාන්තා සිය සහකාරිය වීම නිසා ඔහු සිත තුළ ඇති වන්නේ විශාල සතුටකි. රවි එක වරම ඇගේ මුහුණ තමා දෙසට හරවා ගත්තේ ය. ඇගේ පැහැදිලි දෙනෙත් කඳු ලෙන් අසරණ වී ඇත.

''අඬන්න එපා.........ශාන්තා. ඔයා අද වගෙ දවසකත් මෙහෙම දුකෙන් හිටියම මම ඒ දේ ඉවසන්නෙ කොහොමද?''

''මම අඬන්නෙ දුකට නෙමෙ රවි. මට අම්මයි තාත්තයි මතක් වෙන කොට ඉන්න බැහැ'' ඇය පහත් හඬින් කීවා ය.

''මට ඔයා ගෙ අම්මයි තාත්තයි මතක් වෙන කොට පුදුම හිතෙනව. මට තවම තේරුම් ගන්න බැහැ ඩැඩී එක දවසකින් අපි දෙන්නට බඳින්න ඉඩ දුන්නෙ ඇයි කියල''

ශාන්තා නිහඬව සිටියා ය.

''ඔයාව බන්දල දෙනව කිව්වම මම කැමති උන එක ඇත්ත. ඒත් ඇයි ඒ වගෙ තීරණයක් ගත්තෙ?'' රවි යළි කතා කළේ ය.

''මම හිතන්නෙ මම්මියි ඩැඩියි මා ගැන වැරදි අව බෝධයක් ඇති කරගෙන''

''ඒ මොකක්ද?''

''ඊයෙ උදේ ඔයා ආපු වෙලේ මම් මගෙ කාමරේට ඇවිදින් ඔයාව අනහරින්න කියල මට බල කළා''

www.sinhalalibrary.com

''ඉතින්''

''ඒ සැරේ මම කිව්ව රවි අතහරින්න බැහැයි කියල''

''මමී මොකද කිව්වෙ?''

''ඒ සැරේ මමී ඇහුව ඒ ඇයි කියල''

''මම කිව්ව රවි අතහරින්න බැරි හේතු තියෙනව කියල''

''ඉතින්. ඉතින්''

''මමී තව මොකද්ද මගෙන් ඇහුව. මම අඬ අඬා හිටපු හින්ද මමී අහපු එක මට හරියට ඇහුනෙ නැහැ. මම ඒකටත් ඔව් කිව්ව වගෙයි මට මතක. ඊට පස්සෙ ඔයා ගැන විස්තර කරන්න හදන කොට මමී පේන්න හිටියෙ නැහැ. ගේට් වෙලා කෑ ගහල අඬනව මට ඇහුනා''

''මමී ඔයාගෙන් ඇහුවෙ මේ ටික විතරද?''

''ඔව්. ඊට පස්සෙ ගෙදර ඔක්කොම මා දිහා අයුතු විදිහට බලන්න පටන් ගත්ත. ගෙදර ඔක්කොම හිතල තියෙන්නෙ මම ඔයා හින්ද විනාස උනා කියලයි''

ශාන්තාගේ කතාව ඇසූ රවි මහ හඬින් සිනාසෙන්ට පටන් ගත්තේ ය.

''ඔයාට නම් හිනාහ'' ශාන්තා සිනාසෙමින් කීවා ය.

''ඉතින් මෝඩියෙ මමීට නො තේරුන වචනෙ නිසා අපි අද කොච්චර සන්තෝසෙකින් ඉන්නවද?''

''මම ඔයා නිසා විනාස වුනා කියල හිතපු හින්දයි ඔයාට මාව බන්දල දුන්නෙ. මා නිසා අම්මිල කොච්චර වේදනා විඳිනව ඇද්ද?''

www.sinhalaelibrary.com

''ගැනු ළමයෙක් හදල අම්මල තාත්තල මේ වගෙ වචනයක් අහන්න කැමති නැහැ නමා''

''කවද හරි මම මේක අම්මට කියල පහදල දෙනව''

''ඕක කියන්න ඔයාට ගෙදර යන්න ලැබෙන්නෙ නැහැ''

''මට ගෙදර යන්න ඕනැ නැහැ රවි. ඒ උනත් මම අම්මට ලියුමක් හරි දානව''

යළි ඔවුනතර නිහඬ බවක් ඇති වූහි. පරිසරය ද අතිශයින් නිහඬ ය.

රවි ශාන්තා ගේ දෑතින් අල්වා ගත්තේ ය.

''වඩා ගන්නද?''

''හුම්'' රවි පහත් හඬින් කීවේ ය.

''රවි ඔයාට මාව කරදරයක් කියල හිතෙනවද?''

''ඔන්න ඉතින් මාව කේන්ති කරන්න හදනව''

''දැන් ඉතින් ඉස්සර වාගෙ නැටිලි බැහැ තේරුනා නෙ. එහෙම උනොත් කණ මිරිකනව''

''මා එක්ක නටන්න ආවොත් මෙන්න මෙහෙම උස්සල ඇනට වීසි කරනව''

''හා පුළුවන් නම් වීසි කරන්න''

''හොඳා බැහැයි කියලද කියන්නෙ?''

''බෑ නමා''

''ඔන්න බලා ගන්නව''

රවි ශාන්තාව ඇඳට දැම්මේ ය. ශාන්තා ඇඳට වැටුන සැණින් මහ හඬ නංවමින් ඇඳ යටින් විත්

www.sinhalaelibrary.com

බෙලෙක්ක වැටෙන්ට පටන් ගත්තේ ය. කුඩා පියර බෙලෙක්ක කීපයක් සිහින් හඬ නංවමින් කාමරයේ ඒ මේ අත කැරකී නැවතුනි. රවි සිනාව නවතා ගත්තේ කොට්ට යට මුහුණ හඳු කර ගනිමිනි.

''මොනවද ඇඳ යටින් වැවුනෙ?''

''අරුන් ටික ඇඳේ බෙලෙක්ක එල්ලල'' රවි පහත් හඬින් කීවේ සිනාව පාලනය කරගනිමිනි.

ශාන්තාට එම සරදම වැටහුනේ මඳ වෙලාවකට පසුව ය.

''සද්දෙ ඇහුනද දන්නෙ නැහැ'' ඇය කතා කළේ පහත් හඬිනි.

යළි පරිසරයේ නිහඬ බවක් ඇති වූන සැණින් ගාවින් ගේ ගොරෝසු සිනාවට උපේන්ද්‍ර හා මිත්‍ර එක්වනු ඔහුට ඇසුනි. රවි සිනාසෙමින් ශාන්තා ගේ උණුසුමට වැදුනි.

(නිමි)

www.sinhalaelibrary.com